2012 වර්ෂයේදී ස්ථිර සේවය සඳහා බඳවා ගැනීම් සිදු කර නොමැත

01.02. බඳවා ගැනීම් (අනියම්)

| අනු අංකය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සහකාර තරුණ සේවා නිලධාරී | 66 |
| 02 | කළමනාකරණ සහකාර | 01 |
| 03 | කාර්යාල කාර්යය සහායක | 04 |
| 04 | රියදුරු | 08 |

01.03. සේවය ස්ථිර කිරීම
2012 වර්ෂය තුළ අනියම් සේවකයින් ස්ථිර කිරීම පිළිබඳ තොරතුරු

| අනු අංකය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උපදේශක | 04 |
| 02 | යතුරු ලේඛක ලිපිකරු | 04 |
| 03 | ගිණුම් ලිපිකරු | 02 |
| 04 | ආරක්ෂකයින් | 02 |
| 05 | නිවාස පාලිකා | 01 |
| 06 | සහය ශිල්පී | 01 |

01.04. උසස් වීම
2012 වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවේ උසස්වීම් ලබාදී ඇති නිලධාරීන්ගේ විස්තර පහත සඳහන් වේ

| අනු අංකය | තනතුර | උසස් කළ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සහකාර අධ්‍යක්ෂ | 02 |
| 02 | තරුණ සේවා නිළධාරී ( *I*ශ්‍රේණිය) | 155 |
| 03 | තරුණ සේවා නිළධාරී ( *II* ශ්‍රේණිය) | 21 |
| 04 | කළමණාකරණ සහකාර | 23 |

01.05. කොන්ත්‍රාත් පදනම මත බඳවාගත්

| අනු අංකය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 |
| 02 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 03 | නිකේතනාධිපති | 01 |
| 04 | කාර්මික ශිල්පී | 01 |
| 05 | තරුණ සේවා නිළධාරී | 02 |

SRI LANKA Youth

## 01.06. විශ්‍රාම ගැන්වීම

2012 වර්ෂය තුළදී විශ්‍රාම ගන්වන ලද සේවකයින් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | තනතුර | සේවා දිගුව ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සහකාර අධ්‍යක්ෂ | 02 |
| 02 | දිස්ත්‍රික් තරුණ සේවා නිළධාරී | 01 |
| 03 | තරුණ සේවා නිළධාරී | 01 |
| 04 | උපදේශක | 03 |
| 05 | ගබඩා භාරකරු | 01 |
| 06 | පොත් තබන්නා | 02 |
| 07 | යතුරු ලේඛක ලිපිකරු | 11 |
| 08 | අරක්කැමි | 01 |
| 09 | කම්කරු | 01 |
| 10 | මුරකරු | 01 |
| 11 | සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 01 |

## 01.07. සේවයෙන් ඉල්ලා අස්වීම්

2012 වර්ෂයේදී විවිධ හේතූන් මත සභාවේ සේවයෙන් ඉල්ලා අස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ

| අනු අංකය | තනතුර | සේවයෙන් ඉල්ලා අස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කළමණාකරු | 01 |
| 02 | තරුණ සේවා නිළධාරී | 08 |
| 03 | විශේෂ උපදේශක | 01 |
| 04 | පොත් තබන්නා | 01 |
| 05 | යතුරු ලේඛක ලිපිකරු | 08 |
| 06 | රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| 07 | කම්කරු | 01 |

## 01.08. ධූරය අතහැර යාම

විවිධ හේතූන්මත 2012 වර්ෂයේදී ධූරය හැර යාම් පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | ධූරය හැරගිය සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 02 | තරුණ සේවා නිළධාරී | 01 |
| 03 | යතුරු ලේඛක ලිපිකරු | 02 |
| 04 | කම්කරු | 02 |

**01.09. නැවත සේවයේ පිහිටුවීම**
විවිධ හේතූන්මත පහත සඳහන් අය 2012 වර්ෂයේදී සභාවේ නැවත සේවයේ පිහිටුවා ඇත

| අනු අංකය | තනතුර | නැවත සේවයේ පිහිටවූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පළාත් අධ්‍යක්ෂ | 01 |

**01.10. සේවය අවසන් කිරීම**
විවිධ හේතූන්මත පහත සඳහන් අය 2012 වර්ෂයේදී සභාවේ නැවත සේවයේ පිහිටුවා ඇති

| අනු අංකය | තනතුර | නැවත සේවයේ පිහිටවූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | යතුරු ලේඛණ ලිපිකරු | 03 |
| 02 | සහය ශිල්පී (අනියම්) | 01 |

**01.11. කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය**
20120811 හා 12 යන දිනවල කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වින. ඉන් 225ක් සමත්වූ අතර 10ක් අසමත් විය. මෙම විභාගයට සහකාර අධ්‍යක්ෂ, දි.ත.සේ.නි. ,ත.සේ.නි හා යතුරු ලේඛක ලිපිකරුවන් පෙනී සිටින ලදී..

**01.12. දුරකතන පහසුකම්**
2012 වර්ෂයේ සභාවට සෘජු දුරකථන ලබා දී නොමැත.

**01.11. ණය අත්තිකාරම්**
සභාවේ සියලුම සේවකයින්ට ආපදා ණය ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා ආපදා ණය *276* දෙනෙකුට ලබාදී ඇත. එසේ ආපදා ණය ලෙස නිකුත් කර ඇති මුදල රු *37,139,235.00*කි

**01.12. කම්කරු විනිශ්වය සභා සහ වෙනත් අධිකරණමය නඩු විභාග**
සභාව විසින් ගන්නා ලද විනය නියෝගයන්ට විරුද්ධව සේවකයින් විසින් අධිකරණයේ හා කම්කරු විනිශ්වය සභාවේ පවරා ඇති නඩු 2012 වර්ෂයේදී විභාගයට ගන්නා ලදි. ඊට අදාළ විස්තර පහත දක්වා ඇත.

| අනු අංකය | අධිකරණ ස්වභාවය | තනතුර හෝ වෙනත් | පවරා ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අභියාචනාධිකරණය (කොළඹ) | ත.සේ.නි I | 01 |
| | | විශේෂ උපදේශක | 01 |
| 02 | ශ්‍රේෂ්ඨාධිකරණය (කොළඹ) | ලිපිකරු II | 01 |
| 03 | දිසා අධිකරණය (ගංගොඩවිල) | සහකාර ගණකාධිකාරී | 01 |
| | | අභ්‍යාසලාභී | 03 |
| | | තරුණ සේවා නිළධාරී | 01 |
| 04 | දිසා අධිකරණය (මාතලේ) | කාර්මික (සී/ස තරුණ සේවා සමාගම) | 01 |
| 05 | දිසා අධිකරණය (ගම්පහ) | (ඉඩම් නඩුවකි) | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 06 | දිසා අධිකරණය (ගල්කිස්ස) | අභ්‍යාසලාභී | 02 |
| | | ඇපකරු | 01 |
| 07 | දිසා අධිකරණය (මහනුවර) | ලිපිකරු III | 01 |
| 08 | දිසා අධිකරණය (මාවනැල්ල) | (ඉඩම් නඩුවකි) | 01 |
| 09 | සිවිල් අභියාචනාධිකරණය (මහනුවර) | දි.ත.සේ.නි | 01 |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| 10 | මහේස්ත්‍රාත් අධිකරණය (අනුරාධපුර) | අනියම් කම්කරු | 01 |
| | | (ඉඩම් නඩුවකි) | 01 |
| 11 | මහේස්ත්‍රාත් අධිකරණය (තෙල්දෙණිය) | (ඉඩම් නඩුවකි) | 01 |
| 12 | මහේස්ත්‍රාත් අධිකරණය (ගාල්ල) | කළමනාකරණ සහකාර (තාක්ෂණ) | 01 |
| 13 | කම්කරු විනිශ්වය සභාව (මහනුවර) | දි.ත.සේ.නි | 01 |
| | | පොත් තබන්නා II | 01 |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| 14 | කම්කරු විනිශ්වය සභාව (කෑගල්ල) | දි.ත.සේ.නි | 01 |
| | | ත.සේ.නි I | 01 |
| | | ගිණුම් ලිපිකරු | 01 |
| 15 | කම්කරු විනිශ්වය සභාව (ඇඹිලපිටිය) | ය.ලේ.ලි III | 01 |
| 16 | කම්කරු විනිශ්වය සභාව (මහරගම) | ලිපිකරු III | 01 |
| | | ගිණුම් ලිපිකරු | 01 |
| | | මුදල් අයකැමි | 01 |
| | | පොත් තබන්නා | 01 |
| | | ය.ලේ.ලි | 01 |
| | | මැණික් කැපීමේ පරිපාලක | 01 |

**01.13. අර්ථසාධක අරමුදල හා සේවා නියුක්ති භාර අරමුදල :**
2012 වර්ෂයේ වයස අවුරුදු 57 සම්පූර්ණව විශ්‍රාම ගන්වන ලද කාර්ය මණ්ඩලය හා ඉල්ලා අස්වී ඇති හා විශ්‍රාම වැටුප් සහිත රැකියා සඳහා ගොස් ඇති කාර්ය මණ්ඩලය සඳහා සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තීන්ගේ භාර අරමුදල් දායකත්වය ලබා දීම සඳහා කටයුතු කර ඇත.

**01.14. ඉඩම් පවරා ගැනීම**
නීත්‍යානුකූලව පවරා නොගත් සභාවේ ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට අදාල ලිපි ලේඛණ සකස් කර බලධාරීන් වෙත යවා ඇති අතර, ඒ සම්බන්ධව කටයුතු සිදු කෙරෙමින් පවතී

## 02. සැපයීම් අංශය

**වැය කළ මුදල : රු. 7,525,514.84**
2012 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලයට ලිපිද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව, ලී බඩු සහ කාර්යාල උපකරණ අලුත්වැඩියාව, ප්‍රචාරක හා දැන්වීම් වෙනත් වියදම් හා මුද්‍රණ වියදම් ඇතුළුව පුනරාවර්ථන වියදම් ද ලී බඩු, කාර්යාල උපකරණ, වාහන, යන්ත්‍ර සූත්‍ර, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, ගොඩනැගිලි ඉදි කිරීම්, පුස්තකාල පොත්, වට්ටෝරු භාණ්ඩ ඇතුළුව ප්‍රාග්ධන වියදම් යටතේද අවශ්‍යතාවයන් මත සැපයීම් කර ඇත

| අනු අංකය | වැය විෂය | 2012 වර්ෂයේ වැය දැරීම් |
|---|---|---|
| 01 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2,430,896.96 |
| 02 | වෙනත් සැපයීම් | 741,046.20 |
| 03 | යන්ත්‍ර සූත්‍ර අලුත් වැඩියාව | 391,363.10 |
| 04 | ලී බඩු හා කාර්යාල උපකරණ | 11,986,445.38 |
| 05 | මුද්‍රණ වියදම් | 1,281.118.00 |
| 06 | විදුලි උපකරණ | 6,063,097.55 |
| 07 | ට්‍රැක්ටර් | 1,990,554.20 |
| 08 | යන්ත්‍රෝපකරණ | 3,213,514.64 |
| 09 | ලී බඩු හා කාර්යාල උපකරණ අලුත් වැඩියාව | 570,586.74 |
| 10 | වට්ටෝරු | 3,234,699.32 |
| | එකතුව | 30,622,204.09 |

## 03. ප්‍රවාහන අංශය

**වැය කළ මුදල : රු. 27,067,142.42**
ජාතික තරුණ සේවා සභාව විසින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් සහ පලාත්, දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන විවිධ තරුණ සංවර්ධන වැඩසටහන් හා පරිපාලනමය කටයුතු වෙනුවෙන් වාහන අනුයුක්ත කිරීම සහ වාහන අලුත්වැඩියාව ඇතුළු වාහන නඩත්තු කටයුතු ද මෙම අංශය මගින් සිදුකෙරේ

| අනු අංකය | වැය විෂය | 2012 වර්ෂයේ වැය දැරීම් |
|---|---|---|
| 01 | ඉන්ධන | 7,244,409.97 |
| 02 | වාහන අලුත් වැඩියාව | 8,665,800.59 |
| 03 | ටයර් / ටියුබ් | 1,150,954.40 |
| 04 | වාහන සේවා | 2,876,898.50 |
| 05 | වාහන රක්ෂණ | 5,317,688.58 |
| 06 | ප්‍රවාහන කුලී | 40,000.00 |
| 07 | ඩීසල් වාහන බද්ද | 1,040,000.00 |
| 08 | විවිධ වියදම් | 33,764.00 |
| | එකතුව | 26,369,516.04 |

## 04. ලේකම් අංශය

**වැය කළ මුදල : රු. 867,694.00**
ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, අංශභාර මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව පැවැත්වීම සහ සභා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අදාළ අධ්‍යක්ෂවරුන් වෙත බෙදාහැරීම මෙම අංශය මගින් සිදුකෙරේ. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත

| අනු අංකය | වැය විෂය | 2012 වර්ෂයේ වැය දැරීම් |
|---|---|---|
| 01 | සභා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 910,900.00 |
| 02 | මුද්‍රණ වියදම් | 9,600.00 |
| 03 | සභා අධ්‍යක්ෂ මණ්ඩල සංග්‍රහ | 72,721.60 |

## 05. අභ්‍යන්තර විගණන අංශය

ජාතික තරුණ සේවා සභාවට අදාළව විගණකාධිපති විසින් අනුමත කර ඇති විගණන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සභාපතිතුමාගේ උපදෙස් මත කෙරෙන විමර්ශන හා වෙනත් විශේෂ රාජකාරි ඉටු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව, මෙම වර්ෂය තුළ විගණන හා විමර්ශන වාර්තා *59* ක් මෙම අංශය මගින් ඉහළ කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කර ඇත

මීට අමතරව විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සම්බන්ධව සභාපතිතුමාගේ උපදෙස් පරිදි කරුණු විමසා විගණකාධිපති වෙත පිළිතුරු සැපයීමේ කාර්යභාරය සම්පූර්ණයෙන්ම ඉටු කරනු ලබන්නේද මෙම අංශය මගිනි

ඉහත රාජකාරි කටයුතුවලට අමතරව විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ ද මෙම අංශය මගින් වේ. 2012 වර්ෂයේ කමිටු රැස්වීම් 08 ක් පවත්වා ඇත

## 06. නීති විමර්ශන අංශය

ජාතික තරුණ සේවා සභාවට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ, මහාධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ, දිස්ත්‍රික් අධිකරණ, කම්කරු විනිශ්චය සභා, නඩු හා මානව හිමිකම් පැමිණිලි ආදියේ අදාළ කටයුතු මෙම අංශය මගින් සිදුකර ඇති අතර, 2012 වර්ෂය තුළ දී නඩු 35 ක් පිළිබඳව අවශ්‍ය කටයුතු සඳහා පියවර ගෙන ඇති අතර මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි 09ක් ඉදිරිපත් කර ඇත

## 07. ඉදිකිරීම් හා නඩත්තු අංශය

**වැය කළ මුදල: රු. 12,662,300.84**

2012 වර්ෂය තුළ ඉදිකිරීම් හා නඩත්තු අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත දැක්වේ

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන/ ක්‍රියාකාරම් | 2012 වසර සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | වැය කරන ලද මුදල රු. මිලියන |
|---|---|---|---|
| 01 | මහරගම තරුණ මධ්‍යස්ථානයේ දොර, ජනේල නවීකරණය | 22.83 | 12.96 |
| 02 | මහරගම තරුණ මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය නවීකරණය | 14.34 | 14.47 |
| 03 | හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ ක්‍රීඩා පිටි ඉදිකිරීම | 15.43 | 8.41 |
| 04 | හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය නවීකරණය | 45.97 | 35.19 |
| 05 | ගම්පහ දිස්ත්‍රික් කාර්යාල දෙවන අදියර | 6.37 | 11.19 |
| 06 | කිලිනොච්චි තරුණ මධ්‍යස්ථානය නවීකරණය | 6.37 | 3.54 |
| 07 | එරම්නියාය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය | 25.05 | 24.35 |
| 08 | අනුරාධපුර යොවුන් නිකේතනය නවීකරණය (P-1) | 6.10 | 4.97 |
| 09 | අනුරාධපුර යොවුන් නිකේතනය නවීකරණය (P-2) | 6.10 | 1.33 |
| 10 | අනුරාධපුර යොවුන් නිකේතනය නවීකරණය (P-3) | 6.10 | 0.54 |
| 11 | අනුරාධපුර යොවුන් නිකේතනය නවීකරණය (P-4) | 9.00 | 4.29 |
| 12 | ප්‍රධාන නේවාසිකාගාර නවීකරණය - බටංගල | 9.68 | 9.68 |
| 13 | ගැහැණු නේවාසිකාගාරය නවීකරණය - බටංගල | 2.02 | 2.02 |
| 14 | ගැහැණු නේවාසිකාගාරය වැසිකිළි පද්ධති ඉදිකිරීම - බටංගල | 1.70 | 1.70 |
| 15 | "C" නේවාසිකාගාරය නවීකරණය - බටංගල | 2.17 | 2.17 |
| 16 | "C" නේවාසිකාගාරය වැසිකිළි පද්ධති ඉදිකිරීම - බටංගල | 1.86 | 1.86 |

## 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබූ ස්වේච්ඡා වැඩසටහන්හි ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | ප්‍රජා සංවර්ධන සේවා | | සමාජ සංවර්ධන සේවා | | පරිසරය සුරැකීම | | සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා | | ක්‍රීඩා හා විනෝදාංශ | | අධ්‍යාපනය | | රැකියා පිළිබඳ තොරතුරු ලබා දීම | | වෙනත් | | මුළු වැඩසටහන් ගණන | මුළු තරුණ සහභාගීත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | | |
| නාගරික තරුණයා | 15 | 1602 | 15 | 2091 | - | - | 9 | 732 | 18 | 6620 | - | - | 1 | 100 | 3 | 375 | 61 | 11520 |
| කොළඹ | 27 | 1794 | 28 | 5056 | 10 | 774 | 03 | 205 | 25 | 2234 | 15 | 2556 | 08 | 398 | 36 | 4435 | 154 | 17392 |
| කළුතර | 27 | 680 | 47 | 1510 | 11 | 460 | 7 | 245 | 30 | 980 | 9 | 410 | 3 | 620 | 37 | 975 | 168 | 5940 |
| ගම්පහ | 155 | 21247 | 81 | 12765 | 12 | 942 | 12 | 1096 | 54 | 15321 | 24 | 3608 | - | - | 27 | 2635 | 365 | 57614 |
| ගාල්ල | 132 | 1900 | 102 | 1840 | 62 | 1243 | 49 | 1400 | 60 | 1450 | 20 | 1100 | 32 | 1300 | 57 | 1900 | 514 | 12133 |
| මාතර | 257 | 34406 | 71 | 16466 | 13 | 5871 | 21 | 7485 | 54 | 11883 | 36 | 13386 | 07 | 612 | 12 | 3980 | 471 | 94089 |
| හම්බන්තොට | 22 | 1090 | 23 | 3748 | 03 | 205 | 09 | 1544 | 20 | 6455 | 18 | 1022 | - | - | - | - | 95 | 14064 |
| මහනුවර | 03 | 78 | - | - | 04 | 45 | 05 | 106 | 29 | 1579 | 07 | 887 | 06 | - | 25 | 8847 | 79 | 11542 |
| මාතලේ | 08 | 1295 | 12 | 1530 | 01 | 40 | 03 | 135 | 11 | 2179 | 02 | 142 | 09 | 675 | 07 | 1875 | 53 | 7871 |
| නුවරඑළිය | 08 | 1536 | 12 | 2221 | 14 | 1275 | 18 | 3725 | 22 | 42152 | 08 | 396 | 02 | 45 | 45 | 34068 | 129 | 85418 |
| රත්නපුරය | 63 | - | 51 | - | 20 | - | 22 | - | 33 | - | 15 | - | 13 | - | 28 | - | 1632 | 24662 |

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෑගල්ල | 19 | 1224 | 23 | 1759 | 05 | 385 | 18 | 1135 | 27 | 4289 | 14 | 543 | 06 | 192 | 03 | 255 | 266 | 19366 |
| බදුල්ල | 98 | 13285 | 88 | 8937 | 41 | 4499 | 10 | 1265 | 125 | 37950 | 27 | 3527 | 44 | 3759 | 09 | 1353 | 442 | 74575 |
| මොණරාගල | 24 | 2273 | 05 | 430 | - | - | 04 | 324 | 21 | 5332 | 16 | 1267 | 01 | 40 | 36 | 12129 | 107 | 21795 |
| පොළොන්නරුව | 08 | 875 | 10 | 1050 | 07 | 650 | 07 | 350 | 07 | 1600 | 10 | 950 | 03 | 225 | 02 | 150 | 54 | 5850 |
| අනුරාධපුර | 26 | 2815 | 28 | 2110 | 25 | 1920 | 22 | 2620 | 27 | 2450 | 15 | 611 | 06 | 413 | 04 | 315 | 153 | 13254 |
| ත්‍රිකුණාමලය | 11 | 275 | 01 | 152 | 01 | 168 | 01 | 75 | 11 | 825 | 03 | 148 | 01 | 122 | 02 | 560 | 31 | 2325 |
| අම්පාර | 13 | 208 | 11 | 220 | 14 | 308 | 09 | 225 | 17 | 544 | 08 | 280 | 14 | 238 | 03 | 68 | 89 | 2091 |
| මඩකලපුව | 17 | 1059 | 35 | 1143 | 40 | 1461 | 38 | 1420 | 48 | 10887 | 18 | 711 | 30 | 800 | 11 | 1695 | 237 | 19176 |
| කුරුණෑගල | 71 | - | 102 | - | 13 | - | 44 | - | 83 | - | 36 | - | 06 | - | - | - | 339 | 55601 |
| පුත්තලම | 15 | 593 | 40 | 12358 | - | - | 17 | 1170 | 29 | 9664 | 11 | 806 | 01 | 60 | 12 | 1260 | 125 | 25511 |
| යාපනය | 12 | 625 | - | - | 07 | 475 | 14 | 1200 | 25 | 1300 | 15 | 2500 | 03 | 250 | 02 | 560 | 78 | 6810 |
| වව්නියාව | 11 | 412 | 03 | 115 | 05 | 400 | 07 | 170 | 11 | 790 | 09 | 616 | 06 | 175 | 02 | 545 | 54 | 3223 |
| මන්නාරම | 04 | 136 | 07 | 243 | 177 | 5664 | 17 | 580 | 03 | 570 | 02 | 65 | 03 | 104 | - | - | 213 | 7362 |
| මුලතිව් | 01 | 05 | 02 | 60 | 05 | 200 | 02 | 35 | 06 | 170 | 08 | 400 | 06 | 300 | 05 | 250 | 40 | 1465 |
| කිලිනොච්චි | 01 | 45 | 01 | 676 | 03 | 250 | - | - | 03 | 300 | 01 | 25 | - | - | 01 | 5000 | 10 | 6296 |
| එකතුව | 347 | 89458 | 938 | 76480 | 452 | 27235 | 368 | 27242 | 799 | 167524 | 347 | 35956 | 211 | 10428 | 369 | 83230 | 5959 | 606945 |

ජාතික තරුණ සේවා සභාව

2012.12.31 දිනට

ශේෂ පත්‍රය

| විස්තරය | උප අංක | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| දේපළ පි. යන්ත්‍රෝපකරණ හා පිරියත | 01 | 2,295,277,996 | 1,968,208,688 |
| අඩු කළා :- සමුච්චිත ක්ෂය | 01-1 | 1,499,353,784 | 1,424,389,053 |
| ශුද්ධ අගය | | **795,924,212** | **543,819,635** |
| කෙරීගෙන යන වැඩ ගිණුම | 02 | 162,442,034 | 25,832,696 |
| ආයෝජන (විවිධ යට) | 03 | 4,032,360 | 4,032,360 |
| | | **962,398,606** | **573,684,691** |
| එකතු කළා :- | | | |
| ජංගම වත්කම් | 04 | 156,286,099 | 181,691,137 |
| අඩු කළා:- ජංගම බැරකම් | 05 | (44,483,736) | (73,549,411) |
| ශුද්ධ ජංගම වත්කම් | | **111,802,363** | **108,141,726** |
| | | **1,074,200,969** | **681,826,417** |
| මෙයින් නියෝජනය වන්නේ. | | | |
| රජයේ ආයතනය (ප්‍රාග්ධන) | 06 | 1,247,925,589 | 1,029,475,589 |
| වර්ෂයේ ලැබීම් | | 429,490,000 | 218,450,000 |
| | | **1,677,415,589** | **1,247,925,589** |
| බාහිර ආයතනය (ප්‍රාග්ධන) | | | |
| විදේශ ආධාර | 07 | 653,605,483 | 653,605,483 |
| වෙනත් බාහිර ආයතනය (ප්‍රාග්ධන) | 08 | 186,702,032 | 172,165,215 |
| බාහිර ආයතන ඉතිරිය (ප්‍රාග්ධන) | 09-1 | 60,000 | 2,332,683 |
| ප්‍රාග්ධන සංචිත | 10 | 34,155,267 | 34,155,267 |
| | | **874,522,782** | **862,258,648** |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය | | (1,720,572,832) | (1,667,626,335) |
| දිගු කාලීන බැරකම් | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම් | | 242,835,430 | 239,268,515 |
| | | **1,074,200,969** | **681,826,417** |

ඩී. ජයතිස්ස සිල්වා,
අධ්‍යක්ෂ (මුදල්).
ජාතික තරුණ සේවා සභාව.

නිතිඥ ලලිත් පියුම් පෙරේරා
සභාපති / අධ්‍යක්ෂ ජෙනරාල්
ජාතික තරුණ සේවා සභාව

ජාතික තරුණ සේවා සභාව

2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| විස්තරය | උප අංක | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| ආදායම් | | | |
| රජයේ දායකය (පුනරාවර්තන) | | 572,000,000 | 560,000,000 |
| බාහිර දායකය (පුනරාවර්තන) | | | |
| පුහුණු සහා | 5-8-1 | 2,318,194 | 199,925 |
| සම්පාදන හා ව්‍යාපෘති ආයතන (පුනරාවර්තන) | 5-8-2 | 473,941,386 | 390,609,753 |
| විදේශ සංවිධාන | 5-8-3 | 8,699,544 | 232,000 |
| | | 1,056,959,124 | 951,041,678 |
| [illegible] ආදායම් | | | |
| ජාතික තරුණ මධ්‍යස්ථාන ආදායම් (සිසු ගාස්තු) | 11-1 | 19,924,965 | 19,429,124 |
| පුහුණු මධ්‍යස්ථාන ආදායම් | 11-2 | 77,960,357 | 60,434,429 |
| සංසද ආදායම් | 11-3 | 7,600,102 | 11,341,125 |
| ජීවිත සමාජ ආදායම් (ශුද්ධ) | 11-4 | 1,106,902 | 676,204 |
| විවිධ ආදායම් | 11-5 | 7,503,948 | 12,069,567 |
| නොවිපල කාලය ගිණුම් | 11-6 | 4,995,664 | 887,817 |
| සංදර්ශන ආදායම් | | 6,387,360 | 3,772,947 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය | | 1,632,696 | 2,163,050 |
| | | 127,117,994 | 110,574,263 |
| | | 1,184,077,118 | 1,061,615,941 |
| මෙහෙයුම් වියදම් | | | |
| අඩු කළා :- | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 12 | 630,508,864 | 606,593,576 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 1-1 | 71,665,494 | 46,205,103 |
| [illegible] | | 4,437,431 | |
| | | (706,611,789) | (652,798,679) |
| | | 477,465,329 | 408,817,262 |
| තරුණ සංවර්ධන වියදම් | 12 | | |
| [illegible] සංවර්ධන අංශය | 2-1 | 58,750,636 | 74,548,142 |
| මාධ්‍ය අංශය | 2-2 | 11,845,064 | 11,895,697 |
| [illegible] හා සැලසුම් අංශය | 2-3 | 6,340,686 | 4,349,323 |
| වෘත්තීය මාර්ගෝපදේශන හා [illegible] අංශය | 2-4 | 3,309,554 | 2,449,012 |
| අධ්‍යාපන හා සංවර්ධන අංශය | 2-5 | 5,039,044 | 2,783,454 |
| තරුණ සේවා [illegible] | 2-5-2 | 4,181,857 | 8,043,993 |
| කාර්මික හා වෘත්තීය පුහුණු අංශය | 2-6 | 64,024,892 | 12,437,584 |
| ජාතික තරුණ මධ්‍යස්ථාන [illegible] අංශය | 2-7 | 1,910,427 | 563,670 |
| ජාත්‍යන්තර තරුණ සම්බන්ධීකරණ අංශය | 2-8 | 52,971,877 | 13,580,888 |
| [illegible] | 2-9 | | 4,872,362 |
| ක්‍රීඩා සංවර්ධන අංශය | 2-10 | 125,308,543 | 100,819,631 |
| තරුණ සමිති හා සංවර්ධන අංශය | 2-11 | 106,464,737 | 88,356,500 |
| ආදායම් උත්පාදන හා [illegible] සංවර්ධන අංශය | 2-12 | 12,937,525 | 20,912,142 |
| [illegible] අංශය | 2-14 | 4,459,616 | 1,441,640 |
| ප්‍රාදේශීය සම්බන්ධීකරණ හා [illegible] අංශය | 2-17 | 7,268,695 | 5,754,332 |
| විශේෂ ව්‍යාපෘති අංශය | 2-18 | 31,766,817 | 23,336,538 |
| පුහුණු මධ්‍යස්ථාන | 2-6 | 48,774,063 | 3,072,189 |
| ජාතික තරුණ මධ්‍යස්ථානය - මහරගම | 2-6-1 | 6,121,093 | 78,351,740 |
| | | 551,174,926 | 457,568,837 |
| වර්ෂයේ වියදම් අතිරික්තය | | (73,709,597) | (48,751,575) |
| එකතු කළා :- | | | |
| වියදම් අතිරික්තය (2012.01.01) | | (1,667,626,335) | (1,619,576,038) |
| පෙර වර්ෂයට ගැලපීම | | 20,763,100 | 701,278 |
| ඉදිරියට ගෙනගිය ශේෂය | | **(1,720,572,832)** | **(1,667,626,335)** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: වයිඑස්/බී/එන්වයිඑස්සී/2012/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2010 ඔක්තෝබර් 31 දින

සභාපති,
ජාතික තරුණ සේවා සභාව.

ජාතික තරුණ සේවා සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ජාතික තරුණ සේවා සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 29(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2013 අප්‍රේල් 30 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone. 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail. oaggov@sltnet.lk

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

---------------------------------------------

ජාතික තරුණ සේවා සභාවේ පාලිත සමාගමක් වන සී/ස තරුණ සේවා සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම, එම සමාගමේ ගිණුම් 1999 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා පිළියෙල කර නොතිබුණි.

2.2.2 ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය නොකිරීම

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය මත, ගොඩනැගිලි ඉදි කිරීම නිම කළ වර්ෂයට පසු වර්ෂයේ සිට සියයට 5 ක් ලෙස ක්ෂය කළ යුතු වුවත්, ක්ෂය වෙන්කිරීමේ උප ලේඛනයට අනුව 2010 වර්ෂයේ රු.27,295,360 ක් වැය කර ඉදි කිරීම් නිම කළ සයින්දමරුදූ පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා 2011 හා 2012 වර්ෂ සඳහා ක්ෂය ගැලපීම් සිදු කර නොතිබීම නිසා පිළිවෙලින් වර්ෂයට අදාල ක්ෂය හා සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු. 1,364,768 ක් හා රු. 2,729,536 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) කෙරීගෙන යන කොන්ත්‍රාත්තු 16 ක 2012 දෙසැම්බර් 31 දිනට සහතික කළ වැඩ වටිනාකම ගිණුම්ගත කිරීම වෙනුවට ඒ ඒ කොන්ත්‍රාත්තුව සඳහා ගෙවූ එකතුව රු.162,300,683 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම, 2013 ජනවාරි 01 දින සිට 2013 මාර්තු 31 දින දක්වා 2012 වර්ෂය වෙනුවෙන් කළ රු. 18,112,763ක වියදම් 2012 වර්ෂයේ වියදම් ලෙස සටහන් කර නොතිබුණි. කෙසේ නමුත්, සභාවේ ගිණුම් තැබීම උපචිත පදනම මත සිදු කරන බව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් සංඛ්‍යා සහ විගණනයේ දී නිරීක්ෂණය වූ මුදල් ලැබීම් හා ගෙවීම් අතර රු. 10,393,299 ක වෙනසක් පැවැතිණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කළ ගොවිපොල කාරක ගිණුම අනුව, ගොවිපොලවල් 13 කින් සමාලෝචිත වර්ෂය තුළ ලද ආදායම රු. 5,265,552ක් වූ අතර එම ආදායම ඉපයීම සඳහා රු.287,063 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව, වර්ෂයේ ලාභ ප්‍රතිශතය සියයට 96 ක අසාමාන්‍ය අගයක් ගෙන තිබුණි. එමෙන්ම, 2012 වර්ෂය සඳහා ගොවිපොලවල් 12 කින් රු.4,448,292ක ආදායමක් උපයා ගැනීමට කිසිදු වියදමක් කර නොතිබුණි. ගොවිපොල සංවර්ධන අංශය විසින් ගොවිපොලවල් වෙනුවෙන් රු. 1,320,759ක් වැයකර තිබුණත්, කාරක ගිණුමේ වියදම් ලෙස එය දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වාහන 18 ක අයිතිය සභාව වෙත පවරා ගෙන තිබුණත් එම වාහනවල වටිනාකම අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂය වෙනුවෙන් වූ විගණන ගාස්තු 2012 වර්ෂයේ දී ගෙවා තිබුණත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2010 වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු. 925,000 ක් දක්වා තිබුණි.

2.2.4 නොසැසඳුණු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු ගිණුම් විෂයයන් 02ක ශේෂයන් හා එම ගිණුම් විෂයයන් වෙනුවෙන් පිළියෙල කර තිබුණු මූලාශ්‍ර ලේඛන අතර එකතුව රු. 6,587,468ක වෙනසක් සසඳා නොතිබුණි.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයේ දී එකතුව රු. 19,414,138ක ලැබිය යුතු ණය ශේෂ 382 ක් පැවතුණි. එම ශේෂ එකතුව තුළ වර්ෂ 07කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 914,270ක ණය ශේෂ විය. එමෙන්ම, වර්ෂ 03කට වඩා පැරණි ගෙවිය යුතු රු. 2,710,037 ක ණය ශේෂ 05ක් පැවැතිණි. 2011 වර්ෂයේ දී එකතුව රු.6,873,642 ක් වූ ණයගැති ශේෂ 144 ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි මූල්‍ය ප්‍රකාශනවලින් ලියා හැර තිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| විවිධ තැන්පත් | 5,040,000 | ශේෂ තහවුරු කිරීම් |
| කොන්ත්‍රාත් අත්තිකාරම් | 26,660,215 | ශේෂ තහවුරු කිරීම් |
| ණයහිමියෝ | 7,017,361 | ශේෂ තහවුරු කිරීම් |
| වෙනත් ආදායම් | 2,651,895 | උපලේඛන |
| උපදේශකවරයෙකුගේ ආහාර,ප්‍රවාහන හා දුරකථන වියදම් | 258,199 | ගෙවීම් බිල්පත් |
| යෞවන සමාජ සම්මේලනයට කළ ගෙවීම් | 2,686,040 | වියදම් පිළිබඳ තහවුරු කිරීම් |
| රියෝ-20 සමුළුවට සහභාගීවූවන්ගේ ආහාර, නේවාසික හා ප්‍රවාහන පහසුකම් සහ උපදේශකවරුන්ගේ භෝජන සංග්‍රහය | 3,157,353 | ගෙවීම් බිල්පත් |
| උපදේශකවරයෙකුගේ විදේශ ගමන් වියදම් හා දීමනා | 2,117,981 | පත්වීම් ලිපිය, තනතුර සඳහා වූ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර |
| විවිධ ව්‍යාපෘති 04ක ගනුදෙනු | 38,417,120 | විෂය ලිපිගොනු |
| | 88,006,164 | |

### 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුගාසි, හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 27 වැනි වගන්තිය | සභාව සතු සියලු දේපල ස්වකීය අරමුණු වැඩි දියුණු කිරීම සඳහා සභාව විසින් පාවිච්චි කරනු ලැබිය යුතු වූවත්, පහත සඳහන් අවස්ථාවල දී එයින් බැහැරව කටයුතු කර තිබුණි.<br><br>(i) බේරුවල තරුණ මධ්‍යස්ථානය ඉදි කිරීම වෙනුවෙන් 2000 ජූලි සිට බල පැවැත්වෙන පරිදි අවුරුදු 50ක බදු කාල සීමාවකට නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.3,300,000ක් වැයකර ඉඩමක් ලබාගෙන තිබුණි. ඒ වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනවන විට එකතුව රු. 3,398,200ක් වැයකර තිබුණි. එසේ ලබාගෙන වසර 13ක් ගත වී තිබුණ ද, 2013 අප්‍රේල් වන විටත් එහි කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි.<br><br>(ii) ප්‍රදේශ 03ක යොවුන් සරසවි ඉදි කිරීම සඳහා මූලික පිඹුරුපත් සැකසීම වෙනුවෙන් 2007 වර්ෂය තුළ දී රු.575,000ක් ගෙවා තිබුණත් 2012 වර්ෂය අවසාන වන විටත් එම ඉදිකිරීම් ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 25 හා 26 වැනි වගන්ති | මුරුක්කන්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදි කිරීම සඳහා මුදල් සම්මාදමේ යෙදී රු. 1,671,900ක් 2009 සැප්තැම්බර් වන විට එකතු කළ නමුත් එම සම්මාදම සඳහා රු. 732,918ක් සභාව විසින් වැය කර තිබුණි. මෙම මුදල් බැංකු ගිණුමක තැන්පත් කර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.2,631,487ක් විය. අදාල දුම්රිය ස්ථානය ඉදි කිරීම 2013 අප්‍රේල් වන විටත් ඉටු කර නොතිබුණි. |

SRI LANKA Youth

| | | |
|---|---|---|
| (ඇ) | 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය | වුවර් ඕ ශ්‍රී ලංකා යූත් පා පැදි සවාරියේ මාධ්‍ය සාකච්ඡාව රු.119,850ක් වැය කර හෝටලයක පවත්වා තිබුණි. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>----------------------- | |
| (i) | 1.3.2 මාර්ගෝපදේශය | අවස්ථා 05 ක දී මිල කැඳවීම් සිදු නොකර එකතුව රු. 684,295 ක මිල දී ගැනීම් සිදු කර තිබුණි. |
| (ii) | 3.9.1 මාර්ගෝපදේශය | ඇස්තමේන්තු වටිනාකම රු. 13,117,919ක කොන්ත්‍රාත්තු 08ක් සඳහා ප්‍රජා සමිති 03ක් තෝරාගෙන තිබුණත්, ඒ සඳහා සභාවේ සභාපතිවරයාගේ නියෝජනයක් සහ අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලැබූ නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විසින් සිදු කර නොතිබුණි. |
| (iii) | 5.4.11 මාර්ගෝපදේශය | ඉදිකිරීම් 11ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු වෙත එකතු කළ අගය මතය බදු සඳහා ඉන්වොයිස් පත්‍ර ලබා ගැනීමකින් තොරව එකතු කළ අගය මතය බදු ලෙස රු.12,508,737ක් ගෙවා තිබුණි. |
| (iv) | 5.4.12 මාර්ගෝපදේශය | ඉදිකිරීම් 12ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් 07 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවූ රු. 13,754,957ක එකතු කළ අගය මතය බදු පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දී නොතිබුණි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------- | |
| | 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව නිලධාරීන් තිදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ දී රු. 731,475 ක අතිරේක ඉන්ධන ලබා දී තිබුණි. |
| (ඊ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>------------------- | |
| (i) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.8 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වුවර් ඕ ශ්‍රී ලංකා යූත් පා පැදි සවාරියේ පයග්‍රහකයාට රු. 1,315,000 ක් වැය කර මෝටර් රථයක් ත්‍යාග ලෙස ප්‍රදානය කර තිබුණි. |
| (ii) | 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී 50 දරන චක්‍රලේඛය | නිලධාරීන් සිව් දෙනෙකුට 2011 හා 2012 වර්ෂවලදී එකතුව රු.355,720ක් වූ ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| (iii) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ප්‍රචාරණය සඳහා එකතුව රු.25,477,253 ක් වැය කර තිබුණත්, ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එමෙන්ම සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියල කර තිබුණු අයවැයගත ප්‍රචාරණ වැඩසටහන සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 73.71ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාව රු.මිලියන 48.75 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 24.96 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීම කෙරෙහි ආදායම් හා අභ්‍යන්තර ඉපයීම් රු. මිලියන 122.46 කින් වැඩි වී තිබුණත් මෙහෙයුම් හා තරුණ සංවර්ධන වියදම් රු. මිලියන 147.42 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3.2 සභාවට එරෙහිව හා සභාව විසින් ආරම්භකර ඇති නෛතික ක්‍රියාමාර්ග

ජාතික තරුණ සේවා සභාව පාර්ශවකරුවෙකු වී තිබුණු 2013 අප්‍රේල් 02 දින වන විටත් සමථයකට පත් නොවූ නඩු ප්‍රමාණය 35 ක් විය. ඉන් නඩු 22 ක් සඳහා සභාව වින්නි පාර්ශවය වූ අතර නඩු 13 ක් පැමිණිලි පාර්ශවය විය. ලද තොරතුරුවලට අනුව, සභාව වින්නි පාර්ශවය ලෙස පෙනී සිටින එක් නඩුවක පමණක් මූල්‍ය වටිනාකම රු. 1,600,000 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව හා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබුණු නමුත් සම්පූර්ණයෙන්ම අත් හැර දමා තිබුණු රු. මිලියන 16.25ක ව්‍යාපෘති 11 ක් ද ඇතුළුව ව්‍යාපෘති 34ක අනුමත ප්‍රතිපාදනවලින් රු.මිලියන144.79 ක් ඉතිරිව තිබුණි. ව්‍යාපෘති 22ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන රු. මිලියන 102.11කින් ඉක්මවා තිබුණි. තව ද, වාර්ෂික ක්‍රියාකාරී සැලැසුමට ඇතුළත් නොවූ වැඩසටහන් 13ක් වෙනුවෙන් රු.මිලියන 58.78ක් වැය කර තිබුණි.

(ආ) යෞවන සමාජ ව්‍යවස්ථාවට අනුව, එක් ග්‍රාම සේවා වසමකට එක් යෞවන සමාජය බැගින් පිහිටුවිය යුතු වුවත්, දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 334 හි වූ ග්‍රාම සේවා වසම් 14013ක් තුළ යෞවන සමාජ 11801 ක් පමණක් පිහිටුවා තිබුණි. ඒ අනුව ග්‍රාම සේවා වසම් 2212ක යෞවන සමාජ පිහිටුවා නොතිබුණි.

(ඇ) පුහුණු මධ්‍යස්ථාන 10ක නියැදියක් ලෙස ගෙන කළ පරීක්ෂාවකට අනුව, ඒ ඒ පුහුණු මධ්‍යස්ථානවල වාර්ෂික ඒක ශිෂ්‍ය පිරිවැය රු.6,089 සිට රු.51,203 දක්වා වූ පරාසයක පැවැතිණි.

(ඈ) ශ්‍රී ලංකා යූත් කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා ඒකකය සංවර්ධනය කිරීම සඳහා 2012 වර්ෂයේදී රු. 11,008,223ක් වැය කර තිබුණත් 2012 හා 2013 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ පුහුණුව ලද සංඛ්‍යාව පිළිවෙලින් 50ක් හා 69 දෙනෙකු විය. එමෙන්ම, ජාතික තරුණ මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන සියලුම ක්‍රීඩාවල සාමාජිකත්වය දරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සතියකට දිනයක් බැගින් ශාරීරික සුවතාව හා ශාරීරික යෝග්‍යතාව වර්ධන කර ගැනීමට අවකාශ ලබා දීම හා ශ්‍රී ලංකා යූත් කායවර්ධන කණ්ඩායමක් බිහි කිරීම යන අරමුණු ඉටු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජූනි 12 දින සිට ජූනි 23 දින දක්වා බ්‍රසීලයේ පැවැති තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයට (Rio + 20) ජාතික තරුණ සේවා සභාව විසින් 12 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක සහභාගීත්වයක් ලබා දී ඒ වෙනුවෙන් රු. 11,389,540 ක් වැය කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ලබා නොගෙන, නේවාසික පහසුකම් සළසා ගැනීම වෙනුවෙන් රු. 2,430,583 ක් විදේශීය පුද්ගලයින් දෙදෙනෙකු වෙත ගෙවා තිබුණි.

(ii) සමුළුවට සහභාගි වූ නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් නවාතැන් හා යැපීම් දීමනා ලෙස රු.938,312 ක් ගෙවා සභාවේ වියදමින් නවාතැන් පහසුකම් ද සලසා දී තිබුණු බැවින් නවාතැන් පහසුකම් වෙනුවෙන් සභාව දරන ලද වියදම මෙරටට පැමිණි පසු පියවීමට ඔවුන් එකඟ වී තිබුණි. කෙසේ නමුත්, ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණ මාස 08 ක් ගත වී තිබුණත්, නවාතැන් දීමනා ලෙස සභාව ලබා දුන් රු.410,808ක් ආපසු අය කර ගෙන නොතිබුණි.

(iii) සම්මේලනයට සහභාගි වන නිලධාරීන් හා නියෝජිතයන් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමේ දී නියෝජිතයන් දෙදෙනෙකුගේ වියදම් ශ්‍රී ලංකා රජයෙන් වැය නොකරන බවට දන්වා තිබුණු නමුත් ඔවුන් වෙනුවෙන් රු. 596,080 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

(ආ) ඉදිරිපත් වූ තොරතුරු අනුව, කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේ දී 2012 නොවැම්බර් 22 දින සිට 25 දින දක්වා පැවැති 24 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල හා කොට්ඨාශ, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් පැවැති මූලික තරඟාවලි සඳහා රු.56,232,555 ක් වැය කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් දිනකට රු. 484,000 ක් වන පරිදි දින 04 ක් සඳහා ක්‍රීඩාංගනය පෙට් බල්බවලින් අලංකාර කිරීමට රු.1,936,000 ක් ගෙවා තිබීම නිසා දිවා කාලයේ පමණක් ක්‍රීඩා උළෙල පැවැති දින 03 ක් සඳහා විදුලි බුබුලු වෙනුවෙන් රු. 1,452,000 ක වැය කිරීම නිෂ්කාර්ය වී තිබුණි.

(ii) ක්‍රීඩා උළෙලට සහභාගී වූ ක්‍රීඩික ක්‍රීඩිකාවන් සඳහා ටී ෂර්ට් හා බොටම් මිල දී ගැනීමට රු.3,943,630ක් වැය කර තිබුණි. උළෙල පැවැත්වීමට දින 05කට ප්‍රථම ලංසු කැඳවීමට පියවර ගැනීම නිසා කෙටි කාලයක් තුළ ප්‍රසම්පාදනය ඉටු කිරීමේ අපහසුතාව දන්වා බොහෝ ආයතන ලංසු ලබා දීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ නිසා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) ප්‍රකාර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) කැනඩා තරුණ හුවමාරු වැඩසටහන යටතේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් 2008 වර්ෂයේ දී තරුණ තරුණියන් සිව් දෙනෙකු වෙත ඇප රහිතව හා වෙනත් කිසිදු ලිඛිත බැඳීමකින් තොරව රු. 2,705,000ක් ලබා දී තිබීම හේතුවෙන් එම මුදල් නැවත අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) තරුණ තරුණියන් අතර දේශපාලන විනය පිළිබඳ හැඟීමක් ඇති කරලීම, නූතන ශ්‍රී ලාංකීය ජාතිය ගොඩ නැගීම සඳහා පදනමක් ඇති කිරීම, විශිෂ්ඨ තරුණ නායකත්ත්වයක් නිර්මාණය කිරීම හා ජාතික තරුණ සේවා පනතේ අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අරමුණු කර ගෙන මන්ත්‍රීවරුන් 335 දෙනෙකුගේ සංයුතියක් සහිතව ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව ස්ථාපනය කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට යොවුන් පාර්ලිමේන්තු සැසි 08ක් පවත්වා තිබුණත් පළමු සහ සස්වැනි සැසි වාර හැරුණු කොට අනෙක් සියලු සැසිවාරයන්හි මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය සියයට 47 සිට සියයට 69 දක්වා වූ පරාසයක පැවැතිණි. 05 වැනි සැසි වාරය සඳහා නවක මන්ත්‍රීවරුන් 88 දෙනෙකු සහභාගී වී තිබීම එම සැසිය සඳහා මන්ත්‍රීවරුන්ගේ වැඩි සහභාගීත්වයක් පෙන්නුම් කිරීමට හේතුව වී තිබුණි. සියළු සැසි වෙනුවෙන් මුළු මන්ත්‍රී සංඛ්‍යාවට සාපේක්ෂව නොපැමිණි සංඛ්‍යාව සියයට 47කි. මේ නිසා 2012 ජූලි මස මන්ත්‍රීවරුන් 83 දෙනෙකුගේ පැමිණීම දුර්වල බව ඔවුන් වෙත දන්වා පසුව සැසි වාර 03ක් නොපැමිණි මන්ත්‍රීවරුන් 14 දෙනෙකුගේ මන්ත්‍රීධූරය අහෝසි කර තිබුණි.

(ii) 2010 වර්ෂය තුළ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විට දරන ලද සමස්ත පුනරාවර්තන වියදම රු. 59,612,836ක් විය. පවත්වන ලද මුළු සැසි වාර සංඛ්‍යාව 08ක් වූ අතර එම සැසි සඳහා මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයේ සාමාන්‍යය 229 දෙනෙකු විය. ඒ අනුව, සභාව විසින් එක් සැසියක් සඳහා සහභාගී වූ මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් රු. 260,318ක ප්‍රමාණාත්මක පිරිවැයක් දරා තිබුණි.

4.3 අරමුණුවලින් බැහැර ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තරුණ සංවර්ධනය වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනවලින් රු. 2,916,444 ක් තරුණ සංවර්ධන අරමුණුවලින් බැහැර කටයුතු සඳහා වැය කර තිබුණි.

(ආ) මහරගම නගරයේ සංගීත ප්‍රසංගයක් පවත්වා ඒ වෙනුවෙන් රු. 3,925,264ක් වැය කර තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

සභාව විසින් ක්‍රියාත්මක කරන සෑම වැඩසටහනක් සඳහාම අවශ්‍ය විටක දී උපයෝගී කර ගත හැකි වන පරිදි එකඟ වූ යම් පොදු ආකෘතියකට අනුව ටී ෂර්ට්, කැප්, බොටම් යනාදිය සකස් කර ගැනීම වෙනුවට, ඒ ඒ වැඩසටහනෙන් වැඩසටහනට එවැනි ඇඳුම් පැළැඳුම් සකස් කර ගැනීම නිසා 2011 හා 2012 වර්ෂ සඳහා එකතුව රු. 24,152,602ක් මේ වෙනුවෙන් වැය කර තිබුණි.

4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු නොවූ අක්කර 338 රූඩ් 03 පර්චස් 01 ක් වූ ඉඩම් ඒකක 54 ක තිශ්වල දේපල තුළ සිදු කර තිබුණු ඉදි කිරීම් හා ප්‍රාග්ධන ස්වරූපයේ අළුත්වැඩියා වෙනුවෙන් රු. 261,347,372 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණි.

(ආ) මහරගම තරුණ මධ්‍යස්ථානයේ පුහුණු ගොඩනැගිල්ලේ පළමු මහලේ කාන්තා හා පිරිමි වැසිකිළිවල සිවිලිම, ලාම්පු හා අනෙකුත් උපකරණ ගලවා ඉවත් කිරීම වෙනුවෙන් රු. 100,000 ක් ගෙවා තිබුණ ද, පළමු මහලේ සිවිලිමක් නොතිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් පිහිටුවන ලබන තරුණ සංසදයේ ක්‍රියාකාරී දායකත්වයක් ලබා ගැනීම සඳහා රු. 5,368,100 ක් UN HABITAT (United Nation Habitat and Human Settlements Foundation) ආයතනය වෙත ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තරුණ සංසදයේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීමෙන් අපේක්ෂා කළ අරමුණු හා පරමාර්ථ, ඒවා ඉටුකර ගැනීම පිළිබඳ තොරතුරු ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6(iv) උප ඡේදය පරිදි ගෙවීම් සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) සි/ස තරුණ සේවා සමාගම, සි/ස තරුණ සේවා (සංගීත) සමාගම හා සි/ස තරුණ සේවා (නැටුම්) සමාගමේ කොටස් ආයෝජනය වෙනුවෙන් රු. 4,032,360 ක් වර්ෂ 1985 සිට 1990 වර්ෂය දක්වා කාලය තුල වැය කර තිබුණි. මෙම ආයෝජන වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත ලැබී නොතිබුණි. එමෙන්ම, සි/ස තරුණ සේවා (සංගීත) සමාගම හා සි/ස තරුණ සේවා (නැටුම්) සමාගම කිසිදු ක්‍රියාකාරිත්වයක් නොමැති නාමික ස්වරූපයේ ආයතන වූ අතර එම සමාගම් විසින් සභාව වෙත නිකුත් කළ කොටස් සහතික ඉදිරිපත් කිරීම හැර වෙනත් පැහැදිලි කිරීමක් විගණනය වෙත ලබා දීමට සභාව අපොහොසත් විය.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවලට වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමේ අධිකාරය රු. 500,000කට වඩා අඩු මිල දී ගැනීම් සඳහා පමණක් සීමා කර තිබුණ ද, පළාත් කාර්යාල 04 ක් විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 09ක දී එකතුව රු. 7,532,488ක මිල දී ගැනීම් කර තිබුණි. 2012 අප්‍රේල් 25 දිනැති අංක 24/2012 දරන අධ්‍යක්ෂ මණ්ඩල සභා සංදේශය මගින් ඉහත සීමාවන් අභිබවා සභාවේ මූල්‍ය බලතල පැවරීම සංශෝධනය කර තිබුණු අතර ඒ අනුව නිකුත් කළ 2012 ජූලි 04 දිනැති අංක 03/2012 දරන කාර්යාල චක්‍රලේඛයේ උපදෙස් ද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අභිබවා කටයුතු කිරීම හේතු වී තිබුණි.

4.6 සාවද්‍ය ගෙවීම්

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත 06 කට අදාලව ඉටු කර නොතිබුණු වැඩ විෂයයන් 51 ක් සඳහා රු.1,221,725 ක් ගෙවා තිබුණත් ඒවා ආපසු අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) අනුරාධපුර ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදි කළ වොලිබෝල් ක්‍රීඩා පිටියේ ඉටු කර නොතිබුණු වැඩ වෙනුවෙන් රු. 111,610 ක් ගෙවා තිබුණි.

4.7 හඳුනාගන්නා ලද පාඩු

------------------------

එරම්ණියාය පුහුණු මධ්‍යස්ථානය අලුත්වැඩියාවේ දී රු. 66,662 ක එකතු කළ අගය මත බදු මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණත් එම මුදල් අය කර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි.

4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් ඇස්තමේන්තු 06ක් වෙනුවෙන් අදාල ඇස්තමේන්තුවලට බාහිරව අමතර වැඩ සඳහා රු. 17,496,169 ක් ගෙවා තිබුණි. එය ඒ ඒ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මුදලට සාපේක්ෂව සියයට 7 සිට සියයට 34 දක්වා පරාසයක ප්‍රතිශතයක් විය. මෙම අතිරේක වැඩ වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව මිල ගණන් කැඳවා කොන්ත්‍රාත්තු පිරිනැමීමටත් ගිවිසුම්වලට එළැඹීමටත් පියවර ගෙන නොතිබුණි. කෙසේ නමුත්, ජාතික තරුණ සේවා සභාවේ ඉදිකිරීම් කර්මාන්තවල සැලැසුම් සකස් කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා උපදේශක ගාස්තු ලෙස රු. 4,910,023ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවීමට බැදී තිබුණි.

(ආ) දික්වැල්ල ප්‍රදේශයේ රු. 6,498,886 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් සහිත අත්පන්දු ක්‍රීඩා පිටියක් ඉදි කිරීමට ප්‍රජා සමිති දෙකක් වෙත කොන්ත්‍රාත්තු පවරා දී තිබුණත් එම සමිති සමග ඇති කර ගත් ගිවිසුම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘති වාර්තාව පරිදි දික්වැල්ල ප්‍රාදේශීය සභාව සමග ජාතික තරුණ සේවා සභාව අවබෝධතා ගිවිසුමකට එළැඹ නොතිබුණු අතර ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත් කළ වැඩ වාර්තා ජාතික තරුණ සේවා සභාවේ ඉදිකිරීම් අංශය මගින් පරීක්ෂා කර අධීක්ෂණ කමිටුවක් විසින් අවශ්‍ය නිර්දේශ ලබා දීමෙන් අනතුරුව මුදල් නිදහස් කිරීම වෙනුවට සෘජුවම ප්‍රාදේශීය සභාවට මුදල් ගෙවා තිබුණි. මෙම කර්මාන්තය 2012 ජූනි මස අවසන් විය යුතු වුවත්, පළමු හා දෙවන අදියර හැරුණු කොට කිසිදු සංවර්ධන කටයුත්තක් 2013 මාර්තු මස වන විටත් ඉටු කර නොතිබුණි.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ වොලිබෝල් ක්‍රීඩා පිටි ඉදිකිරීම

------------------------------------------------------------------

දැයට කිරුළ - 2012 වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ වොලිබෝල් ක්‍රීඩාපිටි ඉදිකිරීමේ සියළු කටයුතු සි/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිතිය වෙත පවරා තිබුණි. එම සමිතිය විසින් අදාල ව්‍යාපෘති සඳහා ලද මුදලින් සියයට 5 ක් අත රඳවා ගෙන ඉතිරි මුදලින් උප කොන්ත්‍රාත්කරුවන් මගින් ඉදි කිරීම් කටයුතු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රීඩා පිටි 16 ක් ඉදි කිරීමට නියමිතව තිබුණ ද, ක්‍රීඩා පිටි 07 ක් පමණක් ඉදි කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවීම් පහත පරිදි විය.

| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | අනුකූල නොවීම |
| --- | --- |
| 3.9.1 මාර්ගෝපදේශය | • සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපාකාර සමිතිය වෙත පවරා තිබුණු කොන්ත්‍රාත් 16ක් ඉදි කිරීම් කළ රු. 9,363,508 ක් වූ කොන්ත්‍රාත්තු හතම සමිතිය විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා දී තිබුණි.<br>• අනුමත සමිතියක් ලෙස ගැනෙන සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත රු.21,402,304ක් වූ කොන්ත්‍රාත් 16ක් පවරා තිබුණි. එමෙන්ම, එම සමිතිය විසින් රු. 5,350,576 ක් වූ කොන්ත්‍රාත්තු 04ක් එක්වර එකම පුද්ගලයෙකු වෙත පවරා දී තිබුණි. |
| 3.9.4 මාර්ගෝපදේශය | කොන්ත්‍රාත්තු පැවරීමේ දී ලංසු කැඳවීමක් සිදු කර නොතිබුණු අතර අනුමත සමිතියකට ලබා දිය හැකි උපරිම කොන්ත්‍රාත්තු වටිනාකම වූ රු. 200,000 සීමාව ඉක්මවා රු. 21,402,304ක කොන්ත්‍රාත්තු 16 ක් සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපාකාර සමිතිය වෙත පවරා දී තිබුණි. |

(iii) එක් එක් ක්‍රීඩා පිටිය භෞතිකව පරීක්ෂා කර ඒ අනුව වෙන වෙනම ඇස්තමේන්තු සකස් කිරීමක් සිදු කර නොතිබුණු අතර සියළු ඉදි කිරීම් සඳහා අදාල වන පරිදි පොදු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. මේ නිසා වැඩබිමේ ගස් මුල් ඉවත් කර ශුද්ධ කිරීම, මතු පිට පස් ඉවත් කිරීම් යනා දී වැඩ වෙනුවෙන් රු. 65,000 බැගින් ප්‍රතිපාදනය කර එම මුදල් සියළු කොන්ත්‍රාත් සඳහා ගෙවා තිබුණි. නමුත් ඉදි කිරීමට යෝජිතව තිබුණු එම ක්‍රීඩා පිටි සියල්ල දැනට පවතින ක්‍රීඩා පිටි තුළම ඉදි කෙරෙන බැවින් එම වැය විෂය යටතේ කොන්ත්‍රාත්තු 07 ක් සඳහා රු. 455,000 ක් ගෙවීම මනහේදයට තුඩු දෙන ගනුදෙනුවක් වී තිබුණි.

(iv) පදවිය හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ඉදි කළ ක්‍රීඩා පිටිවල ආවරණ දැල සඳහා යෙදිය යුතු ජීඅයි පයිප්ප 34ක් වෙනුවට 26ක් පමණක් යොදා තිබීම නිසා ආවරණ දැල රඳා පැවැතීමේ ශක්තිය සියයට 24කින් පමණ අඩු වී ඇති බැවින් අනෙකුත් ක්‍රීඩා පිටිවලට සාපේක්ෂව මෙම ක්‍රීඩා පිටි දෙකෙහි ආවරණ දැල වෙනුවෙන් වැය කළ රු. 1,825,500 ක මුදලින් දිගුකාලීන ඵලදායීතාවක් අපේක්ෂා කළ නොහැකි විය.

(v) වොලිබෝල් ක්‍රීඩා පිටි 04ක් ඉදි කිරීම වෙනුවෙන් කාර්මික නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව එකතුව රු. 4,297,816 ක් ගෙවා තිබුණි.

4.09 ප්‍රමාද වූ ව්‍යාපෘති

------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය අනුව, කොන්ත්‍රාත්තුවක් සඳහා අවම වශයෙන් මිලගණන් 05 ක් කැඳවිය යුතු වුවත්, රු. මිලියන 6 සිට 42 දක්වා පරාසය තුළ වූ එකතුව රු. 64,387,453ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත කොන්ත්‍රාත් 04 ක් සඳහා ලංසු 03ක් ලැබී තිබුණි. එහෙත් නැවත මිල කැඳවීමකින් තොරව අවම මිලට පවරා දී තිබුණි. 2012 පෙබරවාරි පැවැත්වීමට නියමිත දැයට කිරුළ වැඩසටහන ආරම්භ කිරීමට පෙර මෙම ඉදිකිරීම් කෙටි කාලයකින් නිම කළ යුතුව තිබීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීමට හේතු ලෙස සඳහන්ව තිබුණ ද, දැයට කිරුළ වැඩසටහන අවසාන වී 2013 මාර්තු 31 දින වන විට මාස 13ක කාලයක් ගත වී තිබුණත් එම කිසිදු කොන්ත්‍රාත්තුවක වැඩ අවසන් වී නොතිබුණි.

4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සභාවේ සම්පත්

------------------------------------------------------------

පුහුණු මධ්‍යස්ථාන ලෙස පවත්වා ගෙන ගිය සභාව සතු වූ හා සභාව විසින් භුක්ති විඳි එකතුව අක්කර 68 රූඩ් 02 පර්චස් 10 ක් වූ ඉඩම් ඒකක 14 ක් වෙනත් පාර්ශවයන්ට පැවරීමට සභාව පියවර ගෙන තිබුණි. කෙසේ නමුත් එම දේපලවල ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන කටයුතු සඳහා පමණක් රු. 56,345,248 ක් සභාව විසින් වැය කර තිබුණි.

## 4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 මැයි 19 දිනැති අංක සීඑම්එස්/ඊ3/36/4/224/1-1 දරන ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ඉහත ලිපියෙහි 05 ඡේදය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අතිරේක තනතුරු ඇති නොකළ යුතු වුව ද, ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ (මෙහෙයුම්) යනුවෙන් නව තනතුරු දෙකක් සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන 2012 වර්ෂය තුළ දී රු. 1,211,679 ක් ඉන්ධන හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ii) අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර සඳහා බඳවා ගත් නිලධාරියා වෙනුවෙන් පෞද්ගලික ලිපිගොනුවක් සභාව සතුව නොමැති බව අධ්‍යක්ෂ (පාලන) විසින් විගණනය වෙත දන්වා තිබුණි. එමෙන්ම, එම නිලධාරියා වෙත පත්වීම් ලිපියක් නිකුත් කළ බවට කිසිදු සාක්ෂියක් ද විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(ආ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සභාවේ ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශයට කාර්ය පැවරුම් පදනම මත උපදේශකවරයෙකු පත් කර 2011 ජූලි මස සිට 2012 මාර්තු මස දක්වා දීමනා වශයෙන් රු.270,000ක් ද, විදේශ ගමන් වෙනුවෙන් රු.1,847,981 ක් ද වශයෙන් එකතුව රු.2.117.981ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ආයතන සංග්‍රහයේ vi වැනි පරිච්ඡේදයේ 2.10 උප වගන්තිය පරිදි පත්වීම සම්බන්ධ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය හා මුල්‍ය ප්‍රතිපාදන පවතින බවට ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තහවුරු කිරීමක් රහිතව බඳවා ගැනීම කර තිබුණි.

(iii) 2011 පෙබරවාරි 24 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි නියමිත කාල පරිච්ඡේදයක් සඳහා නිශ්චිත කාර්ය පැවරුමක් ලබා දී නොතිබුණු අතර අදාල කාලය තුළ ඉටු කළ කාර්යභාරය පැහැදිලිව හඳුනා ගැනීමට ද අපහසු විය. තව ද, කාර්ය පැවරුම් පදනම මත ලබා දෙන පත්වීම් දින 45ක් නොඉක්මවන්නා වූ කෙටි කාලීන පදනම මත ලබා ගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් විය යුතු වුවත්, 2011 සිට 2014 දක්වා වර්ෂ 04ක කාල සීමාවකට මෙම පත්වීම ලබා දී තිබුණි. එමෙන්ම, මෙම උපදේශකවරයාට කළ ගෙවීම් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොතිබුණි.

(ඇ) සභාව සතු පළාත් කාර්යාල 06ක සහකාර ගණකාධිකාරී තනතුර පුරප්පාඩුව පැවැතිණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජනවාරි 17 දිනැති අංක සීඑම්එස්/ඊ3/36/4/229/1 දරන ලිපිය මගින් සහකාර ගණකාධිකාරී තනතුර අහෝසි කර ඒ වෙනුවට ගිණුම් නිලධාරී තනතුරක් ඇති කර තිබුණු නමුත් එම තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව දෙදෙනෙකු විය. කෙසේ නමුත්, 2012 වර්ෂයේ වියදම් දැරීම සඳහා සභාව විසින් පළාත් කාර්යාල වෙත රු. මිලියන 439ක් මුදා හැර තිබුණු අතර පළාත් කාර්යාල වෙන් වෙන්ව ගත් විට එය රු. මිලියන 29 – 99 අතර පරාසයක විය.

(ඈ) ජාතික තරුණ සේවා සභාව සඳහා අනුමත කළ බඳවා ගැනීමේ පරිපාටිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැසුම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැසුමෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, ඉටුකර ගත යුතු ඉලක්කයන් හි මූල්‍යමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැසුම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසුමක් සකස් කර අනුමත කර නොතිබුණි.

SRI LANKA Youth

5.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

----------------------------

එක් අධ්‍යක්ෂවරයෙකු 2011 හා 2012 වර්ෂවල කිසිදු සභා රැස්වීමකට සහභාගී වී නොතිබුණු අතර 2012 සභා රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගේ සහභාගීත්වය දුර්වල තත්ත්වයක පැවතිණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අරමුදල් සැපයෙන සියල්ල ඒකාබද්ධ කර සමස්ත අයවැය ලේඛනයක් සමාලෝචිත වර්ෂයේ දී පිළියෙල කර නොතිබුණි. පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයේ සලසා තිබුණු රු.91,800,000ක ප්‍රතිපාදනවලින් සියයට 28 ක් හෙවත් රු. 25,584,198ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ආයතන, සැපයීම් හා ප්‍රවාහන වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු. 33,178,869 ක් වැයකර තිබුණු බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛණය යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය
(ආ) අයවැය පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති.

**ජාතික තරුණ සේවා සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබද**

**1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා වූ ප්‍රගතිය ඇතුලත් වාර්තාව.**

| විගණන විමසුම් ඡේද අංකය | විමසුම් විස්තරය | අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2.2 | මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්විම | |
| 2.2.1 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම | |
| | ජාතික තරුණ සේවා සභාවේ පාලිත සමාගමක් වන වන සී/ස තරුණ සේවා සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.<br>එමෙන්ම එම සමාගමේ ගිණුම් 1999 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වාමත් පිළියෙල කර නොතිබුනි. | සී/ස නැටුම් සමාගම,සී/ස සංගීත සමාගම මේ වන විට අහෝසි වි ඇති අතර ඒ පිලිබද නීතිපති අදහස් දැක්විමේ අංක ඊ/241/12/nysco හා 2013.03.18 දිනැති ලිපිය මේ සමග ඉදිරිපත් කර ඇත. මේ පිලිබදව තවදුරටත් ගත යුතු නීතිමය ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට සැලසුම් කර ඇත.<br>සභා පනතේ 5(2)ආ ඡේදය කෙරෙහි අවධානය යොමු කරන අතර සී/ස තරුණ සේවා සමාගම සභාවේ ආයෝජනයක් සේ සැලකෙන බැවින් මූල්‍ය ප්‍රකාශනයේ ආයෝජන ලෙස එම අගය රු.4,032,360 පෙන්වා ඇත. ඒ අනුව ඒකාබද්ධ ගිණුම් ඉදිරිපත් කිරිමේ අවශ්‍යතාවයක් නොමැති සේ සැලකේ.<br>මේ වන විට 2010/11,2011/12,2012/13 මූල්‍ය වර්ෂ වලට අදාලව අවසාන ගිණුම් කෙටුම්පත් කර ඇති අතර විගණනය සඳහා SBN Associate වරලත් ගණකාධිකාරි සමාගම වෙත භාරදී ඇත. |
| 2.2.2 | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය නොකිරිම | |
| (අ) | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය මත,ගොඩනැගිලි ඉදිකිරිම නිමකල වර්ෂයට පසු වර්ෂය සිට 5% ක් ලෙස ක්ෂය කල යුතු වුවත්, ක්ෂය වෙන් කිරිමේ උපලේඛණයට අනුව 2010 වර්ෂයේ රු.27,295,360 ක් වැයකර ඉදිකිරිම් නිමකල සයින්දමරුදූ පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා 2011 හා 2012 වර්ෂ සඳහා ක්ෂය ගැලපිම් සිදුකර නොතිබිම නිසා පිලිවෙලින් වර්ෂයට අදාල ක්ෂය හා සමුච්චිත ක්ෂය වෙන්කිරිම රු.1,364,768 ක් හා රු.2,729,563 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුනි. | සයින්දමරුදූ පුහුණු මධ්‍යස්ථානයට අදාල රු.27,295,360 තුල 2011 වර්ෂයේ සිට ගණනය කර පරිගණක ගත කර ඇතුලත් කිරිමේදි අත්හැරි ඇත. එය 2013 වර්ෂයේ ජනල් සටහන් අංක 62 මගින් නැවත ලේඛණගත කිරිමට පියවර ගෙන ඇත. |

<table>
<tr><td>(ආ)</td><td>රු.162,300,683 ක් වු කෙරිගෙන යන කොන්ත්‍රාත්තු 16 ක 2012 දෙසැම්බර් 31 දිනට සහතික කල වැඩ වටිනාකම ගිණුම්ගත කිරිම වෙනුවට ඒ ඒ කොන්ත්‍රාත්තුව සදහා ගෙවු මුදල පමනක් ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම 2013 ජනවාරි මාසයේ 01 වන දින සිට 2013 මාර්තු 31 දින දක්වා 2012 වර්ෂය වෙනුවෙන් කල රු.18,112,763 ක වියදම් 2012 වර්ෂයේ වියදම් ලෙස සටහන් කර නොතිබුනි. කෙසේ නමුත් සභාවේ ගිණුම් තැබිම උපචිත පදනම මත සිදු කරන බව මුල්‍ය ප්‍රකාශන වල ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුනි.</td><td>කොන්ත්‍රාත්කරුවන් විසින් බිල්පත් හා වැඩ නිමි වාර්තා මුල්‍ය වර්ෂය තුල ඉදිරිපත් නොකිරිම හේතුවෙන් ගිණුම් කටයුතු සදහා වැඩ නිමි වාර්තා ඉදිරිපත් වි නොමැත. ඒවා ඉදිරිපත් වි ඇත්තේ 2013 වර්ෂයේ බැවිනුත්,එම වැඩ කොටස් 2013 සැලසුම් කර තිබු බැවිනුත් 2013 වර්ෂයේ ගෙවිමට පාදක වි ඇත. ඒ අනුව ලේඛණ මත පදනම්ව උපචිත පදනම ගිණුම් ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක විම සිදුවි ඇත. මෙම තත්වය මග හරවා ගැනිම සදහා පියවරක් ලෙස කොන්ත්‍රාත් නිම වු වහාම ඊට අදාල සහතික කල බිල්පත්, වැඩ නිමකිරිමට අදාල ප්‍රමාණපත්‍ර ඉදිරිපත් කිරිම සදහා පියවර ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කිරිමට පියවර ගෙන ඇත.</td></tr>
<tr><td>2.2.3</td><td>ගිණුම්කරණ අඩුපාඩු</td><td></td></tr>
<tr><td>(අ)</td><td>විගණනය සදහා ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සදහන් සංඛ්‍යා සහ විගණනයේදි නිරික්ෂණය වු සත්‍ය වශයෙන් මුදල් ලැබිම් හා ගෙවිම් අතර රු.10,393,299 ක වෙනසක් පැවතිනි.</td><td>මුල්‍ය ප්‍රකාශන සදහා ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ විගණනයේ නිරික්ෂණ අනුව ගණනය කිරිම් සදහා යොදා ගෙන ඇති පදනම මුල්‍යමය වශයෙන් පමණි. ගිණුම් අනුව අප විසින් පාදක කර ගෙන ඇත්තේ මුලික අගයන් හෙවත් පිරිවැය අගයන්ය. ආයතනික තීන්දු තීරණ ගැනිමේදි මෙම අගයන්ගෙ වෙනස්විම් බලපෑමක් සිදු නොකරන බව අපගේ අදහස වේ. එහෙත් ඉදිරියේදි ශුද්ධ අගයන් මත පමණක් ශේෂ ගනනය කිරිම් හා පෙන්නුම් කිරිම සදහා ක්‍රියා කෙරේ.
<table>
<tr><th>ගිණුම් අයිතමය</th><th>මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව</th><th>සත්‍ය වශයෙන් මුදල් ලැබිම් හා ගෙවිම් අනුව</th><th>වෙනස</th></tr>
<tr><td>පෙර වර්ෂයේ ගැලපිම්</td><td>24,632,612</td><td>20,763,100</td><td>3,869,512</td></tr>
<tr><td>ණයගැතියෝ</td><td>2,280,000</td><td>175,000</td><td>2,105,000</td></tr>
<tr><td>අනෙකුත් ජංගම වත්කම්</td><td>4,633,469</td><td>3,448,717</td><td>1,184,752</td></tr>
<tr><td>කොන්ත්‍රාත් රදවා ගැනිම්</td><td>8,539,350</td><td>8,644,218</td><td>104,868</td></tr>
<tr><td>පාරිතෝෂිත ගෙවිම්</td><td>20,031,481</td><td>7,273,171</td><td>2,758,310</td></tr>
<tr><td>ස්ථාවර වත්කම් විකිණමෙන් ලද මුදල්</td><td>1,707,363</td><td>1,336,506</td><td>370,857</td></tr>
<tr><td></td><td></td><td></td><td>10,393,299</td></tr>
</table>
</td></tr>
</table>

| | | |
|---|---|---|
| (ආ) | විගණනය සදහා ඉදිරිපත් කල ගොවිපල කාරක ගිණුම් අනුව, ගොවිපලවල් 13 කින් සමාලෝචිත වර්ෂය තුල ලද ආදායම රු.5,265,552 ක් වු අතර එම ආදායම ඉපයිම සදහා දරන ලද වැය රු.287,063 ක් විය. ඒ අනුව වර්ෂයේ ලාභ ප්‍රතිශතය 96% ක අසාමාන්‍ය අගයක් ගෙන තිබුණි. එමෙන්ම මින් ගොවිපලවල් 12 කින් 2012 වර්ෂය සදහා රු.4,448,292 ක ආදායමක් උපයා ගැනිමට කිසිදු වියදමක් දරා නොතිබුණි. එමෙන්ම ගොවිපල සංවර්ධන අංශය යටතේ මෙම ගොවිපලවල් වෙනුවෙන් දරන ලද රු.1,320,759 ක වියදම් මෙම කාරක ගිණුමේ වියදම් ලෙස දක්වා නොතිබුණි. | ගොවිපලවල් පවත්වාගෙන යාමේදි ලාභය මුලික අරමුණ සේ නොසැලකෙන අතර, ගොවිපල පිරිවැය අන්තර්ග්‍රහණයන් ගණන් බැලිමක්ද කර නොමැත. පවත්නා තත්වය අනුව ආදායම් හා වියදම් සම්පුර්ණයෙන් හදුනාගෙන ගිණුම් ගත කර ඇත.<br>ගොවිපල පවත්වාගෙන යාමේදි ප්‍රධාන කොටම කෘෂිකාර්මික පාඨමාලා පවත්වාගෙන යාමේදි එම පාඨමාලා ලාභ පමණක් අරමුණු කරගෙනයාමක් සිදු නොවන අතර ප්‍රායෝගික පුහුණුව ලබාදිම මුලික අරමුණ වන අතර මෙවැනි තත්වයක් ගිණුම්මය වශයෙන් පෙන්නුම් විමට ප්‍රධාන කොටම බලපා ඇත්තේ අභ්‍යන්තර ආදායම් මගින් ගොවිපල ආදායම් සටහන් විමත් ව්‍යාපෘති මගින් පාඨමාලා වියදම් සටහන් විමත් හේතුවෙනි. කෙසේ වෙතත් 2013 වර්ෂයේදි ගොවිපල පිරිවැය අන්තර්ග්‍රහනයන් සම්පුර්ණයෙන් ගොවිපල කාරක ගිණුම මගින් පෙන්නුම් කිරිමට පියවර ගෙන ඇත |
| (ඇ) | සභාව සතු නොවු වාහන 18 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව වෙත පවරා ගෙන තිබුනු නමුත් ඒවා අගය කර ගිණුම් ගත කිරිමට පියවර ගෙන නොතිබුණි. | මෙම වාහන 18 සභාව වෙත පවරා ගෙන ඇතත් මේවා තක්සේරු කිරිම සදහා අදාල පියවර ගිණුම් වර්ෂය තුලදි සිදු නොකිරිම හේතුවෙන් ගිණුම් වල ඇතුලත් කර නොමැත. එහෙත් මේ වන විට මෙම වාහන සදහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙතින් තක්සේරු ලබා ගැනිම සදහා වු ඉදිරි පියවර ගෙන ඇත. |
| (ඈ) | 2010 වර්ෂය වෙනුවෙන් වු විගණන ගාස්තු 2012 වර්ෂය තුල ගෙවා තිබුණද, 2010 වර්ෂය සදහා රු.925,000 ක් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා තිබුණි. | 2010 වර්ෂයේ විගණන ගාස්තුව රු.947,032 වැය ශිර්ෂය වැරදිමකින් හරවිම මිට හේතු වි ඇති අතර 2013 ජ නල් අංක 61 මගින් ගලපා සටහන් කිරිමට පියවර ගෙන ඇත. |
| 2.2.4 | නොසැසදුනු ගිණුම් | |
| | සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුනු ගිණුම් 02 ශේෂයන් හා එම ගිණුම් වෙනුවෙන් පිලියෙල කර තිබුනු මුලාශ්‍ර ලේඛණ අතර, එකතුව රු.6,587,468 ක නොසැසදුනු වෙනසක් පැවතිණි. | ආදායම් මුදල් සෘජුවම ගිණුම් වෙත යොමු විම හේතුවෙන් මෙම තත්වය පැන නැගි ඇති අතර, මෙහි මුල්‍ය ප්‍රකාශනයේ ශේෂය නිවැරදි බව සහතික කෙරේ. ප්‍රතිපත්තිමය තිරණ ගැනිම සදහා උපයෝගි කර ගනු ලබන්නේද මුල්‍ය ප්‍රකාශනයේ සදහන් තත්වයන්ය. |
| 2.2.5 | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | |
| | සමාලෝචිත වර්ෂය අවසානයේදි වර්ෂ 03 කට වඩා පැරණි රු.19,414,138 ක ලැබිය යුතු ණයශේෂ 382 ක් පැවති අතර ඒ තුල වු වර්ෂ 07 කට වඩා පැරණි ණයශේෂ වටිනාකම රු.914,270 ක් විය. එමෙන්ම වර්ෂ 03 කට වඩා පැරණි ගෙවිය යුතු රු.2,710,037 ක ණයශේෂ 5 ක් පැවතිණි.කෙසේ නමුත් 2011 වර්ෂයේදි රු.6,873,642 ක් වු ණයගැති ශේෂ 144 ක් අධ්‍යක්ෂ මණ්ඩල තිරණය පරිදි ආදායම් වියදම් ගිණුමට ලියා හැර තිබුණි. | මෙයට අදාල පිලිතුරු ඇමුණුම් අංක 01 මගින් දක්වා ඇත. |

| 2.2.6 | විගණනය සඳහා සාක්ෂි නොවීම | |
|---|---|---|

එකතුව රු.88,545,114 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|
| විවිධ තැන්පත් | 5,040,000 | ශේෂ තහවුරු කිරීම් |
| කොන්ත්‍රාත් අත්තිකාරම් | 26,660,215 | ශේෂ තහවුරු කිරීම් |
| ලැබිය යුතු ආදායම් | 538,950 | ශේෂ තහවුරු කිරීම් |
| ණයහිමියෝ | 7,017,361 | ශේෂ තහවුරු කිරීම් |
| වෙනත් ආදායම් | 2,651,895 | උපලේඛන |

මෙම මුදල් සියල්ලම කරන ලද තැන්පත් වන අතර ඒ සියල 2012වර්ෂයේ තවදුරටත් පවතින බවට සහත්ක විය හැක.

මෙම ශේෂ සඳහා මීට පෙර සනාථ ලිපි යැවුවද පිලිතුරු ලැබී නැත මෙම ශේෂ සභාව පාර්ශවයෙන් අවසන් කිරිම පිලිබඳව කටයුතු කෙරී ඇත.

ශේෂ තහවුරු කිරීම් ලිපි යැවිමට පියවර ගෙන ඇති අතර ඒ සඳහා ඵලදායි තොරතුරු නොමැති බැවින් ස්ථිර ක්‍රියාමාර්ග ගැනිමට පියවර ගෙන ඇත.

2013 වර්ෂයේ ගෙවා අවසන් කර ඇත.

මෙම ආදායම් නිරන්තරව පවතින ආදායම් නොවන බැවින් හා ප්‍රමාණාත්මක ලේඛන නඩත්තුවකින් හදුනා ගැනිමට අවශ්‍ය නොවන බැවින් හා තීරණ සඳහා බලපෑමක් නොවන බැවින් වෙනත් ආදායම් යටතේ සඳහන් කරන ලද අතර අංශයේ ලේඛණ වල අදාල තොරතුරු නිවැරදි බව සඳහන් කිරිම ප්‍රමාණවත් බැවින් ඒ අනුව කටයුතු කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| | උපදේශකවරයකුගේ විදේශ ගමන් වියදම් හා දීමනා | 2,117,981 | පත්වීම් ලිපිය පිලිබඳ විස්තර<br><br>තනතුර සඳහා වූ සුදුසුකම් හා පලපුරුද්ද පිලිබඳ විස්තර | කාර්ය පැවරුම් පදනම මත 2014 පැවැත්වෙන ලෝක තරුණ සමුළුව වෙනුවෙන් බඳවා ගෙන ඇති අතර, ජාතික තරුණ සේවා සභාවේ ස්ථිර,අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමක් කර නොමැති නිසා ඔහු විසින් ඉටු කල යුතු කාර්යයන් පිලිබඳ ඇතුලත් කොන්දේසි සහිත (Term of reference ) ලිපියක් පමණක් ඇති අතර, එය මෙය සමග ඉදිරිපත් කර ඇත.<br><br>ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා ශක්තිමත් කිරිම සහ පුළුල් කිරිමේ අරමුණ ඇතිව 2011.04.26 දින සභා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 19/2011 අනුව මෙම නිලධාරියා බඳවා ගැනිම සිදුකර ඇති අතර, ජාත්‍යන්තර තරුණ කටයුතු ක්ෂේත්‍රයට අදාලව ඔහුගේ නිපුණතාව හා ප්‍රවීණත්වය පිලිබඳව ඉදිරිපත් කරන ලද තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල අවධානයටද යොමු කර ඇත. |
| | යෞවන සමාජ සම්මේලනයට කල ගෙවීම් | 2,686,040 | වියදම් පිලිබඳ තහවුරු කිරිම් | 2012 ජාතික යෞවන ක්‍රිඩා උළෙලේ මැරතන් ධාවන තරග සඳහා ශක්ති ජනක පානයන් සකස් කිරිම, ක්‍රිඩකයන් ඇතුළු සියළුම නිලධාරින්ගේ හැඳුනුම්පත් සකස් කිරිම, සුභ පැතුම්,බැනර් හා නාමාවලි සකස් කිරිම,ජාතික මණ්ඩල නියෝජිතයන් සඳහා ආහාර සැපයිම යනාදි කටයුතු ශ්‍රි යෞවන සමාජ සම්මේලනය විසින් සිදු කරන ලදි. ඒ සඳහා වැයවන මුදල 2012.12.24 දින පැවති සභා රැස්විම් තීරණ අංක 57/2012 සභා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව ආධාර යටතේ ශ්‍රි ලංකා යෞවන සම්මේලනය වෙත ලබාදි ඇත. |
| | රියෝ -20 සමුළුවට සහභාගිවූවන්ගේ නේවාසික පහසුකම්,ආහාර හා ප්‍රවාහන සහ උපදේශකවරුන්ගේ භෝජන සංග්‍රහය | 3,157,353 | ගෙවීම් බිල්පත් සහ සහභාගි වූ දේශිය හා විදේශිය නියෝජිතයන් පිලිබඳ විස්තර | ලබා ගන්නාලද නේවාසික පහසුකම් වලට අදාලව අදාල බිල්පත් විදේශ අංශය සතුව පවතින බවත් මෙම සමුළුව සඳහා පහත නම් සඳහන් නියෝජිතයන් සහභාගි විය.<br>1. නිලන්ති සුගතදාස මිය - අතිරේක ලේකම්(යෞවන කටයුතු හා නිපුණතා)<br>2. ලලිත් පියුම් පෙරේරා මයා - සභාපති (ජාතික තරුණ සේවා සභාව)<br>3. මිලින්ද රාජපක්ෂ මයා - ක්‍රියාකාරි අධ්‍යක්ෂ<br>4. රවිකර්කාර - ලෝක තරුණ සමුළුවේ උපදේශක(විදේශ නියෝජිත)<br>5. නිකොලායි ශෙපර්ඩ් මහත්මිය - UNDESA නියෝජිත(විදේශ නියෝජිත) |

| | | |
|---|---|---|
| | | |
| උපදේශකවරුන්ගේ ආහාර,ප්‍රවාහන හා දුරකථන වියදම් | 258,199 | ගෙවීම් බිල්පත් |
| පළාත් කාර්යාල 04 ක ගනුදෙනු | - | රු.500,000 වැඩි මිලදී ගැනීම් සම්බන්ධව විස්තර |
| විවිධ ව්‍යාපෘති 04 ගනුදෙනු | 38,417,120 | විෂය ලිපිගොනු |
| | 88,545,114 | |

6. සංඛ චන්දිම අභයවර්ධන මයා - ජාත්‍යන්තර සබඳතා උපදේශක
7. කවින්ද දිසානායක මයා - Intervention Coordinator
8. එම්.ඩී.ජේ.ඩී.වික්‍රමනායක මයා- නියෝජිත(ජාතික තරුණ සේවා සභාව)
9. ඩී.එම්.ජී.සඳමාලි දිසානායක මෙය -නියෝජිත (යෞවන සමාජ සම්මේලනය)
10. රාසු ජෙම්සි මෙය - නියෝජිත(යොවුන් පාර්ලිමේන්තුව)
11. එම්.එස්.මොහොමඩ් සිකන්දර් මයා -නියෝජිත youth activist (British Council)
12. එම්.එස්.මොහොමඩ් හුස්නි මයා- නියෝජිත (British Council)
13. රුවිනි කුමාරි මෙය -පුහුණු මාධ්‍යවේදි(ලේක්හවුස් ආයතනය)

2014 ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ලෝක තරුණ සම්මේලනයට අදාල රාජකාරි කටයුතු සඳහා කාර්ය පැවරුම් පදනම මත බඳවා ගෙන ඇති සංඛ චන්දිම අබේවර්ධන මහතා ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා කටයුතු සම්බන්ධව උපදේශකවරයකු ලෙස ඔහු වෙත පවරා ඇති කාර්ය භාරය තුල අන්තර්ජාතික තරුණ කටයුතු සම්බන්ධව සාකච්ඡා ,සම්මන්ත්‍රන හා වැඩමුළු සම්බන්ධිකරණය කිරිම ඒවා සංවිධානය කිරිම, රැස්වීම් වාර්තා වලට අදාලව පිළිතුරු සැපයිම හා රැස්වීම් සඳහා ලියවිලිකරණය, දෘෂ්‍ය මාධ්‍යය මගින් තොරතුරු ඉදිරිපත් කිරිම හා ජාත්‍යන්තර අවකාශය තුල අවස්ථා නියෝජනයන් ලබා ගැනිම වැනි දෑ අන්තර්ගත වේ. විදේශියන්හිදි මොහු විසින් කරනු ලබන මෙම කාර්යභාරය සඳහා දැරිමට සිදුවන වියදම් සඳහා මෙම ගෙවීම් සිදු කර ඇත.

මිලදී ගැනිම් සම්බන්ධව තොරතුරු ලබා නොදුන් පලාත් කාර්යාල 03, සබරගමුව පළාත් කාර්යාලය,බටහිර පළාත් කාර්යාලය සහ උතුරු පළාත් කාර්යාලය යන පළාත් කාර්යාල විසින් මේ වන විට අදාල තොරතුරු ලබාදිමට කටයුතු කර ඇත.

විගණක විමසුමේ සඳහන් ආකාරයේ වයිඑස්/ඩි/එන්වයිඑස්සි/2012/15 දරන හා 2013 පෙබරවාරි 06 දිනැති ලිපිය ක්‍රීඩා අංශය වෙත ලැබී නොමැති බවත් එවැනි ලිපියක් අංශය වෙත ලැබුනේ නම් ලිපි ගොනු භාරදිමට කටයුතු කරන බවත්, අංශය වෙත අදාල ලිපිය ලැබී අස්ථානගත විමක් සිදුවී ඇත්නම් ඉදිරියේදි එවැනි අපහසුතාවයන් ඇති නොවිමට වග බලා ගන්නා බව සඳහන් කරන අතර, අදාල ලිපි ගොනු විගණන අංශය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කර ඇත.

<table>
<tr><td>2.2.7</td><td>නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම</td><td></td></tr>
<tr><td>(අ)</td><td>පහත සදහන් අනුකූල නොවීම නිරික්ෂණය විය.<br><br>
<table>
<tr><td>නීති,රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට යොමුව</td><td>අනුකූල නොවීම</td></tr>
<tr><td><u>1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත</u><br><br>27 වැනි වගන්තිය</td><td>යොමුගත වගන්තිය ප්‍රකාරව සභාව සතු සියලු දේපල ස්වකිය අරමුණු වැඩි දියුණු කිරිම සදහා සභාව විසින් පාවිච්චි කරනු ලැබිය යුතු වුවත්,<br><br>1. බේරුවල තරුණ මධ්‍යස්ථානය ඉදි කිරිම වෙනුවෙන් 2000 ජුලි සිට බල පැවැත්වෙන පරිදි අවුරුදු 50 ක බදු කාල සිමාවකට නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.3,300,000 කට ලබා ගත් ඉඩමක් වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට වැය කර තිබුණු මුළු වියදම රු.3,398,200 ක් විය. මිලදී ගෙන අවුරුදු 13 ක් ගතවී තිබුණද, 2013 අප්‍රේල් වන විටත් එහි කිසිම සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.</td></tr>
</table>
</td><td>මෙම ඉඩම තරුණ සංවර්ධන ව්‍යාපෘතියකට යෙදිම සම්බන්ධයෙන් ගරු ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ මැදිහත්විම මත බේරුවල ප්‍රාදේශිය ලේකම් ඇතුලු නිලධාරින් සමග සාකච්ජා 2013.01.24 දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පවත්වන ලදි. ඒ අනුව ඉදිරි සංවර්ධන කටයුතු සදහා අවශ්‍ය මුලික පියවර වශයෙන් මෙම ඉඩමේ ජාත්‍යන්තර තරුණ නේවාසික මධ්‍යස්ථානයක් ඉදිකිරිම සදහා ව්‍යාපෘතියක් සකස් කර ඉදිරිපත් කර ඇති අතර, ඊට අදාල ප්‍රතිපාදන ලබාගැනිම සදහාද ක්‍රියාකරමින් පවතින බවත් ඒ අනුව ව්‍යාපෘති වාර්තාවේ පිටපතක් මේ සමග ඇමුණුම් අංක 02 වශයෙන් ඉදිරිපත් කරමි.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | | 2. ප්‍රදේශ 03 ක යොවුන් සරසවි ඉදි කිරිම සදහා මුලික පිඹුරුපත් සැකසිම වෙනුවෙන් 2007 වර්ෂය තුල දි රු.575,000 ක් ගෙවා තිබුණු නමුත් 2012 වර්ෂය අවසාන වන තුරුත් එම ඉදිකිරිම් ආරම්භ කිරිමට පියවර ගෙන නොතිබුණි. | 2007 වර්ෂයේදි යොවුන් සරසවිය වැඩසටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වු බැවින් පානදුර,මහරගම හා අනුරාධපුර යන ස්ථානයන්හි ක්‍රියාත්මක වු යොවුන් සරසවිය වැඩසටහන සදහා විශාල ශිෂ්‍ය සහභාගිත්වයක් තිබිණි. ඒ සදහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ස්ථාන නොමැති විම මත මෙම ස්ථානයන්හි ගොඩනැගිලි ඉදිකිරිමේ අවශ්‍යතාවය පැන නැගුනි. ඒ අනුව මුලික පිඹුරුපත් සැකසිමට විමසුමේ සදහන් පිරිවැය දරන ලදි. නමුත්, මේ වන විට උපාධි පාඨමාලාවන් බාහිරව ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් රජයේ සිමාකාරි ප්‍රතිපත්තිය හේතුවෙන් මෙම ගොඩනැගිලි ඉදිකිරිමේ අවශ්‍යතාවය පැන නොනැගි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනත<br><br>25 හා 26 වැනි වගන්ති | මුරුක්කන්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදි කිරිම සදහා මුදල් සම්මාදමේ යෙදි රු.1,671,900 ක් 2009 සැප්තැම්බර් වන විට එකතු කල නමුත් එම සම්මාදම සදහා රු.732,918 ක් සභාව විසින් වැය කර තිබුණි. මෙම මුදල් බැංකු ගිණුමක තැන්පත් කර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.2,631,487 ක් විය. අදාල දුම්රිය ස්ථානය ඉදි කිරිම 2013 අප්‍රේල් වන විටත් ඉටු කර නොතිබුණි. | මුරුක්කණ්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදිකිරිම ජාතික තරුණ දිනයේ උප වැඩසටහනක් ලෙස 2009.05.23 වන දින ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩසටහන දිවයින පුරා පා ගමන් මගින් අඩියර 02 කින් ආධාර මුදල් එකතු කිරිමෙන් රුපියල් 1,617,900 ක මුදලක් රැස්කර ගන්නා ලද අතර, ඊට අමතරව ස්ටිකර් අලෙවිය හා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ වාර්ෂික අරමුදල් සතිය වැඩසටහනෙන් ලබාදුන් මුදලත් සමග මුලු මුදල රු.2,436,721 ක් මහරගම මහජන බැංකුවේ ගිණුම් අංක 306200240004560 ගිණුමේ තැන්පත් කර ඇති අතර 2012.12.31 වන දිනට ශේෂය රු.2,631,487.36 කි. මෙම දුම්රිය ස්ථානය ඉදිකිරිම සදහා දුම්රිය දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇති අතර, දුම්රිය මාර්ගයේ අලුත්වැඩියා කටයුතු මුරුක්කණ්ඩි දක්වා සිදු කර නොමැති බවත් අදාල ඉදිකිරිම් කටයුතු මෙම දුම්රිය මාර්ගයේ ආරම්භ කිරිමෙන් පසු මෙම දුම්රිය ස්ථානයේ නව ඉදි කිරිම් කිරිම සදහා කටයුතු කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | අංක සිඑස්ඒ/පි1/40 හා 2007 පෙබරවාරි 28 දිනැති ජනාධිපති ලේකම් චකුලේඛය | ටුවර් ඩි ශ්‍රී ලංකා යුත් පාපැදි සවාරියේ මාධ්‍ය සාකච්ඡාව රු.119,850 ක් වැය කර හෝටලයක පවත්වා තිබුණි. | විගණක විමසුමේ සදහන් ආකාරයට 2012.03.24 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ මාධ්‍ය සාකච්ඡාවක් නොපැවැත්වු බවත් 2012 වර්ෂයේ ටුවර්ඩි ශ්‍රී ලංකා යුත් පාපැදි සවාරිය නොපවත්වන ලද බවත් සදහන් කරමි. එහෙත් 2011 වර්ෂයේදි මෙම පාපැදි තරගය පවත්වන ලද බවත් ඊට අදාල පුවත්පත් සාකච්ඡාව සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදි පවත්වන ලදි. මෙම සාකච්ඡාව සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවැත්විම සදහා පහත කරුණු හේතුවිය.<br><br>01. ශ්‍රී ලංකා යුත් සංකල්පය යටතේ ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ යෞවන කටයුතු හා නිපුණතා |

| | | | |
|---|---|---|---|
| | | | සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කර අලුතින් රටට හඳුන්වා දුන් වැඩසටහන් බැවින් ඒ සඳහා මාධ්‍ය ක්ෂේත්‍රයේත්, ශ්‍රී ලාංකේය ක්‍රීඩාලෝලීන්ගේ,සමස්ථ තාරුණ්‍යයේ හා පොදු ජනතාවගේ ආකර්ෂණය ඒ සඳහා ඇද ගැනීමට හැකි පරිදි එම මාධ්‍ය හමුව පැවැත්වීමට කටයුතු කල බැවිනි.<br><br>02. මෙම මාධ්‍ය හමුව සඳහා පහත සඳහන් හා විදේශ නියෝජිතයන් සහභාගී විය.<br>➢ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන ගරු අමාත්‍යතුමා<br>➢ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අධික්ෂණ මන්ත්‍රීතුමා<br>➢ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා<br>➢ ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා<br>➢ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය<br>➢ ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ අතුරු කමිටු නිලධාරි<br>➢ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ නිලධාරි<br>➢ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදින්<br><br>ඒ අනුව ගරු අමාත්‍යවරයා ඇතුළු සම්භාවනීය පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වීමේදී ගැලපෙන ස්ථානයක් තෝරා ගැනිමේ වගකීමක් මතුවන හෙයින් හා උත්කර්ශවත් අයුරින් පැවැත්වීම සඳහා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය තෝරා ගන්නා ලදි. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br><br>(i)<br>1.3.2 මාර්ගෝපදේශය | අවස්ථා 05 කදී මිළ කැදවීම් සිදු නොකර එකතුව රු.684,295 ක මිපදී ගැනිම් සිදුකර තිබුණි | ජාතික යෞවන ක්‍රීඩා උළෙල උත්කර්ෂවත් අන්දමින් අනෙක් ක්‍රීඩා උළෙලවල් වලට නොදෙවනි අයුරින් තාරුණ්‍යයයේ ක්‍රීඩා උළෙල පැවැත්වීමට කටයුතු කිරිම අරමුණ ඇතිව තාරුණ්‍යයේ නිරන්තරව වෙනස් වීම් වලට රුචියක් දක්වන හෙයින් ඔවුන් වෙනුවෙන් වැඩසටහන් නිර්මාණය කිරිමේදි මනසට කාවදින ලෙස සිත් ඇදබැද ගන්නා අයුරින් උළෙල පැවැත්වීමට කටයුතු කිරිම හේතුවෙන් මේ ආකාරයට වියදම් දරන ලද අතර, ඒ අනුව සියළුම මිලදී ගැනිම් අවස්ථානුකූලව හා ක්ෂණිකව සිදුවු හෙයින් මෙම තත්වය ඇති වුවත් අදාල ගනුදෙනු වලදී මූල්‍ය අක්‍රමිකතාවයන් සිදුවි නොමැත. |

| | | | |
|---|---|---|---|
| | (ii)<br>3.9.1<br>මාර්ගෝපදේශය | ඇස්තමේන්තු වටිනාකමක රු.13,117,919 ක කොන්ත්‍රාත්තු 08 ක් සදහා ප්‍රජා සමිති 03 ක් තෝරා ගෙන තිබුනත්, ඒ සදහා සභාවේ සභාපතිවරයාගේ නියෝජනයක් සහ අදාල ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම්වරයා විසින් නම් කරනු ලැබූ නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විසින් සිදු කර නොතිබුණි. | වොලිබෝල් ක්‍රිඩා පිටි සැකසිමේ ව්‍යාපෘතිය සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදිමේදි එම සමිතිය ලියාපදිංචි සමුපකාර සමිතියක් වන බැවින් හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ බලතල ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹිමේ හැකියාව ඇති බැවින් එම බලතල ප්‍රකාරව හා සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමාගේ NCP/ACCD/03/55 හා 2012.01.12 දිනැති ලිපිය අනුව අදාල කොන්ත්‍රාත් 16 ප්‍රදානය කර ඇත.<br>ඉන් අනතුරුව සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය විසින් මෙම කොන්ත්‍රාත් එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් පරිදි උප කොන්ත්‍රාත්කරුවන් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් වලට අනුව අදාල කොන්ත්‍රාත්තු පිරිනමා ඇත.<br>මෙම කොන්ත්‍රාත් පිරිනැමිමට පෙර නිස්කෝ සමුපකාර සමිතියේ කමිටු නියෝජනයන් මගින් කොන්ත්‍රාත්කරුවන්ගේ සුදුසුකම් ලියාපදිංචියන් ,පලපුරුද්ද පිලිබදව සලකා බැලිම් සිදුකර ඇත. |
| | (iii)<br>5.4.11<br>මාර්ගෝපදේශය | ඉදිකිරීම් 11 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු වෙත එකතු කල අගය මත බදු සදහා ඉන්වොයිස් පත් ලබාගැනීමකින් තොරව එකතු කල අගය මත බදු ලෙස රු.12,508,737 ක් ගෙවා තිබුණි. | ඉදිකිරිම් 12 ක් සදහා වැට් ලියාපදිංචි සහතික අදාල ගොනු වල වෙන වෙනම අමුණා ඇති අතර එම සහතික විගණන සඳහා ඉදිරිපත් කිරිමට කටයුතු කර ඇත. |
| | (iv)<br>5.4.12<br>මාර්ගෝපදේශය | ඉදිකිරිම් 12 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් 07 දෙනෙකු වෙත ගෙවූ රු.13,754,957 ක වැට් බදු පිලිබද විස්තර විගනකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දි නොතිබුනි. | 2013 වර්ෂයේ සිට ඉදිකිරීම් කොන්ත්‍රාත් සදහා ගෙවන ලද වැට් මුදල් ගෙවීම් පිළිබද විස්තර යැවීමට කටයුතු කර ඇති අතර 2013.05.30 දිනට අදාල විස්තර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| | | | දැනට ක්‍රියාකර ඇත්තේ පිඊඩි/50 චක්‍රලේඛය අනුව වන අතර, විගණන හා |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br><br>2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව නිලධාරීන් තිදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ දී රු.731,475 ක අතිරේක ඉන්ධන ලබාදී තිබුණි. | කළමණාකරන කමිටු ඉදිරි නිරීක්ෂණයන් අනුව අදාල ලේඛණ සකස් කිරීමේ හැකියාව ඇත. |
| (ඊ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | |
| | (i)<br>2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 8.3.8 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ටුවර්ඩ් ශ්‍රී ලංකා යූත් පාපැදි සවාරියේ ජයගහකයාට රු.1.315,000 ක් වැයකර මෝටර් රථයක් පදානය කර තිබුණි | ප්‍රථම ත්‍යාගය ලෙස ලබාදීමට අදහස් කරන ලද මෝටර් රථය සඳහා මිලියන 01 ක මුදලක් අපේක්ෂා කලද, ඩේවිඩ් පීරිස් ඔටෝ මොබයිල් ආයතනයේ අදාල මෝටර් රථය ලබාදීමේදි එහි වටිනාකම මිලියන ඉක්මවා තිබුණි. එම හේතුවෙන් මෙම තත්වය ඇති වු අතර ඉදිරියේදි මෙවැනි වටිනාකම් සහිත ත්‍යාගයන් ප්‍රදානයේදි ඒ සඳහා වන චක්‍රලේඛ අනුමැතියන් ලබා ගැනිම සඳහා කටයුතු කිරිමට අපේක්ෂා කෙරේ. |
| | (ii)<br>2008 ජුලි 28 දිනැති අංක පීඊඩී 50 දරන චක්‍රලේඛය | නිලධාරීන් සිව් දෙනෙකුට 2011 හා 2012 වර්ෂ වලදී එකතුව රු.355,720 ක්වූ ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණි. | විමසුමේ සදහන් කර ඇති ඉන්ධන දිමනා පරිහරණය කරන ලද නිලධාරින් සැලකිමේදි එම නිලධාරින් දිවයින පුරා ක්‍රියාත්ම වන සංවර්ධන වැඩසටහන් හා කාර්යාල පරිපාලන කටයුතු තරුණ වැඩසටහන් අධීක්ෂණය කිරිම සම්බන්ධිකරණය කිරිම හා නිරික්ෂණය කිරිම යනාදි කටයුතු වල නිරත වන අතර, විෂයභාර අධ්‍යක්ෂකවරුගේ රාජකාරි පරාසයට අයත් වන අතර, ගරු අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ නියෝජනයන් අත්‍යවශ්‍ය වන අවස්ථාවන් වලදි එතුමා වෙනුවෙන් නියෝජනයන්ද අවස්ථානුකූලව මෙම නිලධාරින් විසින් සිදු කරනු ලබයි.<br><br>විගණක විමසුමේ පෙන්නුම් කිරිම් අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 ඡේද අංක 09 අනුව පෙන්වා දි ඇති පරිදි ඊට සමගාමිව නිකුත් වු රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/50 ඡේද අංක 01 ඡේදය අනුව අප විසින් කටයුතු කර ඇත. ඒ අනුව විමසුමේ පෙන්වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 09 ඡේදයේ සදහන් ආකාරයට 2008 වර්ෂයේ සිට අදාල නිලධාරින්ට ලබාදි ඇත්තේ PED/50 දිමනාවට අනුවය.<br>මේ සමග 2003 සිට ගෙවා ඇති ඉන්ධන දිමනා ගෙවිම් වගුව හා සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අංක ඊවි/රා.ප.ච.ලේ/2001 හා 2008.10.16 |

ලිපිය අනුව ලබාදී ඇති හා ලබාගත හැකියැයි විමසුමේ පෙන්වන දිමනා අතර, වෙනසක් පවති.

| PED/50 පෙන්වන තනතුර | සභාවේ තනතුර | ගෙවා ඇති මුදල රු. | විමසුමේ මුදල |
|---|---|---|---|
| සභාපති | සභාපති | 14,000 ඩීසල් | - |
| විධායක අධ්‍යක්ෂ/<br>විධායක නිලධාරි | අධ්‍යක්ෂ<br>- | 18,000 පෙට්‍රල්<br>12,000 ඩීසල් | 15,000<br>10,000 |
| නියෝජ්‍ය සමාන්‍යාධිකාරි | ප්‍රධාන ගණකාධිකාරි<br>- | 15,000පෙට්‍රල්<br>10,000 ඩීසල් | -<br>- |
| වෙනත් | - | 12,500 පෙට්‍රල්<br>8,000 ඩීසල් | -<br>- |

මේ අනුව විමසුමේ අධ්‍යක්ෂකවරුන් සඳහා ගෙවිය යුතු මුදල ලෙස පෙන්වන්නේ නියෝජ්‍ය මට්ටමේ තනතුරු සඳහා පෙට්‍රල් රු.18,000/- ක්ද,ඩීසල් රු.12,000/- ක්ද වශයෙන් විය යුතු බවය. 2003 වර්ෂයේ සිට ඉන්ධන දිමනා ලබා දිමේදි එම පදනම හා වර්ගීකරණය අනුව එය සිදුකර ඇත.
ඉහත කරුණු මත පිඊඩී/50 අනුව ගෙවීම් සිදුකිරිම සිදුවිය යුතු වන්නේ නම් විමසුමේ සඳහන් වැඩිපුර ගෙවීම් ප්‍රමාණයන් පෙන්වන ප්‍රමාණයන්ට වඩා අඩුවිය යුතුය.
සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ඉහත සඳහන් 2008.10.16 දිනැති ලිපියෙන් පසුව ගෙවීම් කිරිමේ පදනම ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ගේ පිඊඩී/39 හා පිඊඩී/50 අනුව පිහිටුවා ඇති තනතුරු වල අනුපිලිවෙලට ඉන්ධන ලබා දි ඇත. මේ ආකාරයට ගෙවීම් කිරිමේදි පාදක කරගත් කරුණු වන්නේ,
(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 හා 09 ජේදය පරිදි රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පිඊඩී/50 නිකුත් විමක් සිදුවි ඇති බැවින් ඒ අනුව ගෙවීම් ගණනය කිරිම.

(ආ) ඉන් පසුව නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා 13/2008 මගින්

| | | | |
|---|---|---|---|
| | | | පීඊඩී/50 අවලංගු නොකිරීම හා ඒ වෙනුවට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන් නිකුත් නොවීම<br>සමග<br><br>(ඇ) ආරම්භයේ පටන් ඉන්ධන දීමනා ගෙවීම් සඳහා චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඉන්ධන ලීටර් ප්‍රමාණය හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ හා සමගාමීව පැවතීම හා රාජ්‍ය සංස්ථා වෙත නිකුත් වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් අනුව ලීටර් ප්‍රමාණයට අනුව ගලපා ඉන්ධන දීමනා ලබාදීම වඩාත් නිවැරදි ලෙස තීරණය කිරීම පෙන්නුම් කල හැකිය.<br><br>සභාව විසින් වාර්ෂික අයවැය සකස් කිරීමේදි එක් එක් වැඩසටහනට අදාලව ප්‍රචාරන වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර, සමස්ථ ප්‍රචාරන වියදම් සඳහා ප්‍රචාරන වැඩසටහනක් සකස් කිරීම මෙතෙක් සිදු කර නොමැති අතර ඉදිරි මුදල් වර්ෂයේ සිට මෙම නෛතික අවශ්‍යතාවය අනුකූලව පියවර ගැනීමට සැලසුම් කර ඇත. |
| | (iii) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ප්‍රචාරනය සඳහා එකතුව රු.25,477,253 ක් වැයකර තිබුනත්, ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එමෙන්ම සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අයවැයගත ප්‍රචාරන වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | |

SRI LANKA Youth

<table>
<tr><td>03.</td><td>මුල්‍ය සමාලෝචනය</td><td></td></tr>
<tr><td>03.1</td><td><u>මුල්‍ය ප්‍රතිඵල</u><br>සමාලෝචිත වර්ෂය තුල සභාවේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵල රු.මිලියන 73.71 ක ඌනතාවය රු.මිලියන 48.75 ක් විය. ආදායම හා අභ්‍යන්තර ඉපයීම් රු.මිලියන 122.46 කින් වැඩි වී තිබුණද, මෙහෙයුම් හා තරුණ සංවර්ධන වියදම් රු.මිලියන 147.42 කින් වැඩිවී තිබීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.මිලියන 24.96 කින් වර්ධනය වීමට විශේෂයෙන් බලපා තිබුණි.</td><td>ආදායම් රු.මිලියන 122.46 කින් වැඩිවී තිබුණද ඌණතාවය මිලියන24.96 කින් වැඩිවීම.<br><br>සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.මිලියන 24.96 කින් වැඩිවීම සඳහා ඉවහල් වී ඇත්තේ විගණන වාර්තාවේ පෙන්වන පරිදි මෙහෙයුම් හා තරුණ සංවර්ධන වියදම් වල පෙර වර්ෂයට වඩා වූ වර්ධනයයි. එහි සංයුතිය පහත පරිදි වේ.<br><br>
<table>
<tr><td></td><td colspan="3">රු.මිලියන</td></tr>
<tr><td></td><td>2012</td><td>2011</td><td>වෙනස</td></tr>
<tr><td>මෙහෙයුම් වැය</td><td>707</td><td>653</td><td>54</td></tr>
<tr><td>තරුණ සංවර්ධන වැය</td><td>551</td><td>458</td><td>93</td></tr>
<tr><td>එකතුව</td><td>1,258</td><td>1,111</td><td>147</td></tr>
<tr><td>ක්ෂය</td><td>72</td><td>46</td><td>26</td></tr>
</table>
<br>මෙම මෙහෙයුම් වැය වැඩිවීමෙන් මිලියන 26 ක් වත්කම් ක්ෂය වන අතර මිලියන 23 ක් පාරිතෝෂිත වෙන් කිරීම් වේ.</td></tr>
<tr><td>03.2</td><td>සභාවට එරෙහිව හා සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කියාමාර්ග</td><td></td></tr>
<tr><td></td><td>ජාතික තරුණ සේවා සභාව පාර්ශවකරුවකු වී තිබුණු හා මේ වන තුරුත් සමථයට පත් නොවූ නඩු ප්‍රමාණය 35 ක් විය. ඉන් නඩු 22 ක් සඳහා සභාව විත්ති පාර්ශවය ලෙසත් ,නඩු 13 ක් පැමිණිලි පාර්ශවය ලෙසත් විය. ලද තොරතුරුවලට අනුව, සභාව විත්ති පාර්ශවය ලෙස පෙනී සිටින එක් නඩුවක පමණක් මුල්‍ය වටිනාකම රු.1,600,000 ක් විය.</td><td>දිසා අධිකරණය මාතලේ පැවැත්වෙන නඩු අංක MR/7839 දරණ නඩුව 2005.06.10 දින පවරා ඇති අතර, මේ වන විට මෙම නඩුව විභාග වෙමින් පවතී. අවසන් වරට නඩු වාරය 2013.04.24 දින පැවැත්වූ අතර, මීලග නඩු දිනය 2013.05.09 දිනට යොදා ඇත. එම නඩුවේ මුල්‍ය වටිනාකම රු.1,600,000 වේ.</td></tr>
<tr><td>04.</td><td>මෙහෙයුම් සමාලෝචනය</td><td></td></tr>
<tr><td>04.1</td><td>කාර්ය සාධනය</td><td></td></tr>
<tr><td>(අ)</td><td>රේඛිය අමාත්‍යාංශයට ඉදිරිපත් කල ප්‍රගති වාර්තාව හා සභාවේ වාර්ෂික ක්‍රියාකාරි සැලසුමට අනුව,වර්ෂය තුල ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතව තිබුණු නමුත් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණු, රු.මිලියන 16.25 ක</td><td>ක්‍රීඩා,සංස්කෘතික,යොවුන් පාර්ලිමේන්තු,දැයට කිරුළ වැනි වැඩසටහන් වල අත්‍යවශයෙන්ම එම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් අනෙකුත් වැඩසටහන් වලට</td></tr>
</table>

| | | |
|---|---|---|
| | ව්‍යාපෘති 11 ක්ද ඇතුළුව ව්‍යාපෘති 34 ක අනුමත ප්‍රතිපාදන වලින් රු.මිලියන 144.79 ක් ඉතිරිව තිබුණි. ව්‍යාපෘති 22 ක ප්‍රතිපාදන ඉක්මවීම රු.මිලියන 102.11 ක් විය. තවද වාර්ෂික ක්‍රියාකාරි සැලසුමට ඇතුලත් නොවූ වැඩසටහන් 13 ක් පවත්වා ඊට රු.මිලියන 58.78 ක් වැය කර තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කරගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් විමසුමේ පෙන්වන ඉතිරි ප්‍රතිපාදන සහ ඉක්මවා වැය දරන ලද ප්‍රතිපාදන පිලිබඳ තත්වයක් උත්ගතවි ඇත. සමස්තයක් වශයෙන් ව්‍යාපෘති සඳහා අනුමත මුළු ප්‍රතිපාදනය ඉක්මවා වැය දැරීමක් සිදු වි නොමැත. |
| (ආ) | යෞවන සමාජ ව්‍යවස්ථාවට අනුව එක් ග්‍රාමසේවා වසමකට එක් යෞවන සමාජය බැගින් පිහිටුවිය යුතු නමුත් දිවයිනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 334 ක් තුල ව්‍යාප්ත ග්‍රාමසේවා වසම් 14013 කට සාපේක්ෂව පිහිටුවා තිබුණු යෞවන සමාජ ගණන 11801 කි. | 2012 වසර තුල යෞවන සමාජ පිහිටුවිම සඳහා ක්‍රියාත්මක කරන ලද Y2012 වැඩසටහන යටතේ යෞවන සමාජ පිහිටුවිම සඳහා ලබා දි තිබු ඉලක්කයෙන් 84% ක ඉලක්කයක් ලගාකර ගෙන තිබු අතර එය පසුගිය වසරට වඩා 6% ක වැඩිවිමක් සිදු වි ඇති බව නිරික්ෂණය වේ. තවද යෞවන සමාජ සමාජිකයින් සඳහා ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා යූත් පාර්ලිමේන්තු වැඩසටහන හා ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ජාත්‍යන්තර තලයට ගෙන යාම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා දැඩි නැඹුරුතාවයක් ඇති හෙයින් ඉදිරි වර්ෂයේදි මීට වඩා යෞවන සමාජ ඉලක්කයන් සපුරා ගැනිමේ හැකියාවක් පවතින බව නිරික්ෂණය වේ. |

| | |
|---|---|
| (ඇ) | පුහුණු මධ්‍යස්ථාන 10 ක් නියැදියක් ලෙස ගෙන කල පරික්ෂාවට අනුව, ඒ ඒ පුහුනු මධ්‍යස්ථාන වල වාර්ෂික ඒක ශිෂ්‍ය පිරිවැය රු.6,089 සිට රු.51,203 දක්වා වූ පරාසයක පැවතිණි. |

| කාරණය | පිළිතුර |
|---|---|
| අවසාන ගිණුම අනුව පොදු කාර්ය වැය | මධ්‍යස්ථාන ආශ්‍රිතව පාඨමාලා ක්‍රියාත්මක කිරිමේදි මධ්‍යස්ථාන වල ජලය,විදුලිය,දුරකථන හා අන්තර්ජාල වියදම්,තැපැල් හා ලිපිද්‍රව්‍ය හා සනිපාරක්ෂක කටයුතු යනාදිය වෙනුවෙන් දැරිමට සිදුවන පිරිවැය මේ යටතට ගැනේ. මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සහ පහසුකම් වෙනුවෙන් දැරිමට සිදුවන මෙම පිරිවැය අනිවාර්යයෙන්ම දැරිමට සිදුවන්නකි. |
| වාර්ෂික වැටුප | අදාල වැයදැරිම් තුල ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ගෙවන වැටුප්ද ඇතුලත් වන අතර එක් එක් මධ්‍යස්ථාන වලට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය එම මධ්‍යස්ථානයේ කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් සේවා අවශ්‍යතා මත අනුයුක්ත කර ඇති හෙයින් කාර්ය මණ්ඩල පිරිවැයද මධ්‍යස්ථානයේ සිසුන් සංඛ්‍යාව අනුව අන්තර්ග්‍රහණය කිරිම මත විමසුමේ සදහන් ඒකක ශිෂ්‍ය පිරිවැයේ විචලනයන් සිදුවන බව . |
| වර්ෂය තුල පුහුණුව නිම කල සිසුන් සංඛ්‍යාව | අදාල මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක පාඨමාලා සදහා සිසුන් සහභාගි වනුයේ මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක පාඨමාලා වල ස්වභාවය මෙන්ම මධ්‍යස්ථානයේ පිහිටිම පවතින සම්පත් ප්‍රමාණය මෙන්ම පාඨමාලා සදහා බදවා ගත හැකි සිසුන් ප්‍රමාණය සීමාවිම ආදි හේතු මතය තවද පාඨමාලා .NVQ තත්වයට පත්විමේදි එක් පාඨමාලාවකට බදවාගත හැකි උපරිම සිසුන් සීමාව 20-25 ත් අතර වේ. ඒ අනුව නියදියට තෝරාගත් මධ්‍යස්ථාන අතරින් කිහිපයක හැර ශිෂ්‍ය සහභාගිත්වය අවම තත්වයක පැවතුනත් සමස්ථ ශිෂ්‍ය සහභාගිත්වය ඉතා ඉහල අගයක පැවතුණි. |
| වාර්ෂික ඒක ශිෂ්‍ය පිරිවැය | ඉහත කරුණු සියල්ල සලකා බැලිමේදි මධ්‍යස්ථාන කිහිපයක ශිෂ්‍ය සහභාගිත්වයට සාපේක්ෂව එක් අයෙකු වෙනුවෙන් වැය දැරිම සමස්ථ වියදම අනුව ඉහළ අගයක් ගෙන ඇති බව පැහැදිලි වේ. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා යුත් කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා ඒකකය සංවර්ධනය කිරිම සඳහා 2012 වර්ෂය තුල රු.11,008,223 ක් වැය කර තිබුණු නමුත් 2012 හා 2013 මාර්තු දක්වා පුහුනුව ලද සංඛ්‍යාව පිලිවෙලින් 50 ක් හා 69 දෙනෙකු විය. එමෙන්ම ජාතික තරුණ මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන සියලුම ක්‍රිඩාවල සාමාජිකත්වය දරන ක්‍රිඩක ක්‍රිඩිකාවන්ට සතියකට දිනයක් බැගින් ශාරීරික සුවතාව හා ශාරීරික යෝග්‍යතාව වර්ධනය කර ගැනිමට අවකාශ ලබාදිම හා ශ්‍රී ලංකා යුත් කායවර්ධන කණ්ඩායමක් බිහි කිරිම යන අරමුනු ඉටුවි නොතිබුණි. | ශ්‍රී ලංකා යුත් නව කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා ඒකකය ගරු අමාත්‍යතුමාගේ අතින් 2012.11.31 වන දින තාරුණ්‍යයේ අයිතියට පැවරු අතර මාස 04 ක කාලය(2012.12.01 දින සිට 2013 මාර්තු දක්වා) සාමාජිකයින් 69 දෙනෙකු සාමාජික කරවා පුහුණුව සඳහා අවස්ථාව ලබාදි ඇත. 2013 මැයි වන විට එම සාමාජික සංඛ්‍යාව 97 දෙනෙකු දක්වා ඉහළ නංවා ඇති බවත් ශ්‍රී ලංකා යුත් නෙට්බෝල් සංචිතයේ ක්‍රිඩිකාවන්,ශ්‍රී ලංකා යුත් ජුඩෝ සංචිතයේ ක්‍රිඩක ක්‍රිඩිකාවන්, ශ්‍රී ලංකා යුත් නර්තන කණ්ඩායම හා ජාතික තරුණ සේවා සභාවේ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ, සී/ස තරුණ සේවා සමාගම, නිස්කෝ සමුපකාර සමිතිය යනාදියෙහි ප්‍රතිලාභීන් සඳහාද පුහුණු අවස්ථා ලබාදි ඇත.<br><br>2012 වර්ෂය තුලදි විමසුමේ සඳහන් වැය දැරු බවත් එම ඒකකය 2012 නොවැම්බර් 31 වන දින විවෘත කරන ලද අතර මාසයක පමන කාලයක් තුල සාමාජිකයින් 19 දෙනෙකු බදවා ගෙන ඇති අතර 2013 වර්ෂය තුලදි මේ වන විට සාමාජිකත්වය 114 ක් දෙනෙකුද කාර්ය මණ්ඩල සාමාජිකයින් 12 දෙනෙකුගෙන්ද සමන්විත වේ. |
| 04.2 | මෙහෙයුම් අකාර්යක්ෂමතා | |
| (අ) | 2012 ජුනි 12 දින සිට ජුනි 23 දින දක්වා බ්‍රසීලයේ පැවති තිරසාර සංවර්ධන පිලිබඳ එක්සත් ජාතින්ගේ සම්මේලනයට (Rio + 20) ජාතික තරුණ සේවා සභාව විසින් 12 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක සහභාගිත්වයක් ලබාදි ඒ වෙනුවෙන් රු.11,389,540 ක් වැය කර තිබුණි. | |
| | i. ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ලබා නොගෙන,නේවාසික පහසුකම් සලසා ගැනිම වෙනුවෙන් රු.2,430,583 ක් විදේශිය පුද්ගලයින් දෙදෙනෙකු වෙත ගෙවා තිබුණු අතර එම වියදම් තහවුරු කිරිම සඳහා බිල්පත් මු.රෙ.264 පරිදි ගෙවිම් වවුචරය සමග ඉදිරිපත් කර නොතිබුණි. | RIO+20 යනු තිරසාර සංවර්ධනය පිලිබද එක්සත් ජාතින් විසින් සංවිධානය කරනු ලැබු විශේෂ රැස්විමකි. විශේෂයෙන් 2014 වසරේ ලෝක තරුණ සමුළුව හරහා සහශ්‍ර සංවර්ධන දර්ශක කෙතරම් දුරට ග්‍රහයන කර ඇද්ද යන්න විමසා බලන අවස්ථාවක හා එම සමුළුව සඳහා යන ගමනේ හමුවන වැදගත්ම රාජ්‍යතාන්ත්‍රික සමුළුව ලෙසද මෙම රැස්විම අතිශය වැදගත් වනු ඇත. මෙම වැඩමුළු සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මුලිකත්වයෙන් හා විදේශ අමාත්‍යවරයා ඇතුළු අමාත්‍යවරු 06 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉහළ පෙලේ රාජ්‍යතාන්ත්‍රික කණ්ඩායමක් ලංකාව නියෝජනය කරමින් සහභාගි විය. එහිදි ලංකාවේ තරුණ ප්‍රජාව නියෝජනය කරමින් යෞවන සමාජ සම්මේලනය සිවිල් සංවිධාන නියෝජනය කරමින් තවත් තරුණ තරුණියන්ද සහභාගිවු අතර, නිලධාරින්ද සහභාගි විය. මෙම සමුළුවට සහභාගි විමට පෙර ජාතික තරුණ සේවා සභාව විසින් එක්සත් ජාතින්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය හා එක්ව COLOMBO 20+ යනුවෙන් ජාතික වැඩසටහනක් දියත් කල අතර පරිසර අමාත්‍යංශය සමග එක්ව ලාංකේය තාරුණ්‍යයන්ගේ අදහස් ඇතුලත් නිර්දේශ මාලාවක්ද ප්‍රකාශයට පත් කරන ලදි. මෙම වැඩසටහන සඳහා |

<table>
<tr>
<td></td>
<td></td>
<td>ශ්‍රී ලංකාව වෙනුවෙන් ලෝක තරුණ සමුළුවට උපදේශක රවිකර්කාර මහතා, UNDESA හි නියෝජිත නිකෝලෝයි ශෙපර්ඩ් මහත්මිය සහ ජාතික තරුණ මහ ලේකම් කාර්යාලයේ ජාතික ලේකම් ශෙවරින් කාර්මෙන් මැකාඩෝ මහත්මියටද ආරාධනා කර තිබිණි. මෙම වැඩසටහන බ්‍රසීලයට රාජ්‍ය නායකයින් 78 දෙනෙකු පැමිණි අතර මෙම සමුළුවේ වැදගත් කමක්, සහභාගි වන වැදගත් පිරිසක් නිසා එම රටේ හෝටල් ගාස්තු අතිශයින් ඉහල දමා තිබුණි. මෙම වැඩසටහනට සහභාගි විම අත්‍යවශ්‍ය බැවින් බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ MINISTER කවුන්සල හරහා නේවාසික පහසුකම් සඳහා ස්ථාන සොයා ගැනිමට කටයුතු කරන ලදි. ව්‍යාපාරික වශයෙන් කුලී පදනම මත හෝටල් ලබා ගැනිමේදී ඉහල හෝටල් ගාස්තුවක් ගෙවිමට සිදුවු බැවින් සාධාරණ අවම මිලකට නේවාසික පහසුකම් ලබා ගැනිමට කටයුතු කරන ලදි.<br>මෙම නේවාසික පහසුකම් වලට අදාල ගෙවන ලද බිල්පත් විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.</td>
</tr>
<tr>
<td></td>
<td>ii. සමුළුවට සහභාගි වු නිලධාරින් දෙදෙනෙකු වෙනුවෙන් නවාතැන් හා යැපිම් ලෙස රු.938,312 ක් ගෙවා සභාවේ වියදමින් නවාතැන් පහසුකම් ද සලසා දි තිබුණු බැවින් නවාතැන් පහසුකම් වෙනුවෙන් සභාව දරන ලද වියදම මෙරටට පැමිණි පසු පියවිමට ඔවුන් එකග වි තිබුණි. කෙසේ නමුත් ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණ මාස 08 ක් ගතවි ඇතත්,නවාතැන් දිමනා ලෙස සභාව ලබාදුන් රු.410,808 ක් ආපසු අයකර නොතිබුණි.</td>
<td>
<table>
<tr><th></th><th>කාමර ගණන</th><th>කාමරයක සිටිය හැකි උපරිම ගණන</th><th>නේවාසිකව සිටි ගණන</th></tr>
<tr><td>Apartment 01</td><td>03</td><td>06</td><td rowspan="3">13</td></tr>
<tr><td>Apartment 02</td><td>02</td><td>02</td></tr>
<tr><td>Apartment 03</td><td>04</td><td>05</td></tr>
</table>
නේවාසික පහසුකම් සැපයිමේදී රවි කර්කාර් මහතාට,නිකොලයි ශෙපර්ඩ් මහත්මියට හා ශෙවරින් කාමෙන් මැකාඩෝ යන UN නියෝජිතයින්ට කාමර 03 ක් ලබා දිමට සිදුවු බැවින් 13 න් දෙනෙකුට වෙන් කරන ලද කාමර ප්‍රමාණය 10 දෙනෙකුට සිමා විය.(තනි කාමර වශයෙන් අවශ්‍ය බව දන්වා ඇති නිසා)<br>එබැවින් සමුළුවට සහභාගි වු ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ නිලධාරින් දෙදෙනෙකු ඔවුන් වෙත ලබාදුන් ඇමෙරිකානු ඩොලර් 129 පාවිච්චි කිරිමෙදි නියමිත ප්‍රදේශයෙන් දුර බැහැර ස්ථාන දෙකක නේවාසික වි ඇත. එසේ වු හෙයින් ඉහත සඳහන් මුදල ඉතිරි නොවු බව සඳහන් කරමි.
</td>
</tr>
<tr>
<td></td>
<td>iii. සම්මේලනයට සහභාගි වන නිලධාරින් හා නියෝජිතයන් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනිමේ දි නියෝජිතයන් තිදෙනෙකුගේ වියදම් ශ්‍රී ලංකා රජයෙන් වැය නොකරන බවට දන්වා තිබුණ නමුත් ඔවුන් වෙනුවෙන් රු.818,208 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.</td>
<td>මෙම වැඩසටහන සඳහා ජාතික තරුණ සේවා සභාව නියෝජනය කරමින් වේදනි විජේනායක මෙනෙවිය සහභාගි නොවිය. එබැවින් ඇය වෙනුවෙන් කිසිදු මුදලක් වියදම් කර නැත. සහභාගි වු තරුණ තරුණියන් වෙනුවෙන් ගෙවිම් කිරිමේදි ඒ වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය යටතේ සකස් කර ඇති ව්‍යාපෘති වාර්තාවේ පවා වේදනි විජේනායක නැමැති අයගේ නම සඳහන් වි නොමැත.</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| (ආ) | ඉදිරිපත් වූ තොරතුරු අනුව කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රිඩාංගනයේ දී 2012 නොවැම්බර් 22 දින සිට 25 දින දක්වා පැවති 24 වැනි ජාතික යෞවන ක්‍රිඩා උළෙල හා කොට්ඨාශ, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් පැවති මූලික තරගාවලි සඳහා රු.56,232,555 ක් වැය කර තිබුණි.<br>පහත කරුණු අනාවරණය විය. | |
| | i. එක් දිනකට රු.484,000 ක් වන පරිදි දින 04 ක් සඳහා ක්‍රිඩාංගනය ජෙට් බල්බ් වලින් අලංකාර කිරිමට රු.1,936,000 ක් ගෙවා තිබිම නිසා දිවා කාලයේ පමණක් ක්‍රිඩා උළෙල පැවති දින 03 ක් සඳහා විදුලි බුබුලු වෙනුවෙන් කල රු.1,936,000 ක් ගෙවා තිබිම නිසා දිවා කාලයේ පමණක් ක්‍රිඩා උළෙල පැවති දින 03 ක් සඳහා විදුලි බුබුලු වෙනුවෙන් කල රුත1,452,000 ක ගෙවිම නිශ්කාර්ය වියදමක් වි තිබුණි. | ජාතික මට්ටමේ උත්සවයක් පැවැත්වෙන විට එම උත්වසයේ ප්‍රධාන කාර්යයන්ට අමතරව තොරන් ඉදිකිරිම බැනර් හා කටවුට් යෙදිම සාමාන්‍යයෙන් සිදු කරන දෙයකි.තරග ඉසව් රාත්‍රි කාලයේ නොපැවැත්වුවද තරුණ තරුණියන්ගේ සිත් ඇද බැද ගන්නා අයුරින් අදාල ස්ථාන විචිත්‍රවත් අයුරින් සකස් කිරිම තාරුණ්‍යයේ මනසට කාවදින ලෙස ඔවුන් වෙනුවෙන් සංවිධානය කල උත්සවයක් අලංකාරවත් විය යුතුය. ජාතික මහා ක්‍රිඩා උළෙල ජාතික පාසල් ක්‍රිඩා උළෙල යන ක්‍රිඩා උළෙලවල් පැවැත්වෙන අවස්ථාවන් වලදිද ක්‍රිඩක ක්‍රිඩිකාවන් හා පොදු මහජනයා තුල ආකර්ෂණයක් ඇති වන ආකාරයට උත්කර්ෂවත් ලෙස එම උළෙලවල්ද සංවිධානය කරන බව පෙන්වා දිය හැක. තවද ඔලිම්පික් ක්‍රිඩා උළෙල, පොදු රාජ්‍ය මණ්ඩලිය ක්‍රිඩා උළෙල, ආසියානු ක්‍රිඩා උළෙල වැනි ක්‍රිඩා උළෙලවල් වලදිද අදාල පරිශ්‍රයන් අලංකාර කිරිම හා ආකාර්ශනය සඳහා කොපමන උත්සාහයන් ගෙන ඇද්ද යන්න රූපවාහිනි වැඩසටහන් හා වෙනත් මුද්‍රිත මාධ්‍යන් මගින් අප දැක ඇත. ඒ ආකාරයට ගත්විට යෞවනයන් වෙනුවෙන් පැවැත්වෙන එකම ක්‍රිඩා උළෙල ලෙස මෙම ක්‍රිඩා උළෙල උත්කර්ශවත්ව හා ආකර්ශනියව පවත්වන ලෙසට තරුණ තරුණියන් වෙතින් යෝජනා වූ අතර පුළුල් ප්‍රචාරයන්ද ලබාදිය යුතු බවට ඔවුන්ගේ ඉල්ලිම් ඉදිරිපත් වූ හෙයින් ඒ පිලිබදවද අවධානය යොමු කරන ලදි.<br>ජාතික මට්ටමේ ක්‍රිඩා උළෙලක් ලෙස සියළුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින් සහභාගි වන ක්‍රිඩක ක්‍රිඩිකාවන් හට ඔවුන්ගේ දක්ෂතාවයන් උපරිම අයුරින් පෙන්වා දිමටත් ඉහළම දක්ෂතාවයන් ඇති ක්‍රිඩකයින් ජාතික තලය වෙත ගෙන ඒම සඳහා දරන පරිශ්‍රමය තුල ඔවුන්ගේ දක්ෂතා එලි දැක්විමට පසුබිමක් අවශ්‍ය වන අතර ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාවය ඉහළ මට්ටමක තබා ගැනිමද අත්‍යවශය වේ. එසේම ඔවුන් ක්‍රිඩාකරන පරිසරය සිත් ඇදගන්නා සුළු අයුරින් උත්සවශ්‍රියෙන් නිර්මාණ විම තුලින් ක්‍රිඩක ක්‍රිඩිකාවන් තුල අභිමානයක් ඇති විමත් සංවිධානය ශත්තිය පිලිබද දැඩි විශ්වාසවන්තභාවයක් ඇතිවිමත් තුල ඔවුන් අභිප්‍රේරණය විම සිදුවේ. දවස පුරා වෙහෙස මහන්සි වි සිටින ක්‍රිඩික ක්‍රිඩිකාවන් තම ඉසව් අවසන් විමෙන් පසුව ක්‍රිඩා පිටියෙන් නික්ම නොයන අතර තම තමන්ගේ ශරිරි මාංශපේශි ලිහිල් කර ගැනිම සඳහා වූ විශේෂ ව්‍යායාම වල නිරත විම් හා සම්භාහන කටයුතු වල නිරත විම සඳහා පැය 2 ක් පමන ගත කරයි. එසේම සෑම දිනකම ක්‍රිඩා ඉසව් අවසානයේදි පස්වරු 7 න් පසු අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| | | ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම අධ්‍යක්ෂවරුන් ,නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,සහකාර අධ්‍යක්ෂවරුන්,පළාත් අධ්‍යක්ෂකවරුන් ඇතුළු දිස්ත්‍රික් වලින් පැමිනි කණ්ඩායම්භාර නිලධාරින් තරග විනිසුරුවන් තාක්ෂණික නිලධාරින් යනාදියගේ සහභාගිත්වයෙන් තාක්ෂණික කමිටු රැස්වීම් පැවැත්වන අතර මෙයට සමගාමීව ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලන නිලධාරීන් හා ඒ් ඒ් දිස්ත්‍රික් සම්මේලන නිලධාරීන් සමග රැස්වීම් ක්‍රීඩාංගණය තුලදීම පැවැත්වීම සිදු කරනු ලබයි. |
| | ii. ක්‍රීඩා උළෙලට සහභාගි වූ ක්‍රිඩික ක්‍රිඩිකාවන් සදහා ටි ෂර්ට් හා බොටම් මිලදි ගැනිමට රු.3,943,630 ක් වැයකර තිබුණි. උළෙල පැවැත්විමට දින 05 ක ට පථම ලංසු කැදවීමට පියවර ගැනීම නිසා කෙටි කාලයක් තුල පසම්පාදනය ඉටුකිරීමේ අපහසුතාවය දක්වා බොහෝ ආයතන ලංසු ලබාදීම පතික්ෂේප කර තිබුණි. එම නිසා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංගහයේ 1.2.1 (ඇ) ප්‍රකාර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අරමුණ ඉටුවී නොතිබුණි. | ක්‍රීඩා උළෙල සදහා ටී ෂර්ට් හා බොටම් ඇතුලු වෙනත් සැපයීම් සදහා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය මගින් අනුග්‍රහයන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. නමුත් අවසන් සතිය එලඹෙන තෙක්ම මෙම ආයතනයෙන් නිවැරදි පිලිතුරක් නොලැබුනු බව සම්මේලනය මගින් දන්වා සිටි නිසා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සිදුවුයේ අවසන් සතිය තුලදීය.ඒ අනුව අදාල ආයතන වෙතින් මිල ගණන් කැදවනු ලැබු අතර ලබා දුන් මිළ ගණන් අනුව ප්‍රසම්පාදන පිරිනමා ඇත. අනුග්‍රාහක ආයතන වසින් කල් වේලා ඇතිව අනුග්‍රාහයන් ලබා දීම ප්‍රතික්ෂේප කලේ නම් ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලසීමාවන් තුලදී සිදු කිරීමට හැකියාව තිබුණි.<br>ඒකගවූ පරිදි අවම මිල ගනන් ඉදිරිපත් කල සැපයුම්කරු වෙත සමස්ථ ප්‍රසම්පාදනය පිරිනැමුම සිදු නොකර සැපයුම්කරුවන් තිදෙනෙකු වෙත පිරිනැමුම සිදුවුයේ මෙම සැපයුම් කඩිනමින් විශාල ප්‍රමානයක්(ටී ෂර්ට් 2992 ක් හා බොටම් 3017 ක් වශයෙන්) ඉතා කෙටි කාලයක්තුල සිදු කර ගත යුතු නිසා අවම මිල ගනන් ඉදිරිපත් කර ඇති තිදෙනෙකු වෙත මෙම ප්‍රසම්පාදන පිරිනැම්මට කමිටුව මගින් තීරණය කර තිබු නිසා එසේ කිරිමෙන් සභාවට සිදු විමට තිබු මූල්‍ය හානිය අවම කරගත් අතර, ක්‍රීඩා උළෙලේ සම්පූර්ණ අවශ්‍යතාවය ඉටුකර ගැනිමට ගනු ලැබු උත්සාහයකි. එය විශාල මූල්‍ය විටිනාකමක් ලෙස සැලකිය හැකි අතර, අවශ්‍යතාවය සම්පූර්ණයෙන් ඉටු කර ගැනිම සදහා ගත් උත්සාහයක්ද වේ. |

<table>
<tr>
<td>(ඇ)</td>
<td>කැනඩා තරුණ හුවමාරු වැඩසටහන යටතේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් තරුණ තරුණියන් සිව් දෙනෙකු වෙත රු.2,705,000 ක් 2008 වර්ෂයේදි ලබාදි තිබුණද,ඒ සදහා ඇප තබා ගැනිමට පියවර ගෙන නොතිබුනි. එමෙන්ම ඒ වෙනුවෙන් වෙනත් කිසිදු ලිඛිත එකගතාවයකට ද බැදි නොතිබිම හේතුවෙන් එම මුදල් නැවත අය කර ගැනිමට නොහැකි වි තිබුණි.</td>
<td>
<table>
<tr><th>ගිණුම් හා නාමය</th><th>ආරම්භක වර්ෂය</th><th>මුදල</th><th>නඩු අංකය</th><th>අධිකරණය</th><th>ගෙවිම් කර ඇති ආකාරය/ පවත්නා තත්වය</th></tr>
<tr><td>එඩ්වඩ් නිර්මලි ක්‍රිෂාන්ති මෙය</td><td>/2005 2006</td><td>/500,000</td><td>7010/1 /2M</td><td>දිසා අධිකරණය ගල්කිස්ස</td><td>රු.100,000 2008.01.29<br>කුවිතාන්සි අංක 2008.03.07<br>රු.10,000 094299<br>කුවිතාන්සි අංක 2008.04.02<br>රු.10,000 094344<br>කුවිතාන්සි අංක 2008.07.30<br>රු.20,000 096694<br>රු.30,000 2012.10.09<br>මෙම නඩුව සමථය සදහා අත්සන් කර ඇත.</td></tr>
<tr><td>කේකේ. ජී.සදරුවන් මයා</td><td>/2006 2007</td><td>1,000,000</td><td>-</td><td>-</td><td>කුවිතාන්සි අංක 2008.04.21<br>රු.20,000 094363<br>කුවිතාන්සි අංක 2008.05.21<br>රු.30,000 094424<br>කුවිතාන්සි අංක 2008.10.31<br>097157රු20,000.<br>රු.20,000 2008.12.16<br>නීතිමය කටයුතු සදහා නීතිපති දෙපාරිතමේන්තුවට දන්වා ඇත.</td></tr>
<tr><td>ආර්. කරුනෙයි නාදන් මයා</td><td>/2006 2007</td><td>100,000</td><td>1653/1 /2 M</td><td>දිසා අධිකරණය නුගේගොඩ</td><td>කුවිතාන්සි අංක 2008.05.05<br>රු.50,000 094405<br>කුවිතාන්සි අංක 2008.07.21<br>රු.25,000 096657<br>කුවිතාන්සි අංක 2008.12.31<br>රු.15,000 098641<br>දිසා විනිසුරුතුමා නියෝග ලබා දි ඇත්තේ පැමිණිල්ල සංශෝධනය කර නැවත ගොනු කිරිම සදහා</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>(ඈ)</td>
<td>තරුණ තරුණියන් අතර දේශපාලන විනය පිලිබද හැගිමක් ඇති කරලිම,නුතන ශ්‍රි ලාංකිය ජාතිය ගොඩ නැගිම සදහා පදනමක් ඇති කිරිම,විශිෂ්ඨ තරුණ නායකත්වයක් නිර්මාණය කිරිම හා ජාතික තරුණ සේවා පනතේ අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිම අරමුණු කරගෙන මන්ත්‍රිවරුන් 335 දෙනෙකුගේ සංයුතියක් සහිතව ශ්‍රි ලංකා යොවුන් පාර්ලිමේන්තුව ස්ථාපනය කර තිබුණි.<br>ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.</td>
<td></td>
</tr>
</table>

| | | |
|---|---|---|
| | i. සමාලෝචිත වර්ෂය අවසාන වන විට යොවුන් පාර්ලිමේන්තු සැසි 08 ක් පවත්වා තිබුනු නමුත් පළමු සහ පස්වැනි සැසිවාර හැරුණු කොට අනෙක් සියලු සැසිවාරයන්හි මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය සියයට 47 සිට සියයට 69 දක්වා පරාසයක පැවතුනි. 05 වැනි සැසිවාරය සඳහා නවක මන්ත්‍රීවරුන් 88 දෙනෙකු සහභාගි වී තිබීම එම සැසිය සඳහා මන්ත්‍රීවරුන්ගේ වැඩි සහභාගිත්වයක් පෙන්නුම් කිරීමට හේතුවී තිබුණි.සියළු සැසි වෙනුවෙන් මුළු මන්ත්‍රී සංඛ්‍යාවට සාපේක්ෂව නොපැමිණි සංඛ්‍යාව සියයට 47 කි. මේ නිසා 2012 ජුලි මස මන්ත්‍රීවරුන්ගේ 83 දෙනෙකුගේ පැමිණීම දුර්වල බව ඔවුන් වෙත දන්වා පසුව සැසි වාර 03 ක් නොපැමිණි මන්ත්‍රීවරුන් 14 දෙනෙකුගේ මන්ත්‍රීධුරය අහෝසි කර තිබුණි. | ශ්‍රී ලංකා යුත් පාර්ලිමේන්තුවේ අපේක්ෂිත අරමුණු තරුණ තරුණියන්ට ලබාදීම සඳහා තේරිපත්වූ මන්ත්‍රීවරුන්ට දැනුම ආකල්ප කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩමුළු පවත්වා පාර්ලිමේන්තු සැසිවාර ආරම්භ කරන ලදි. නමුත් ඔවුන්ගේ පැමිණීම දුර්වල තත්වයක පැවතීම හේතුවෙන් පාර්ලිමේන්තු කාරක සභා වැඩමුළු සහ සැසිවාර ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ගනු ලබන සියළුම ක්‍රියාමාර්ග නිශ්ඵල වන හෙයින් නොපැමිනෙන පිරිස ඉවත් කර 28 දෙනෙකු නැවත බඳවා ගැනීමට කටයුතු කරන ලදි. මෙම තීරණය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ නියෝජනය කරන තවත් තරුණයකුට ලබාදෙන අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. එසේ වීම හේතුවෙන් අදාල ව්‍යාපෘතිය සඳහා සහභාගිත්වය අඩුවීමක් එම අඩුවීම පිරවීම සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති වෙනත් තරුණියකු හෝ තරුණයකු බඳවා ගැනීමේ අරමුණ ඇතිව මෙම ලිපිය යොමු කර ඇත.<br>ඉහත ලිපිය මගින් දැනුවත් කලද තවදුරටත් සහභාගි නොවූ මන්ත්‍රීධුර අහෝසි කර නැවත පත්කිරීමට කටයුතු කරන ලදි. |
| | ii. 2010 වර්ෂය තුල ආරම්භ කල මෙම ව්‍යාපෘතිය සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විට දරන ලද සමස්ත පුනරාවර්තන වියදම රු.59,612,836 ක් වියත පවත්වන ලද මුළු සැසිවාර සංඛ්‍යාව 08 ක් වූ අතර එම සැසි සඳහා මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයේ සාමාන්‍ය 229 දෙනෙකු විය. ඒ අනුව සභාව විසින් එක් සැසියක් සඳහා සහභාගිවූ මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් රු.260,318 ක ප්‍රමාණාත්මක පිරිවැයක් දරා තිබුණි. | මෙම කරුණ පිලිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරු සඳහා පාදක කරගෙන ඇත්තේ සැසිවාර 08 ක් යටතේ සහභාගිත්වය 1833 ක් පදනම් කරගෙනය.<br><br>එනමුත් ශ්‍රී ලංකා යුත් පාර්ලිමේන්තුව ආශ්‍රිතව එම සැසිවාරයන්ට අමතරව කාරක සභා වැඩමුළු, තෝරාපත් කර ගැනීමේ මහමැතිවරණය, නායකත්ව පුහුණු වැඩමුළු යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ පිලිබඳව සැලකිල්ලට ගැනීමේදී සමස්ථ සහභාගිත්වය 2924 ක් වේ.<br>යෞවුන් පාර්ලිමේන්තු වැඩසටහනේ ප්‍රතිලාභීන් ලෙස සමස්ථ යෞවන සමාජ සාමාජිකයින් 553433 ජන්දදායකයින් වන බැවින් ද සමස්ථ ශ්‍රී ලාංකිය තාරුණ්‍ය ආමන්ත්‍රනය කරමින් මෙම ව්‍යාපෘතිය සකස් වී ඇති බැවින් මෙහි ප්‍රතිලාභීන් ලෙස ශ්‍රී ලාංකිය සමස්ථ තාරුණ්‍යද ඇතුලත්ය. |
| 04.3 | අරමුණුවලින් බැහැර ගනුදෙනු | |
| (අ) | තරුණ සංවර්ධනය වෙනුවෙන් වෙන් කල ප්‍රතිපාදනවලින් රු.2,916,444 ක් තරුණ සංවර්ධන අරමුණුවලින් බැහැර කටයුතු සඳහා වැය කර තිබුණි. | විමසුමේ සඳහන් වැය දැරීම් වලින් රු.2,412,176 ක් වැය දැරීම සිදුකර ඇත්තේ 2012 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික නිලධාරි හමුව වැඩසටහන සඳහා වේ. වාර්ෂික නිලධාරි හමුව වැඩසටහන තුලින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු සලකා බැලීමේදී එහි ප්‍රතිලාභ සෘජුවම තරුණ සේවා සභාවේ තරුණ සංවර්ධන කටයුතු ඉහල නැංවීම සඳහා දායක වී ඇත. ජාතික තරුණ සේවා සභාවේ කාර්යභාරය නව මුහුණුවරක් යටතේ ශ්‍රී ලංකා යුත් සංකල්පය සත්‍ය වශයෙන්ම ක්‍රියාවට නංවන සහ එහි සඵලතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා මහගු දායකත්වයක් ලබාදෙන ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයේ කාර්ය භාරය ඇගයීම සඳහා හා |

| | | |
|---|---|---|
| | | දායකත්වය කෙසේ වියයුතුද යන්න හා ඉදිරි වර්ෂයේ කටයුතු සම්බන්ධව නිලධාරින් දැනුවත් කිරිමේ අරමුණු ඇතිව සහ දිරිගැන්විමේ අරමුණ ඇතිව පවත්වන ලද නිලධාරි හමුවන්හිදි එය සංකේතවත් කිරිම සදහා මෙම සෙරමික් ජෝග්ගු,බෑග් ප්‍රදානය සහ දිනපොත් ප්‍රදානය කරන ලදි. මෙවැනි වැඩසටහන් තුලින් නිලධාරින් තුල ගොඩනැගෙන ජවය,සේවක අභිප්‍රේරණය, කාර්ය මණ්ඩල හමුවන් තුලින් ගොඩනැගෙන සබදතා වැනි  මුල්‍යමය නොවන වශයෙන් ලැබෙන ප්‍රතිලාභ නිර්ණය කිරිමේදි  දරන ලද වැයෙහි ප්‍රතිඵලය අවසාන වශයෙන් තරුණ සංවර්ධනය සදහා ඉවහල් වන බවත් පෙන්වා දිය හැක.විමසුමේ සදහන් රු.504,268/- ක් වැය දැරිම් සිදුකර ඇත්තේ තාරුණ්‍ය සමග කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය වන ජාතික තරුණ සේවා සභාව විසින් 30 වසරක යුද්ධය නිමකර රට එක්සේසත් කල ජනනායකයා වෙත ශ්‍රී ලාංකිය තාරුණ්‍යයේ උපහාරය හා කළගුණ දැක්විම අර්ථවත් කිරිමේ අරමුණ ඇතිව  හා ජාතික අභිමානය පිලිබද හැගිම තාරුණ්‍ය තුල ජනිත කරවිම යන පරමාර්ථයන් වෙනුවෙන් වැයදරන ලදි. |
| (ආ) | මහරගම නගරයේ සංගීත ප්‍රසංගයක් පවත්වා ඒ වෙනුවෙන් රු.3,925,264 ක් වැය කර තිබුණි. | ජාතික යෞවන ක්‍රිඩා උළෙලට සමගාමිව සංගීත ප්‍රසංගය මහරගම නගරයේ පැවැත්විම සදහා කටයුතු කරන ලද්දේ ශ්‍රී ලංකා යුත් ප්‍රධාන කාර්යාලය පිහිටි නගරය මහරගම විම හා ඒ තුලින් ජාතික තරුණ සේවා සභාවේ කටයුතු පිලිබදව අවබෝධයක් නගරවාසින්ට ලබාදිම,යෞවන ක්‍රිඩා උළෙලට සහභාගිවු ක්‍රිඩක ක්‍රිඩිකාවන් අදාල කාලය තුල නේවාසිකව සිටින ලද්දේ සුගතදාස ක්‍රිඩාංගනයේ අවට පාසල් වලය. එම පාසල් පසුදින අධ්‍යාපන කටයුතු කරගෙන යාමට භාරදිය යුතු බැවින් ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ ඇදුම් පැලදුම් හා ක්‍රිඩා උපකරණ ආරක්ෂා සහිතව තබා ගැනිම,ඒ අවට වෙනත් ස්ථානයක් නොමැති කමත් දුර බැහැරින් පැමිණි ක්‍රිඩක ක්‍රිඩිකාවන්ට හා නිලධාරින් ඇතුළු 3000 ක් වැනි පිරිසකට සංගීත ප්‍රසංගය අවසානයේ ආහාර ගැනිම, ස්නානය කිරිම ,වැසිකිලි පහසුකම් හා වෙනත් සනිපාරක්ෂක කටයුතු වෙනුවෙන් පහසුකම් සැපයිය හැක. වෙනත් ස්ථානයක් නොමැති විම නිසාත් එම පහසුකම් අවම වශයෙන් හෝ ශ්‍රී ලංකා යුත් පරිශ්‍රය තුල දි ලබාදිමට ඇති හැකියාව නිසා එම දිනයේම තම නිවෙස් බලා යාමට අපහසු ක්‍රිඩක ක්‍රිඩිකාවන් සදහා නේවාසික පහසුකම් ලබාදිමට ඇති හැකියාවත් යන කරුණු සලකා බලා ඉහත ප්‍රසංගය පැවැත්විම සදහා මහරගම නගරය තෝරා ගන්නා ලදි. ශ්‍රී ලංකා යුත් ප්‍රධාන කාර්යාලය පිහිටි මහරගම නගරය තුල ශ්‍රී ලාංකේය තාරුණ්‍යයයේ ශක්තිය මහරගම අවට පොදු ජනතාවට දැක බලා ගැනිමට සැලැස්විම හා ඒ තුලින් ජාතික තරුණ සේවා සභාව ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය,යෞවන කටයුතු අමාත්‍යාංශය යන ආයතන වල ඇති සංවිධාන ශක්තිය පෙන්විම යන අරමුණු ඇතිව පවත්වන ලදි.<br>ක්‍රිඩා උළෙලට සමගාමිව පවත්වන ලද සංගීත ප්‍රසංගයේ සජීවිව විකාශනය |

| | | |
|---|---|---|
| | | කිරිම සඳහා පමනක් නොව සමස්ථ ක්‍රිඩා උළෙල විකාශනය කිරිම සඳහා වැය දරන ලද අතර, ගායක ගායිකාවන්ට ගෙවීම් රු.200,000 ක්ද එම ප්‍රසංගයේ විද්‍යුත් උපකරණ සඳහා රු.458,000 ක්ද ඇතුළුව සමස්ථ රු.39,25264 ක් වැය කරන ලදි. |
| 04.4 | ආර්ථික නොවූ ගනුදෙනු | |
| | සභාව විසින් ක්‍රියාත්මක කරන සෑම වැඩසටහනක් සඳහාම අවශ්‍ය විටකදි උපයෝගි කර ගත හැකි වන පරිදි එකග වූ යම් පොදු ආකෘතියකට අනුව ටී ෂර්ට්,කැප්,බොටම් යනාදිය සකස් කර ගැනිම වෙනුවට ඒ ඒ වැඩසටහනෙන් වැඩසටහනට එවැනි ඇඳුම් පැලඳුම් සකස් කර ගැනිම නිසා 2011 හා 2012 වර්ෂ සඳහා එකතුව රු.24,152.602 ක් මේ වෙනුවෙන් වැයකර තිබුණු අතර සෑම වැඩසටහනක් සඳහාම මෙසේ ඇඳුම් පැලඳුම් සකස් කිරිම විගණනයේදි ගැටළු සහගත විය. | ජාතික තරුණ සේවා සභාවේ කටයුතු පුළුල් ලෙස ප්‍රතිසංවිධානය කිරිමේ අරමුණ ඇතිව ජාති ,ආගම්,කුල, පන්ති,පක්ෂ,පාට හෝ භූගෝලිය විෂමතාවන් සැලකිමකින් තොරව තාරුණ්‍යයේ පැහැය සමගින් බිහිවූ ශ්‍රී ලංකා යුත් සංකල්පය හදුන්වා දෙන ලද අතර, මෙම සංකල්පය ශ්‍රී ලාංකීය තරුණ ප්‍ර ජාව අතර, ප්‍රචලිත කිරිම සදහාත්, තරුණ සේවා සභාවේ වැඩසටහන් සමග ඒකාරාශි වන තරුණ පිරිස වර්ධනය කර ගැනිම සදහාත් එක් එක් වැඩසටහන වෙන් වෙන්ව හදුනා ගැනිම සදහාත් තාරුණ්‍යට ආකාර්ශණය වන ආකාරයෙන් යුක්ත විය යුතු නිසා මාධ්‍ය හා ප්‍රචාරන කටයුතු වලදි වැඩසටහන් වල විචිත්‍රත්වය සහ විවිධත්වය ප්‍රදර්ශනය කිරිම සදහාත් වැඩසටහන් පොදු එක් ආකෘතියකට අනුව ප්‍රදර්ශණය කිරිම සදහාත් අරමුණු ඇතිව  මෙම ටිෂර්ට් කැප්,බොටම් යනාදිය සකස් කර ඇත.<br><br>සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන තරුණ සංවර්ධන වැඩසටහන්හී ක්‍රියාකාරකම්, අරමුණු, පරමාර්ථ හා නාමික ස්වරූප එකිනෙකට වෙනස්ය. එමෙන්ම දේශීය, විදේශීය තරුණ හුවමාරු වැඩසටහන්, ජාතික යෞවන ක්‍රීඩා උළෙල, යොවුන් පාර්ලිමේන්තුව වැනි හාත්පසින්ම එකිනෙකට වෙනස්වූ වැඩසටහන් සඳහා පොදු ආකෘතියකට අනුව ඇඳුම් පැළඳුම් නිර්මාණය කිරීම ඵලදායි නොවන බැවින් එක් එක් වැඩසටහනට අර්ථවත් වන ආකාරයෙන් ඒවා නිර්මාණය කරගෙන ඇත.  තවද, වාර්ෂික සංවර්ධන සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්හි සහභාගීත්ව ප්‍රමාණ ගණනය කර ටී ෂර්ට්, බොටම් හා කැප් සකස් කරගෙන තිබියදී, අවස්ථානුකූලව හෝ නොවැලැක්විය හැකි හේතූන් මත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නොහැකියාවක් මතුවුහොත්, විශාල වියදමක් දරා සකස් කරගත් ඉහත අයිතමයන් ගබඩා ගතකර තිබීමෙන් එය අනාර්ථික වියදමක් වනු ඇත.එහෙත් අවශ්‍යතාවයන් අනුව ඒවා වෙනත් කාර්යයන් සඳහා නිකුත් කිරිමද සිදු කර ඇත.<br><br>එමෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවගේ විවිධ කුසලතාවයන් නංවාලිම සඳහා විවිධ වැඩසටහන් හා විදේශීය තරුණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරනු |

| | | |
|---|---|---|
| | | ලබන අතර, එම වැඩසටහන් වල තරගකාරි බව, ආකර්ෂණීය බව, ජාත්‍යන්තර සහයෝගීතාවය රදවා ගැනීම සදහා සහභාගි වන තරුණ තරුණියන්, විනිසුරුවන් සේවා කණ්ඩායම් සහ සංවිධායකවරුන් වෙත ටීෂර්ට් ලබා දිම සිදු කරනු ලබයි. ඒ සදහා ජාතික තරුණ සේවා සභාවේ පාලන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගනිමින් අදාල කටයුතු සිදු කර ඇත. |
| 4.5 | මතභේදයට තුඩු දෙන ගනුදෙනු | |
| (අ) | සභාව සතු නොවූ අක්කර 338 රූඩ් 03 පර්චස් 01 ක් වූ ඉඩම් ඒකක 54 ක නිශ්චල දේපල තුල සිදු කර තිබුණු ඉදිකිරීම් හා ප්‍රාග්ධන ස්වරූපයේ අළුත්වැඩියා වෙනුවෙන් රු.261,347,372 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණි. | ජාතික තරුණ සේවා සභාව වෙත විමසුමේ සදහන් දේපල පවරා දිමේදි ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් විධිමත්ව ඒ සදහා අනුමැතිය ලබාදි ඇති අතර, එම අනුමැතියන්ට අනුකූලව එම දේපල වල පුහුණු මධ්‍යස්ථාන වලට අදාලව ඉදිකිරිම සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරිමකින් තොරව පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවන බවත් අදාල පාඨමාලා හදාරන අභ්‍යාසලාභීන් වෙනුවෙන් පහසුකම් සැපයිමේ අරමුණ ඇතිව අදාල ඉදිකිරිම් කටයුතු සිදු කරන ලද අතර, තවද මෙම සභාව විසින් විධිමත්ව පවරා ගැනිමේ පදනම මත ලබා ගෙන ඇති රජයට අයත් ඉඩම්වල රජයේ අයිතිය යටතේ පවතින වත්කම් සේ සලකා තරුණ සංවර්ධන කටයුතු වලට අදාලව ඉදිකිරිම් කිරිමට වැයදැරීම් කර ඇති අතර, තරුණ සේවා පනතේ 5(1) වගන්තියට අදාලව එම ඉඩම් නිත්‍යානුකූලව පවරා ගැනිමට අදාල කටයුතු සිදු කෙරේ. එසේම මෙතෙක් නිත්‍යානුකූලව පවරා ගැනිමට නොහැකි වි ඇති ඉඩම් පිලිබදව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්තුමා වෙතද වාර්තා කර ඇත. |
| (ආ) | මහරගම තරුණ මධ්‍යස්ථානයේ පුහුණු ගොඩනැගිල්ලේ පලමු මහලේ කාන්තා සහ පිරිමි වැසිකිලිවල සිවිලිම,ලාම්පු හා අනෙකුත් උපකරණ ගලවා ඉවත් කිරිම වෙනුවෙන් රු.100,000 ක් ගෙවා තිබුණද,පළමු මහලේ සිවිලිමක් නොතිබුණි. | මෙම අයිතමයන්ගෙන් ඉංජිනේරුවරයා බලාපොරොත්තු වන්නේ වැසිකිළිය තුල පවතින කිසියම් හෝ පැරණි(Existing) ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ වෙනයම් ඕනෑම පැරණි දෙයක් ගලවා ඉවත් කිරිමයි. එහිදි පොදුවේ ගත් කල සිවිලිම,විදුලි ලාම්පු ,වයරින් බට,වයරින්,විදුලිය විසන්ධි කිරිම,බිම හා බිත්ති වල පවතින ටයිල් වැසිකිලි පෝච්චි ,මුහුණ සෝදන බේසම්,කරාම,කණ්නාඩි,බිම පවතින කොන්ක්‍රීට් පොලොව හෝ සිමෙන්ති බදාම පොලොව,ජල හා කැසිකිලි පයිප්ප ආදි එකි නොකි සෑම දෙයක්ම යන්නය.<br><br>METHOD OF EASUREMENT OF BUILDING WORKS – SLS 573:1982 අනුගමන කර ඇස්තමේන්තුව සැකසිමේදි දිගකින් හෝ වර්ගඵලයකින් හෝ පළලකින් හෝ බරකින් හෝ ගණන් කිරිමට හෝ ඇගයිමට නොහැකි වැඩ කොටස් මැනිම item වලින් කරන ලද අතර, වැඩ විස්තරය තුල එම |

| | | |
|---|---|---|
| | | කාර්යයන්ට අදාල හඳුනාගත් ප්‍රධානම අයිතමයන් පමණක් සඳහන් කර etc යනුවෙන් සඳහන් කරනු ලැබේ. |
| (ඇ) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් පිහිටුවන ලබන තරුණ සංසදයේ ක්‍රියාකාරි දායකත්වයක් ලබා ගැනීම සඳහා රු.5,368,100 ක් UN HABITAT(United Nation Habitat and Human Settlements Foundation) ආයතනය වෙත ගෙවා තිබුණි.<br>පහත කරුණු නිරීක්ෂණය කෙරේ.<br>(i) මෙම ගෙවීමේ අරමුණු හා අවශ්‍යතාව පිලිබඳ මෙන්ම,දරන ලද වියදමින් අපේක්ෂිත අරමුණ ඉටුවූ බවට කිසිදු ලිඛිත තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවිය. | 2014 ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ලෝක තරුණ සම්මේලනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලබා ගත යුතු හා ලැබෙමින් පවතින පහසුකම් සපයා ගැනීම හා සකසා ගැනීම වෙනුවෙන් මෙම මුදල ගෙවීම් කරන ලද අතර, මේ වන විට මෙම සමුළුව පැවැත්වීම සඳහා වූ මූලික පසුබිම් සකස් කිරීම,සංවිධානය කිරීම,සම්බන්ධිකරණ කාර්යයන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරනු ලබන අතර එම රැස්වීම් වලට සහභාගි වීම තුලින් අන්තර්ජාතික සම්බන්ධතා තහවුරු කර ගැනීම සහ ගොඩනගා ගැනීම වැනි කාර්යයන් මේ වන විට ඉටු වෙමින් පවතින බවත් 2014 වර්ෂයේ මෙම සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම මෙහි අවසාන අරමුණ සහ ප්‍රතිඵලය වේ. |
| | (ii) අංක පීඊඩී 57 හා 2011 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6(iv) උපජේදය පරිදි රු.මිලියන 02 ඉක්මවන ඕනෑම ප්‍රදානයක්/අනුග්‍රාහක දායකත්වයක් වෙනුවෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්,එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | 2011 දෙසැම්බර් මස යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අංක දරණ වාර්තාවට අනුව 2014 වර්ෂයේ ශ්‍රීලංකාවේ පැවැත්වීමට නියමිත තරුණ සම්මේලනය සඳහා කාලීනව අවශ්‍ය වන කටයුතු සඳහා(මුදල් ගෙවීම් ආදියද ඇතුලත්ව) කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව 2011 මෙක්සිකෝවේ පවත්වන ලද ලෝක තරුණ සම්මේලනයෙන් පසු 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ලෝක තරුණ සම්මේලනය දක්වා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරනු ලබන රැස්වීම් වලට සහභාගි වීමටත්,එක්සත් ජාතීන්ට අදාල රටවල් සම්බන්ධ කර ගනිමින් ශ්‍රී ලංකාවේ මූලිකත්වයෙන් රැස්වීම් සංවිධානය කිරීමටත් සිදුවේ. එසේම 2014 වර්ෂයේදී ලෝක තරුණ සම්මේලනය පැවැත්වීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අවශ්‍ය වන පහසුකම් සපයා ගැනීමට හා සංවිධාන සකසා ගැනීම කල යුතුව ඇත. ඒ සඳහා UN HABITAT සංවිධානයට මෙම මුදල ගෙවීම් කර ඇත. ඉහත සඳහන් මුදල ගෙවීමේදී 2011 වර්ෂයේ ලැබී ඇති කැබිනට් |

| | | |
|---|---|---|
| | | අනුමැතිය පාදක කර ගනිමින් වැය දරන ලදි.<br>ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම 2011 සහා තීරණ අංක 17/2011 හා 2012 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සභා තීරණ අංක 22/2011 හා 2013 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සභා තීරණ අංක 26/2013 යන සභා තීරණයන් මගින් මේ සදහා අනුමැතිය ලබා ගෙන ඇත. |
| (ඇ) | සී/ස තරුණ සේවා සමාගම, සී/ස තරුණ සේවා (සංගීත) සමාගම හා සී/ස තරුණ සේවා(නැටුම්) සමාගමේ කොටස් ආයෝජනය වෙනුවෙන් රු.4,032,360 ක් වර්ෂ 1985 සිට 1990 දක්වා කාලය තුල වැයකර තිබුණි. මෙම ආයෝජන වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් 2012 වර්ෂය අවසන් වනතුරුත් සභාව වෙත ලැබී නොතිබුණි. එමෙන්ම, සී/ස තරුණ සේවා(සංගීත) සමාගම හා  සී/ස තරුණ සේවා(නැටුම්)සමාගම කිසිදු ක්‍රියාකාරිත්වයක් නොමැති නාමික ස්වරූපයේ ආයතන වූ අතර එම සමාගම් විසින් සභාව වෙත නිකුත් කල කොටස් සහතික ඉදිරිපත් කිරිම හැර වෙනත් පැහැදිලි කිරිමක් ලබාදිමට සභාව අපොහොසත් විය. | සී/ස (නැටුම්) සමාගම, සී/ස(සංගීත) සමාගම මේ වන විට අහෝසි වි ඇති අතර ඒ පිලිබද නීතිපති අදහස් දැක්විමේ අංක ර්/241/12/nysco හා 2013.03.18 දිනැති ලිපිය මේ සමග ඉදිරිපත් කර ඇත. ඇමුණුම් අංක 01 පිටු අංක 05 සිට 06 දක්වා තවදුරටත් ගතයුත් නීතිමය ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට සැලසුම් කර ඇත. සභා පනතේ 5(2)ආ ජේදය කෙරෙහි අවධානය යොමු කරන අතර සී/ස තරුණ සේවා සමාගම සභාවේ ආයෝජනයක් සේ සැලකෙන බැවින් මූල්‍ය ප්‍රකාශනයේ ආයෝජන ලෙස එම අගය රු.40,32360 පෙන්වා ඇත. ඒ අනුව ඒකාබද්ධ ගිණුම් ඉදිරිපත් කිරිමේ අවශ්‍යතාවයක් නොමැති සේ සැලකේ මේ වන විට 2010/11,2011/12,2012/13 මූල්‍ය වර්ෂ වලට අදාලව අවසාන ගිණුම් කෙටුම්පත් කර ඇති අතර විගණනය සදහා SBN Associate වරලත් ගණකාධිකාරි සමාගම වෙත භාරදී ඇත. |
| (ඉ) | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සමග පරිශිලනය කිරිම සදහා 2012 පෙබරවාරි 23 දිනැතිව නිකුත් කර ඇති අතිරේක-21 අනුව ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු වලට වෙලදපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරිමේ අධිකාරය රු.500,000 කට වඩා අඩු මිලදි ගැනිම් සදහා සිමාකර තිබුනද,පළාත් කාර්යාල 04 ක් විසින් එම සිමාව ඉක්මවා අවස්ථා 09 කදි එකතුව රු.7,532,488 ක මිලදි ගැනිම් සිදු කර තිබුණි. අංක 24/2012 හා 2012 අප්‍රේල් 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල සභා සංදේශ මගින් ඉහත සිමාවන් අභිබවා යන පරිදි සභාවේ මූල්‍ය බලතල පැවරිම් සංශෝධනය කර තිබුණු අතර ඒ අනුව නිකුත් කල අංක 03/2012 හා 2012 ජුලි 04 දිනැති කාර්යාල චක්‍රලේඛයේ උපදෙස් මත කටයුතු කිරිම මෙම අධිකාර සිමාවන් ඉක්මවා යාමට හේතු විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ට යොමු කර ඇති අත්පොත සදහා වූ අතිරේක 20 අනුව සභාවේ ප්‍රසම්පාදන සිමාවන් සංශෝධනය කර ඇත. වර්තමානයේ පවතින මුදල් භාවිතයේ ප්‍රමාණික අධික භාවය, ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව ලෙස ආයතන ප්‍රධානින්ගේද කාර්යභාරය සැලකිල්ලට ගෙන ඉහත සදහන් අතිරේකයේ කොන්ත්‍රාත් සිමාව භාණ්ඩ හා සේවා සිමාව ලෙසද සලකා 03/2012 චක්‍රලේඛය මගින් මෙම සිමාව සදහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලබා දි ඇත.<br>මෙම කරුණ සම්බන්ධයෙන් මුදල් අක්‍රමිකතාවයක් හෝ මුදල් අවභාවිතයක් සිදු වි ඇති බව මෙතෙක් අනාවරණය වි නැත. චක්‍රලේඛ අනුව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කිරිමට අදාල විස්තරාත්මක උපදෙස් පත්‍රිකාවක් 2013.06.21 දිනැතිව නැවත පලාත් කාර්යාල වෙත ලබා දිමට පියවර ගෙන ඇත. |
| 4.6 | සාවද්‍ය ගෙවිම් | |
| (අ) | කර්මාන්ත 06 කට අදාලව ඉටු කර නොතිබුණු වැඩ විෂයයන් 51 ක් සදහා රු.1,221,725 ක් ගෙවා තිබුණි. | කර්මාන්ත 06 කට අදාල සටහන් කර ඇති වැඩ අයිතමයන් ඇතුලත් වනුයේ ප්‍රාථමික වැඩ විෂයට වේ. ඇස්තමේන්තුවක ප්‍රාථමික වැඩ යනු යම් ව්‍යාපෘතියක ඇති ස්ථිර වැඩ කටයුතු කරගෙන යාම සදහා අත්‍යවශ්‍ය තාවකාලික  වැඩ හා සේවාවන්ය. විශේෂයෙන් කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සපුරාලිය යුතු වගකිම් සදහා වන වියදම් මෙහි ඇතුලත්ය. ඒ අනුව |

| | | |
|---|---|---|
| | | කොන්ත්‍රාත්තුව ආරම්භයේදී මෙම කාර්යයන් ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු විසින් බැඳී ඇති අතර ඒ සඳහා ගිවිසුම්ගත මුදල කොන්ත්‍රාත්තුව ආරම්භයේදීම ගෙවීම් සිදු කරයි.<br>ඉංජිනේරුවරයා විසින් සති දෙකකට වරක් වැඩබිම් පරීක්ෂාවේදී ප්‍රාථමික වැඩ ඉටුවී ඇති ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ. |
| (ආ) | අනුරාධපුර ඉපලෝගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුල ඉදිකල වොලිබෝල් ක්‍රීඩා පිටියේ නොකල වැඩ වෙනුවෙන් රු.111,610 ක් ගෙවා තිබුණි. | මේ යටතේ ඉපලෝගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඉදිකර ඇති වොලිබෝල් ක්‍රීඩා පිටියේ ගෙවීම් සිදුකර ඇත්තේ කාර්මික නිලධාරි සිවිල් හා සහකාර අධ්‍යක්ෂ(ක්‍රීඩා සංවර්ධන) වොලිබෝල් උපදේශක ක්‍රීඩා අංශය යන අයගෙන් සැදුම්ලත් නිරීක්ෂණ කමිටු වාර්තාවක් පදනම් කරගෙනය.<br>අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතියේ සභාපති /දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ(අනුරාධපුර) ගේ 2013.06.20 දිනැති ලිපිය අනුව ඉපලෝගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරි වෙතින් වාර්තාවක් ලබා ගෙන යම් අඩුපාඩුවක් සිදුවී ඇත්නම් එය නැවත සකස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| 4.7 | හඳුනාගන්නා ලද පාඩු | |
| | එරම්ණියාය පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියාවේදී රු.66,662 ක වැට් බදු මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණු නමුත් එම මුදල අයකර ගැනිමට සභාව පියවර ගෙන නොතිබුණි. | එරම්ණියාය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කොන්ත්‍රාත්තුවේ පළමු බිල්පතේ ගෙවීම් සහිත ගොනුවේ අංක 89 න්ද එම ගෙවීම් සහතිකයට අදාල බිල්පත් සාරාංශ ගොනුවේ අංක (87) II ඉදිරිපත් කර ඇත.<br><br><u>පළමු බිල්පත සඳහා බිල් සාරාංශය පහත පරිදි වේ.</u><br><br>2011/12/31 දිනට සහතික<br>කල වැඩ වටිනාකම = රු.5,126,577.95<br>අඩු කළා 16% වට්ටම් = රු. 820,252.47<br>මුළු මුදල = <u>රු.4,306,325.48</u><br><br>ඉහත ගණනය අනුව ගෙවීම් සහතිකයේ කල වැඩ වටිනාකම රු.4,306,325.00 වී ඇත්තේ වට්ටම් 16% අඩු වු පසු බව සඳහන් කරමි. |

<table>
<tr><td>04.8</td><td>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</td><td></td></tr>
<tr><td>(අ)</td><td>ඉදිකිරීම් ඇස්තමේන්තු 06 ක් වෙනුවෙන් පමණක් අදාල ඇස්තමේන්තුවට බාහිරව රු.17,496,169 ක් අමතරව වැඩ සඳහා ගෙවා තිබුණි. එය ඒ ඒ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මුදලට සාපේක්ෂව 7% සිට 34% දක්වා පරාසයක විය. මෙම අතිරේක වැඩ වෙනුවෙන් ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුකූල මිල ගනන් කැඳවා කොන්ත්‍රාත්තු පිරිනැමීමට කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් වලට එළඹීමටද පියවර ගෙන නොතිබුණි. කෙසේ නමුත් ජාතික තරුණ සේවා සභාවේ ඉදිකිරීම් කර්මාන්තවල සැලසුම් සකස් කිරීම හා ඇස්තමේන්තු පිලියෙල කිරීම සඳහා උපදේශ ගාස්තු ලෙස රු.4,910.023 ක පමන මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවීමට බැදී තිබුණි.</td><td>සියලුම ව්‍යාපෘති අවුරුදු 20 කට වඩා පැරණි ගොඩනැගිලි වලට අදාල නවීකරණ කොන්ත්‍රාත් වේ. මෙවැනි ගොඩනැගිලි වලට ඇස්තමේන්තු සැකසීමේදී පාදක කර ගනුයේ මතුපිටින් පෙනෙන අඩුපාඩු හා වැඩිදියුණු කල යුතුයයි හඳුනාගත් කාර්යය සාධනයන් වේ.<br>මේ අනුව මෙවැනි නවීකරණ කොන්ත්‍රාත් කරගෙන යාමේදී වැඩබිමේදී අහඹු ලෙස යෙදෙන, එහෙත් අනිවාර්යයෙන්ම කළ යුතු වැඩ කොටස් ඉටුකිරීම සිදුවේ.<br>මෙවැනි අහඹු ලෙස යෙදෙන කාර්යයන් ඉටුකිරීම සම්බන්ධ ප්‍රසම්පාද මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13 ජේදයට හා කොන්ත්‍රාත් 39 වන ජේදයට අනුව, හඳුනාගත් අමතර වැඩ හා වෙනස් වීමට ලක්වූ වැඩ කොටස් සඳහා ඒ ඒ අවස්ථා වලදී ගොනුවෙන් අනුමැතිය ලබා ඇත.<br><br>ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.<br><table>
<tr><th></th><th>ගිවිසුම් ගත මුදල (රු)</th><th>අවසන් බිලෙන් කල වැඩ වටිනාකම</th><th>මුළු කොන්ත්‍රාත් මුදලින් වැඩිවීමේ ප්‍රතිශතය</th></tr>
<tr><td>කිළිනොච්චි තරුණ මධ්‍යස්ථාන නවීකරණය</td><td>6,240,069.00</td><td>6,575,474.62</td><td>%5.3</td></tr>
<tr><td>ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය නවීකරණය</td><td>11,801,686.00</td><td>12,452,788.54</td><td>%5.5</td></tr>
</table>
මෙම වැඩිදියුණු හා නවීකරණයේදී අහඹු ලෙස යෙදුණු කාර්යයන් ඉටුකිරීමේදී මුල් පිරිවැය ඇස්තමේන්තුවේ ඇතුලත් සමහර අයිතමයන් ඉටුකිරීමට අවශ්‍ය නොවූ අතර, ප්‍රමාණයන්ගේ ඉතුරුවීමක් සිදුවී ඇත.ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 අනුව ඉටුකිරීමට යෙදුනු අමතර වැඩ අවිනිශ්චිත වියදම් 10% සීමාව තුල පවතී.<br><br>➢ අනුරාධපුර යොවුන් නිකේතනය නවීකරණය -P1,P2</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | ➢ හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය නවීකරණය<br><br>මෙම කොන්ත්‍රාත් සදහා අවසන් බිල් ඉදිරිපත් කොට නොමැති අතර, එම කාර්යයන්ද ඉහත ආකාරයටම වේ.<br><br>➢ මහරගම තරුණ මධ්‍යස්ථානය වැසිකිලි පද්ධතිය නවිකරණය<br><br>මෙම කොන්ත්‍රාත්තුව කරගෙන යාමේදි කාර්යය සාර්ථකව අවසන් කිරිමට ඉටුකල යුතුව තිබු හදුනාගත් අමතර වැඩ සදහා අමතර ඇස්තමේන්තුවක් කා/සේ/වැසි.පද් I ගොනුවේ වාර්තා පත්‍ර VII න් අනුමැතිය ලබා, ගොනුවේ(105) න් තාක්ෂණික ඇගයිම් කමිටු වාර්තාවට අනුව 2012/03/23 හා 2012/09/14 දිනැති අංක 2012/04, 2012/09 ප්‍රසම්පාදන තීරණ මගින් ,ගිවිස ගෙන ඇති නිශ්චිත මිලට කාර්යය කිරිමට පවරා ඇත. |
| (ආ) | දික්වැල්ල ප්‍රදේශයේ රු.6,498,886 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් සහිත අත්පන්දු ක්‍රිඩා පිටියක් ඉදි කිරිම සදහා ප්‍රජා සමිති දෙකක් වෙත පවරා දි තිබුණු නමුත් එම සමිති සමග ඇති කර ගත් ගිවිසුම් විගණනය සදහා ඉදිරිපත් නොවිය. ව්‍යාපෘති වාර්තාව අනුව,දික්වැල්ල ප්‍රාදේශිය සභාව සමග ජාතික තරුණ සභාව අවබෝධතා ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණු අතර ප්‍රාදේශිය සභාවෙන් ලබාගත් කල වැඩ වාර්තා ජාතික තරුණ සේවා සභාවේ ඉදිකිරිම් අංශය මගින් පරික්ෂා කර අධික්ෂණ කමිටුවක් මගින් පරික්ෂා කර අධික්ෂණ කමිටුවක් විසින් අවශ්‍ය නිර්දේශ ලබා දිමෙන් අනතුරුව මුදල් නිදහස් කිරිම වෙනුවට සෘජුවම ප්‍රාදේශිය සභාවට මුදල් ගෙවා තිබුණි. මෙම කර්මාන්තය 2012 ජුනි මස අවසන් විය යුතු වුවත්, පලමු හා දෙවන අදියර හැරුණු කොට කිසිදු සංවර්ධන කටයුත්තක් 2013 මාර්තු වන විටත් ඉටු කර නොතිබුණි. | දික්වැල්ල වොලිබෝල් ක්‍රිඩා පිටිය ඉදිකිරිම සම්බන්ධයෙන් දික්වැල්ල ප්‍රාදේශිය සභාව සමග ඇතිකර ගන්නා ලද ගිවිසුමේ පිටපතක් විගණනය සදහා ඉදිරිපත් කල හැක. ගෙවිම් කිරිමේදි දික්වැල්ල ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරියා සමග පරික්ෂා කිරිමෙන් අනතුරුව නිරික්ෂණ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිර්දේශ අනුව ගෙවිම් සිදුකර ඇත. 2011 වරිෂය රු.මිලියන 1 ක්ද,2012 වර්ෂයේ රු.මිලියන 2 ක්ද, ව්‍යාපෘතියේ අදියර 01 හා 02 වෙනුවෙන් නිදහස් කර ඇති අතර ඉතිරි මුදල් අදාල අදියරවල ඉටුකල යුතු කාර්යයන් ඉටු නොකිරිම හේතුවෙන් ප්‍රතිපාදන නිදහස් කිරිම සිදුකර නැත. |
| (ඇ) | අනුරාධපුර දිස්ත්‍රික්කය තුල වොලිබෝල් ක්‍රිඩාපිටි ඉදි කිරිම | |
| | i. ක්‍රිඩා පිටි 16 ක් ඉදි කිරිමට නියමිතව තිබුණද,ක්‍රිඩා පිටි 07 ක් පමණක් ඉදිකර තිබුණි. | දැයට කිරුළ 2012 වැඩසටහනට සමගාමිව අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ක්‍රිඩා පිටි ඉදිකිරිමට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 16 ක නියමිතව තිබුණත් භූමිය හා ස්ථානය නිරවුල් කර ගැනිමට සිදුවු නිසා සියළුම ඉදිකිරිම් අවසන් කිරිමේ අපහසුතාවයට පත්විය. ඒ අනුව භූමිය හා ස්ථානය තෝරාගත් ස්ථාන 07 ක් පමනක් නිරවුල් වු නිසා එම ස්ථාන වල පමනක් ක්‍රිඩා පිටි සකස් කිරිමට කටයුතු කර ඇත. |
| | ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූල නොවිම. | |

| | | | |
|---|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේදයට යොමුව | | |
| | 3.9.1 | • සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත පවරා තිබුණත් කොන්ත්‍රාත් 16 න් ඉදිකිරීම් කල රු.9,363,508 ක් වූ කොන්ත්‍රාත්තු 07 ක්ම සමිතිය විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා දී තිබුණි.<br><br>• (ආ) අනුමත සමිතියක් ලෙස ගැනෙන සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත රු.21,402,304 ක් වූ කොන්ත්‍රාත් 16 ක් පැවරා තිබුණි. එමෙන්ම එම සමිතිය විසින් රු.5,350,576 ක් වූ කොන්ත්‍රාත්තු 04 ක් එක්වර එකම පුද්ගලයකු වෙත පවරා දී තිබුණි. | වොලිබෝල් ක්‍රීඩා පිටි සැකසීමේ ව්‍යාපෘතිය සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදීමේදී එම සමිතිය ලියාපදිංචි සමුපකාර සමිතියක් වන බැවින් හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ බලතල ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීමේ හැකියාව ඇති බැවින් එම බලතල ප්‍රකාරව හා සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමාගේ NCP/ACCD/03/55 හා 2012.01.12 දිනැති ලිපිය අනුව අදාල කොන්ත්‍රාත් 16 ප්‍රදානය කර ඇත.<br>ඉන් අනතුරුව සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය විසින් මෙම කොන්ත්‍රාත් එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් පරිදි උප කොන්ත්‍රාත්කරුවන් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් වලට අනුව අදාල කොන්ත්‍රාත්තු පිරිනමා ඇත.<br>මෙම කොන්ත්‍රාත් පිරිනැමීමට පෙර නිස්කෝ සමුපකාර සමිතියේ කමිටු නියෝජනයන් මගින් කොන්ත්‍රාත්කරුවන්ගේ සුදුසුකම් ලියාපදිංචියන් ,පලපුරුද්ද පිලිබදව සලකා බැලීම් සිදුකර ඇත.<br><br>වොලිබෝල් ක්‍රීඩා පිටි සැකසීමේ ව්‍යාපෘතිය සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදීමේදී එම සමිතිය ලියාපදිංචි සමුපකාර සමිතියක් වන බැවින් හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ බලතල ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීමේ හැකියාව ඇති බැවින් එම බලතල ප්‍රකාරව හා සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමාගේ NCP/ACCD/03/55 හා 2012.01.12 දිනැති ලිපිය අනුව අදාල කොන්ත්‍රාත් 16 ප්‍රදානය කර ඇත.<br>ඉන් අනතුරුව සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය විසින් මෙම කොන්ත්‍රාත් එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් පරිදි උප කොන්ත්‍රාත්කරුවන් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් වලට අනුව අදාල කොන්ත්‍රාත්තු පිරිනමා ඇත. |
| | 3.9.4 | මෙම කොන්ත්‍රාත් පැවරීමේදී ලංසු කැදවීමක් සිදුකර නොතිබුණු අතර අනුමත සමිතියකට | සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය විසින් මීට පෙර වර්ෂ වලත් කොන්ත්‍රාත් ලබාගෙන එම කොන්ත්‍රාත් වෙනත් |

| | | | |
|---|---|---|---|
| | | ලබාදිය හැකි උපරිම කොන්ත්‍රාත්තු වටිනාකම වූ රු.200,000 සීමාව ඉක්මවා රු.21,402,304 ක කොන්ත්‍රාත්තු 16 ක් සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත පවරා දී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදීම් සිදුකර ඇති හෙයින් ඒ අනුව මෙම කොන්ත්‍රාත් ලබාදීමේදිද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ වලට අනුව කොන්ත්‍රාත් පවරාදීම් සිදුකර ඇත.<br>උප කොන්ත්‍රාත් ලබාදීමේදී ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් 07 න් කොන්ත්‍රාත් 04 ක් යූ.බී.ජයවර්ධන යන අයට පවරා ඇත්තේ ඔහු විසින් සිදුකර ඇති කොන්ත්‍රාත් පිලිබදවද සලකා බැලීමෙන් අනතුරුවය. 2012 ජනවාරි මස කොන්ත්‍රාත් 02 ක්ද,2012 අප්‍රේල් මස කොන්ත්‍රාත් 02 ක්ද ලබාදීමට කටයුතු කර ඇත.<br>වොලිබෝල් ක්‍රීඩා පිටි සැකසීමේ ව්‍යාපෘතිය සීමාසහිත අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදීමේදී එම සමිතිය ලියාපදිංචි සමුපකාර සමිතියක් වන බැවින් හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ බලතල ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීමේ හැකියාව ඇති බැවින් එම බලතල ප්‍රකාරව හා සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්තුමාගේ NCP/ACCD/03/55 හා 2012.01.12 දිනැති ලිපිය අනුව කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සීමාවක්ද නොමැති බවද තහවුරු කර ඇති බැවින් අදාල කොන්ත්‍රාත් 16 ප්‍රදානය කර ඇත. |
| | iii. | එක් එක් ක්‍රීඩා පිටිය භෞතිකව පරික්ෂා කර ඒ අනුව වෙන වෙනම ඇස්තමේන්තු සකස් කිරීමක් සිදුකර නොතිබුණු අතර සියළු ඉදිකිරීම් සඳහා අදාල වන පරිදි පොදු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. මේ නිසා වැඩබිමේ ගස් මුල් ඉවත් කර ශුද්ධ කිරීම,මතුපිට පස් ඉවත් කිරීම යනාදි වැඩ වෙනුවෙන් රු.65,000 බැගින් ප්‍රතිපාදන කර එම මුදල් සියළු කොන්ත්‍රාත් සඳහා ගෙවා තිබුණි. නමුත් ඉදිකිරීමට යෝජිතව තිබුණු එම ක්‍රීඩා පිටි තුලම ඉදි කෙරෙන බැවින් එම වැය විෂය යටතේ කොන්ත්‍රාත්තු 07 ක් සඳහා රු.455,000 ක් ගෙවීම මතභේදයට තුඩුදෙන ගනුදෙනුවක් වී තිබුණි. | ජාතික තරුණ සේවා සභාවේ කාර්මික නිලධාරි(සිවිල්) ගේ නිරීක්ෂණ වාර්තාවන් වලට අනුව බිල්පත් ගෙවා ඇති අතර, ක්‍රීඩා පිටි සකස් කිරීම සඳහා තෝරා ගන්නා ලද ස්ථාන වල ක්‍රීඩා පිටි සැකසීම බහුතරයකම සිදුවූයේ අදාල පිටියේ කෙලවර සීමාවන් වලය. එවැනි අවස්ථා වලදී සාමාන්‍ය ලඳුකැල ඉවත් කිරීම හා පොලොව සම මට්ටමකට නොතිබූ අතර ගල් තට්ටු වලින්ද සමන්විත වූ අවස්ථා විය. ඒ අනුව පොලොව සම මට්ටමකට ගෙන ඒම සඳහා පස් ඉවත් කර සුදුසු පස් පුරවා පිටිය සකස් කිරීමට සිදුවූ නිසා මෙම මුදල් වැයකර ඇති අතර සමහර ස්ථානවල මෙම මුදලද ඉක්මවා වැය දැරීමට සිදුවූ අවස්ථාද ඇති බව නිරීක්ෂණය කර ඇත. |
| | iv. | පදවිය හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල ඉදිකල ක්‍රීඩා පිටිවල ආවරණ දැල සඳහා යෙදිය යුතු ජීඅයි පයිප්ප 34 ක් වෙනුවට 26 ක් පමනක් යොදා තිබීම නිසා ආවරණ දැල රදා පැවතීමේ ශක්තිය 24% කින් පමන අඩු වී ඇති බැවින් අනෙකුත් ක්‍රීඩා පිටි වලට සාපේක්ෂව මෙම ක්‍රීඩා පිටි දෙකෙහි ආවරණ දැල වෙනුවෙන් වැය කල රු.1,825,500 ක මුදලින් දිගුකාලින ඵලදායිතාවක් අපේක්ෂා කල නොහැකි විය. | කහටගස්දිගිලිය/ඉපලෝගම,පදවිය,කැබිතිගොල්ලෑව යන කොට්ඨාශ වල ක්‍රීඩා පිටි සැකසීමේදී ඒවා දිවා රාත්‍රි හා සාමාන්‍ය වොලිබෝල් ක්‍රීඩාපිටි වශයෙන් සැලැස්මවල් 02 ක් ඉදිරිපත් වූ අතර, දිවා රාත්‍රි වොලිබෝල් ක්‍රීඩාපිටි වලට අදාල සැලැස්ම අනුව ක්‍රීඩා පිටියට අවශ්‍ය කණු යොදා ඇති බවට කාර්මික නිලධාරි මහතා(සිවිල්)විසින් දෙන ලද වාර්තාව අනුව සහතික කරන ලද බිල්පත් මුල් ගෙවීම් වවුචර්පත් සමග අමුණා ඇත.විගණනය සඳහා ඒවා ඉදිරිපත් කිරීමේ හැකියාවද ඇත. |
| | v. | වොලිබෝල් ක්‍රීඩා පිටි 04 ක් ඉදි කිරීම වෙනුවෙන් කාර්මික නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව එකතුව රු.4,297,816 ක් ගෙවා තිබුණි. | ජාතික තරුණ සේවා සභාවේ උතුරුමැද පලාත් කාර්යාලය හා සී/ස අනුරාධපුර දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිතිය හරහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැයට කිරුළ 2012 වැඩසටහනට සමගාමීව ඉදි කරනු ලබන සාමාන්‍ය මට්ටමේ වොලිබෝල් ක්‍රීඩාපිටි ඉදි කිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 03 යටතේ |

<table>
<tr><td></td><td></td><td>සදහන් කර ඇති ක්‍රියා පිලිවෙල අනුව කටයුතු කර ඇත.<br>කහටගස්දිගිලිය,ඉපලෝගම ක්‍රිඩා පිටි සදහා කාර්මික නිලධාරි(සිවිල්) හා සහකාර අධ්‍යක්ෂ(ක්‍රිඩා සංවර්ධන) වොලිබෝල් උපදේශක අජන්ත මහතා යන අයගෙන් සැදුම්ලත් නිරික්ෂන කමිටු වාර්තාවක් අදාල මුල් ගෙවිම් වවුචර්පත සමග අමුණා ඇත. එම නිරික්ෂණ වාර්තාව පදනම් කරගෙන ගෙවිම් කර ඇත.<br><br>පදවිය හා කැබිතිගොල්ලෑව ක්‍රිඩා පිටි සදහා ගෙවිම් කර ඇත්තේද කාර්මික නිලධාරි(සිවිල්) ගේ නිරික්ෂණ වාර්තා පදනම් කරගෙනය. මෙම ක්‍රිඩා පිටි දෙක සදහාම ගෙවිම් කරන ලද මුල් ගෙවිම් වවුචර්පත් සමග අමුණා ඇත.</td></tr>
<tr><td>04.9</td><td>ප්‍රමාද වු ව්‍යාපෘති</td><td></td></tr>
<tr><td></td><td>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 උප ඡේදය අනුව, කොන්ත්‍රාත්තුවක් සදහා අවම වශයෙන් මිල ගණන් 05 ක් කැදවිය යුතු වුවත්,රු.මිලියන 6-42 අතර පරාසය තුල වු එකතුව රු.64,387,453 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත කොන්ත්‍රාත් 04 ක් සදහා මිල ගනන් 03 බැගින් ලැබි තිබුනු නමුත් නැවත මිල කැදවිමකින් තොරව අවම මිලට පවරා දි තිබුණි.2012 පෙබරවාරි පැවැත්විමට නියමිත දැයට කිරුල වැඩසටහන ආරම්භ කිරිමට පෙර මෙම ඉදිකිරිම් කෙටි කාලයකින් නිම කල යුතුව තිබිම ප්‍රසම්පාදන රෙගුලාසි අනුගමනය නොකිරිමට හේත් ලෙස සදහන්ව තිබුණද, දැයට කිරුළ වැඩසටහන අවසාන වි 2013 මාර්තු 31 ක කාලයක් ගතවි ඇතත් එම කිසිදු කොන්ත්‍රාත්තුවක වැඩ අවසන්ව නොතිබුණි.</td><td>4-1 එරම්ණියාය පුහුණු මධ්‍යස්ථානය නවිකරණය<br><br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 හා 3.8 ඡේද වලට අනුව එරම්ණියාය පුහුණු මධ්‍යස්ථානය නවිකරණය කොන්ත්‍රාත්තුව ප්‍රසිද්ධ පුවත්පත් දැන්විම් මගින්(පුවත්පත් 3 ක්) මිල ගණන් කැදවන ලද අතර කැදවිමේ දින 21 ක කාලයක් පැවතුණි. (ප්‍රසම්පාදන මණ්ඩල 2011/08/12 දිනැති 2011/08 තීරණය) එම කාලසීමාව තුලදි ටෙන්ඩර්කරුවන් 03 ක් පමණක් ටෙන්ඩර් ලබාගෙන ඇත. ප්‍රසිද්ධ පුවත්පත් දැන්විම්, ටෙන්ඩර් නිකුත් කිරිම හා විවෘත කිරිම ආදි තොරතුරු ගොනුවේ නිරික්ෂණයට ඇත.<br>4-2 අනුරාධපුර යොවුන් නිකේතනය නවීකරණය P1,P2,P3,P4 කොන්ත්‍රාත්තු<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 හා 3.8 ඡේද අනුගමනය කරමින් කාර්යය කඩිනමින් ඉටුකිරිමේ අවශ්‍යතාවය මත රුපියල් මිලියන 10 ක් නොඉක්මවන වැඩ සදහා සීමිත මිළ ගණන් කැදවිම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ යොමුව 3.9.1 ට අනුව ICTAD ආයතනයේ C6 ශ්‍රේණිය ලබා ඇති උතුරු මැද පලාත් සභාවේ ලියාපදිංචි අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පදිංචි කොන්ත්‍රාත් ආයතන වෙතින්, ජාතික තරුණ සේවා සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලය 2011/09/19 දින 2011/10 දරණ තීරණ මගින් අහඹු ලෙස තෝරාගත් අයාතන පහක් වෙතින් මිල ගණන් කැදවා ඇත.<br>මෙම කොන්ත්‍රාත් ආයතන විවිධ හේතු මත ගිවිසුම් ගත දින වලට කොන්ත්‍රාත්තුව අවසන් කර නොමැත. එහෙත් කොන්ත්‍රාත් ආයතන වැඩ බිම තුල වැඩ කරමින් පවති. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.13 ඡේදය හා ICTAD කොන්ත්‍රාත් කොන්දේසි 49 වන වගන්තියට අනුකූලව අදාල කොන්ත්‍රාත් ආයතන වෙතින් මේ දක්වා ගෙවා ඇති ගෙවිම් වලින් ප්‍රමාද ගාස්තු අයකරගෙන ඇත<br><table><tr><td></td><td>වැඩ</td><td>අයකරගත්</td></tr></table></td></tr>
</table>

| | වටිනාකම්න් සහතික කල දින දක්වා ප්‍රමාද වූ දින ගණන | ප්‍රමාද ගාස්තු රුපියල් |
|---|---|---|
| අනුරාධපුර P1 කොන්ත්‍රාත්තුව (ගොනුවේ අංක 96 II න් ) | 255 | 765,000.00 |
| අනුරාධපුර P2 කොන්ත්‍රාත්තුව 2013/01/07 දින දෙවන බිලෙහි (ගොනුවේ අංක 101 II න්) | 373 | 746,000.00 |
| අනුරාධපුර P3 කොන්ත්‍රාත්තුව 2013/02/26 දින දක්වා බිලෙහි (ගොනුවේ අංක 113 II න්) | 423 | 846,000.00 |
| අනුරාධපුර P4 කොන්ත්‍රාත්තුව 2012/07/06 දින තුන්වන බිලෙහි (ගොනුවේ අංක 67 III න්) | | |
| මුළු මුදල | | 2,822,000.00 |

| | | |
|---|---|---|
| 04.10 | වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සභාවේ සම්පත් | |
| | පුහුණු මධ්‍යස්ථාන ලෙස පවත්වා ගෙන ගිය සභාව සතු වූ හා සභාව විසින් භුක්තිවිදි එකතුව අක්කර 68 රූඩ් 02 පර්චස් 10 ක් වූ ඉඩම් ඒකක 14 ක් වෙනත් පාර්ශවයන්ට පැවරිමට සභාව පියවර ගෙන තිබුණි. කෙසේ නමුත් එම දේපල වල ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන කටයුතු සඳහා පමනක් රු.56,345,248 ක් සභාව විසින් වැය කර තිබුණි. | සභාව විසින් පරිහරණය කරන ලද රජයේ ඉඩම් හා ගොඩනැගිලි යොවුන් සේනාංකයේ කටයුතු සඳහා තාවකාලික පදනම මත යෞවන කටයුතු අමාත්‍යංශයේ ලේකම්තුමාගේ මැදිහත් විම මත ලබා ගන්නා ලදි.<br><br>එසේ ලබා ගන්නා ලද දේපල වලින් බටංගල,එරමිණියාය, හෙයියන්තුඩුව යන පුහුණු මධ්‍යස්ථාන මේ වන විට සභාව වෙත නිදහස් කර ඇත. හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ අක්කර 11 කුත් පර්චස් 01 ක ප්‍රමාණයක් රාජ්‍ය |

| | | |
|---|---|---|
| | | ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර, තරුණ සේවා පනතේ 5(1) වගන්තියට අනුකූලව එහි කටයුතු සිදු කර ඇත.<br>හදිසි නීති රෙගුලාසි යටතේ මෙම සභාවට හරදී තිබූ පිලියන්ද මාදන්ගහවත්ත හෙවත් බෝගහ වත්ත ඉඩමේ තිබූ ගොඩනැගිල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් සභාවේ එකගතාවය ලබාගෙන අළුත්වැඩියා කර පවුල් සෞඛ්‍ය සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි.<br><br>පානදුර දෙල්ගහවත්ත නැමැති ඉඩමේද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අතර, ඒ සඳහා සභාවේ කිසිදු එකගතාවයක් ලබාගෙන නොමැති අතර, ඉදිරි විමර්ෂණ කටයුතු මේ සම්බන්ධව සිදු කෙරෙමින් පවති. |
| 04.11 | කාර්ය මණ්ඩල පරිපාලනය | |
| (අ) | අංක ඩීඑම්එස්/ඊ3/36/4/224/1-1 හා 2011 මැයි 19 දිනැති ලිපිය මගින් කලමණාකරන සේවා දෙපාර්තමේන්ත්වේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණි.<br>අනාවරණය වූ කරුණු පහත පරිදිය. | |
| | i. ඉහත ලිපියෙහි 05 ඡේදය මගින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අතිරේක තනතුරු ඇති නොකල යුතු වුවද, ක්‍රියාකාරි අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ(මෙහෙයුම්) යනුවෙන් නව තනතුර දෙකකක් වෙනුවෙන් ගෙවා තිබුණි. | ජාතික තරුණ සේවා සභාවේ කළමණාකරන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරිම යටතේ වැඩසටහන් කාර්යක්ෂම කිරිම යන ශිර්ෂයින් යුතුව 2012.02.21 වන දින සභා අධ්‍යක්ෂක මණ්ඩල තිරණ අංක 17/2012 හි අනුමැතිය යටතේ මෙහෙයුම් අධ්‍යක්ෂවරයා ලෙස ස්වෙච්ජා පදනමින් අජිත් නාරගල මහතා වෙත රාජකාරි පැවරිම සිදු කරන ලදි.යෞවන අවශ්‍යතා වලට ආමන්ත්‍රනය කිරිම ඉලක්ක කර ගනිමින් බිහිවූ ජාතික තරුණ සේවා සභාව 21 වන ශත වර්ෂයේ දෙවන දශකයේ ජිවත් වන යෞවනයන්ගේ අවශ්‍යතාවයන් ආයතනික ව්‍යුහයන්ට ගැලපෙන පරිදි නවීකරණය කිරිමේදි ජාතික මට්ටමින් අනන්‍යතාවයක් ගොඩ නගා ගෙන ඇති ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ජාත්‍යන්තර තලයට ගෙන යාමට කටයුතු කරමින් විශ්වීය යෞවනයන් (global youth) බවට පත් කර ලිමට සූදානම්ව යන ගමන්මගේ පුළුල් සමාජ වපසරිය තුල ජාතික මට්ටමේ ආයතනයක් වශයෙන් ආයතන ව්‍යුහය නිර්මාණය කර ගැනිමෙ අත්‍යවශ්‍ය වි ඇත. ඒ අනුව පුළුල්වන ප්‍රතිසංවිධානය ජාලය තුල තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරලිම උදෙසා ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට සහය විම පිණිස,ජාතික තරුණ සේවා සභාවේ ආයතනික හා පරිපාලන කාර්යන් මෙහෙයවිමටත් විවිධාකාර වූ ජාතික සහ පළාත්/දිස්ත්‍රික් වැඩසටහන් මෙහෙයවිමටත් ,අධික්ෂණය කිරිමටත් ජාතික |

| | | |
|---|---|---|
| | | තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරින් මෙහෙයුම් අධ්‍යක්ෂවරයෙක් පත්කිරීමටත් ඒ සඳහා නිශ්චිත සුදුසුකම් පලපුරුද්දක් සහිත නිලධාරියකු පත්කර ගැනීමේ යෝජනාව මත ප්‍රාසාංගික කලා විශේෂවේදී උපාධිධරයෙක් හා අවස්ථා(EVENT MANAGEMENT) කළමණාකරනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී අජිත් නාරගල මහතා විවිධ ආයතනයන්හි වැඩසටහන්/විශේෂ අවස්ථා කළමණාකරනය කිරීමෙන් ලද පරිචයත් ජාත්‍යන්තර හා ජාතික තලයේ තරුණ සංවර්ධන කටයුතු වල නියාමක ප්‍රතිපත්ති සම්පාදකයකු ලෙස ලද නිපුණත්වයත් ජ්‍යේෂ්ඨ කළමණාකරුවකුගේ දැක්ම සහිත නිලධාරියකු වීම හේතුකොට ගෙන වර්තමාන හා අනාගත වගකීම් භාරය මනාව සමාජගත කිරීමටත් පරිපාලන ප්‍රතිපත්තිමය තීරණ වලදී සහ වැඩසටහන් සම්පාදනය කිරීමේදී , මෙහෙයවීමේදී ,අධීක්ෂණය කිරීමේදී, සභාපති/අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ දැක්ම, චින්තනය සහ විධානය යටතේ කටයුතු කිරීම යන අරමුණු ඇතිව මෙහෙයුම් අධ්‍යක්ෂවරයෙකු ලෙස ස්වෙච්ඡා පදනම මත පත්කර ගන්නා ලදී.<br><br>ජාතික තරුණ සේවා සභාවේ කළමණාකරන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2012.01.19 වන දින සභා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 05/2012 හි අනුමැතිය යටතේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයකු වශයෙන් සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස විරාජ් මිලින්ද රාජපක්ෂ මහතා පත් කිරීම සිදු කර ඇත. වර්තමාන ශ්‍රී ලාංකේය තාරුණ්‍ය ජාතික හා ජාත්‍යන්තර තලයේ ප්‍රමුඛතම යෞවන පිරිසක් බවට පත් කිරීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් ස්වකීය සංවිධාන ජාලය පුළුල් කිරීමේ අවශ්‍යතාවය තුල සහ මහින්ද චින්තන ඉදිරි දැක්මේ අභිමතාර්ථයන් යථාර්ථවත් කිරීමේ වගකීම ඉටු කිරීමෙහිලා ජාති, ආගම්, කුල ,පන්ති, පක්ෂ, පාට හෝ භූගෝලීය විෂමතාවයන් සැලකීමකින් තොරව තාරුණ්‍යයේ පැහැය සමගින් තරුණ ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් ශ්‍රී ලංකා යූත් සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා පාර්ශවකරුවකු ලෙස ඕනෑම ආයතනයකට ක්‍රියාකිරීමේ ඉඩප්‍රස්ථාව සැලසී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික තරුණ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් පැවරී ඇති ජාතික තරුණ සේවා සභාව ජාත්‍යන්තරයේ ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ අභිමානය ස්ථාපිත කිරීමටද කටයුතු සම්පාදනය කරමින් ඇති අතර, මෙහිලා 2014 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ ජගත් තරුණ සම්මේලනය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත බැවින් මෙය ප්‍රමුඛ කාර්යක් ලෙස පිලිගෙන රජය විසින් 2013 වර්ෂයේ අයවැයෙන් මේ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට යෝජනා වීමත්, මේ සඳහා ක්‍රියාකාරී වැඩසටහන් නිර්මාණය කිරීමට සිදු වී ඇති හෙයින් මෙම කාර්යන්හි වගකීම විමධ්‍යගත කිරීමේ අරමුණ ඇතිව මේ සඳහා මාපියභාවය පිලිබඳ ජාත්‍යන්තර සංවිධානයේ දකුණ ආසියානු කලාපීය සම්බන්ධීකාරක |

| | | |
|---|---|---|
| | | වශයෙන් කටයුතු කරනු ලබන විරාජ් මිලින්ද රාජපක්ෂ මහතා පත්කර ගැනිමටත් සමාජ විද්‍යාව පිලිබද ශාස්ත්‍රපති උපාධියක් සහ කළමණාකරන හා මුල්‍ය පිලිබද මුලික උපාධියත්,මුලික උපාධියෙන් පසු ඇමෙරිකාවේ මියාමි විශ්ව විද්‍යාලයේ සංවර්ධන සන්නිවේදනය පිලිබද පශ්චාත් උපාධියත් හිමිකර ගෙන ඇති මොහු ජාත්‍යන්තර සංවිධානයන් සහ එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන්හි ආසියා ශාන්තිකර කලාපීය කාර්යාලයේ මානව සංවර්ධන අංශයේ උපදේශක වරයෙක් ලෙස කටයුතු කිරිමෙන් ලද පරිචයත් ජාත්‍යන්තර තලයේ .තරුණ සංවර්ධන කටයුතු වල නියාමක ප්‍රතිපත්ති සම්පාදකයෙකු වශයෙන් ලද කාර්ය නිපුණත්වයත් ,විශිෂ්ඨ ජේෂ්ඨ කළමණාකරුවකුගේ දැක්මක් සහිත නිලධාරියකු ලෙස ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි සදහා පත් කිරිම් කර ඇත.<br><br>ඒ අනුව විමසුමේ සදහන් ආකාරයට 2012 වර්ෂය තුලදි ඉන්ධන හා දිමනා වෙනුවෙන් වැයදැරිම් සිදුකර ඇත්තේ ශ්‍රි ලංකා යුත් සංකල්පය සාක්ෂාත් කර ගැනිම සදහා තාරුණ්‍ය ජාත්‍යන්තර තලයට ගෙන යමින් විශ්විය යෞවනයන් බවට පත්කර ලිම සදහා යන ගමන තුල පුළුල් වු ප්‍රතිසංවිධාන ජාලය තුල ජාතික තරුණ සේවා සභාවේ කාර්යභාරය පුළුල් ලෙස ප්‍රතිසංවිධානය විමත් එය පළාත්,දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් විශාල ලෙස සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති හා තරුණ ක්‍රියාකාරකම් අධික්ෂණය කිරිමට ඇති හෙයින් ඒ සදහා ප්‍රවාහන පහසුකම් යෙදවිම අවශ්‍ය හෙයිනි. |
| | ii. අධ්‍යක්ෂ(මෙහෙයුම්) තනතුර සදහා බදවා ගත් නිලධාරි වෙනුවෙන් පෞද්ගලික ලිපි ගොනුවක් සභාව සතුව නොමැති ව අංක ඊටි/1/122/2012 හා 2012 දෙසැම්බර් 20 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ(පාලන) විසින් විගනනය වෙත දන්වා තිබුණි. එමෙන්ම එම නිලධාරි වෙත පත්විම් ලිපියක් නිකුත් කල බවට කිසිදු සාක්ෂියක්ද විගණනය වෙත ඉදිරිපත් නොවිය. | මෙම නිලධාරින් බදවා ගැනිමට අදාලව පුද්ගලික ලිපි ගොනු විගණනය සදහා ඉදිරිපත් කර ඇත. |
| (ආ) | 2011 සිට 2014 දක්වා සභාවේ ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශයට කාර්ය පැවරුම් පදනම මත උපදේශකයකු පත් කර 2011 ජුලි සිට 2012 මාර්තු දක්වා දිමනා ලෙස රු.270,000 ක්ද, විදේශ ගමන් වෙනුවෙන් රු.1,847,981 ක්ද ලෙස එකතුව රු.2,117,981 ක් ගෙවා තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණය විය. | |
| | i. ආයතන සංග්‍රහයේ vi වැනි පරිච්ඡේදයේ 2.10 උප වගන්තියට පටහැනිව පත්විම සම්බන්ධ කිසිදු තොරතුරක් විගණකාධිපති | සංඛ චන්දන අබේවර්ධන මහතා ජාතික තරුණ සේවා සභාවේ ස්ථිර,අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත බදවා ගෙන නොමැති අතර, 2014 පැවැත්වෙන |

| | | |
|---|---|---|
| | වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ලෝක තරුණ සමුළුවේ කටයුතු ඉටුකිරිම වෙනුවෙන් කාර්ය පැවරුම් පදනම මත උපරිමය රු.30,000/-කට නොවැඩි දීමනාවකට යටත්ව සේවයේ යොදවා ගෙන ඇත. |
| | ii. අංක 28 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමණාකරන සේවා චක්‍රලේඛයට පටහැනිව රේඛීය අමාත්‍යංශ ලේකම්වරයාගේ නිර්දේශය, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය හා මුල්‍ය ප්‍රතිපාදන පවතින බවට ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තහවුරු කිරිමක් රහිතව මෙම බඳවා ගැනිම් සිදුකර තිබුණි. | 2014 ලෝක තරුණ සම්මේලනය වෙනුවෙන් කටයුතු ඉටු කිරිමේ අවස්ථානුකූලව විශේෂ දක්ෂතා ඇති හා හැකියාව ඇති තරුණයින් කැඳවා කටයුතු සිදුවන බැවින් විශේෂ දීමනා ලෙස අදාල ව්‍යාපෘති වාර්තාවේ මුදල් වෙන්කර ඇති අතර, එම මුදලින් මෙම දිමනාව ගෙවනු ලැබේ.<br>කාර්ය පැවරුම් පාදනම මත කටයුතු කිරිමේදි ආයතනයේ අවශ්‍යතාවය මත සේවා ලබා ගැනිමට අනවශ්‍ය විටක සේවය ලබා නොගැනිම කරන හෙයින් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යවා නොමැත. |
| | iii. අංක 449 හා 2011 පෙබරවාරි 24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේකය පරිදි නියමිත කාල පරිච්ඡේදයක් සඳහා නිශ්චිත කාර්ය පැවරුමක් ලබා දි නොතිබුණු අතර අදාල කාලය තුල ඉටු කල කාර්යභාරය පැහැදිලිව හඳුනා ගැනිමට අපහසු විය. තවද කාර්ය පැවරුම් පදනම මත ලබාදෙන පත්විම් දින 45 ක් නොඉක්මවන්නාවූ කෙටි කාලින පදනම මත ලබා ගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් විය යුතු වුවත් ,2011 සිට 2014 දක්වා වර්ෂ 04 ක කාල සීමාවකට මෙම පත්විම ලබාදි තිබුණි. එමෙන්ම මෙම උපදේශකවරයාට කල ගෙවිම් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොතිබුණි. | කාර්ය පැවරුම් පදනම මත 2014 පැවැත්වෙන ලෝක තරුණ සම්මේලනය සහ අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම එම සබඳතා ශක්තිමත් කිරිම සඳහා වු කාර්යභාරය ඉටු කිරිම වෙනුවෙන් රු.30,000/- ක උපරිමයකට යටත්ව මසකට රු.30,000/- කඋපරිමයකට යටත්ව මෙම බඳවා ගැනිම සිදුකර ඇත. |
| (ඈ) | සභාව සතුව පළාත් කාර්යාල 06 ක සහකාර ගණකාධිකාරි තනතුර පුරප්පාඩුව පැවතිණි. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/ඊ3/36/4/229/1 හා 2011 ජනවාරි 17 දිනැති ලිපිය මගින් සහකාර ගණකාධිකාරි තනතුර අහෝසි කර ඒ වෙනුවට ගිණුම් නිලධාරි තනතුරක් ඇති කර තිබුණු නමුත් එම තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව දෙදෙනෙකු විය. කෙසේ නමුත් 2012 වර්ෂයේ වියදම් දැරිම සඳහා සභාව විසින් පළාත් කාර්යාල වෙත රු.මිලියන 439 ක් මුදා හැර තිබුණු අතර පළාත් කාර්යාල වෙන් වෙන්ව ගත් විට එය රු.මිලියන 29-99 අතර පරාසයක විය. ඒ අනුව පළාත් කාර්යාලයක වාර්ෂික සාමාන්‍ය ගනුදෙනු වටිනාකම රු.මිලියන 49 ක් පමන වන බැවින් ඒ කාර්යාල සඳහා ගණකාධිකාරිවරයකුගේ අවශ්‍යතාවයක් පවතින බව විගණනයේදි බැහැර කල නොහැකි විය. | අනුමත කරන ලද බඳවා ගැනිමේ පරිපාටිය අනුව සහකාර ගණකාධිකාරි තනතුර අහෝසි කර ඇතත්, ආයතනයේ මානව සම්පත් අවශ්‍යතා පිලිබඳව විශ්ලේෂණයක් මේ වන විට සකස් කරමින් පවතින බවත් ඒ අනුව සේවා අවශ්‍යතාවයන් පදනම් කරගෙන නැවත මෙම තනතුරු අනුමත කර ගැනිම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවති. එබැවින් මේ සම්බන්ධව වැටුප් කොමිසම හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි. |
| (ඇ) | ජාතික තරුණ සේවා සභාව සඳහා අනුමත කල බඳවා ගැනිමේ පටිපාටිය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | අදාල විමසුම යොමු කරන අවස්ථාව වන විට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනිමේ පරිපාටියේ පිටපතක් අප ආයතනය වෙත ලැබි නොතිබුණු බවත්, අනුමත කරන ලද |

<table>
<tr><td></td><td></td><td>පරිපාටිය 2013 ජනවාරි මාසයේ ලැබුණු බවත් මේ වන විට එහි පිටපතක් විගණනයට ඉදිරිපත් කර ඇත</td></tr>
<tr><td>05.</td><td>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</td><td></td></tr>
<tr><td>05.1</td><td>සංයුක්ත සැලැසුම</td><td></td></tr>
<tr><td></td><td>2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.12 උප ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2010-2014 කාල සීමාවට සකස් කල සංයුක්ත සැලසුමෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන්හි මුල්‍යාමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයිමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.</td><td>වැඩසටහන් වල ස්වභාවය නිරන්තරව වෙනස්වන හෙයින් මුල්‍ය අගයන් ඇතුලත් නොකරන ලදි. ඉදිරි වැඩසටහන් සදහා සකස් කරනු ලබන සංශෝධිතයන්හිදි උපරිම වශයෙන් මෙම මුල්‍ය අගයන් ඇතුලත් කිරිමට සැලසුම් කර ඇත.</td></tr>
<tr><td>05.2</td><td>ප්‍රසම්පාදන සැලැසුම</td><td></td></tr>
<tr><td></td><td>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2(ඇ) ඡේදය පරිදි ප්‍රවර්තන වර්ෂය තුල දි මිලදි ගැනිමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැසුමක් සකස් කර අනුමත කර ගෙන නොතිබුණි.</td><td>ප්‍රවර්තන වර්ෂයට අදාලව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම දින 2013.01.02 වන දින අනුමත කරන ලද අතර එය අමාත්‍යංශය වෙතද යොමු කර ඇති අතර, එම සැලැස්මේ පිටපතක් මේ සමග ඇමුණුම් අංක 03 වශයෙන් ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td>05.3</td><td>අධක්ෂ මණ්ඩල රැස්වීම්</td><td></td></tr>
<tr><td>(අ)</td><td>එක් අධ්‍යක්ෂවරයකු 2011 හා 2012 වර්ෂවල කිසිදු සභා රැස්වීමකට සහභාගි වි නොතිබුණු අතර 2012 සභා රැස්වීම් සඳහා අධ්‍යක්ෂකවරුන් 04 දෙනෙකුගේ සහභාගිත්වය දුර්වල තත්වයක පැවතිණි.</td><td>අදාල විමසුම මගින් පෙන්වා දි ඇති සභා අධ්‍යක්ෂවරු 04 දෙනා 2013 වර්ෂයේ ජනවාරි,පෙබරවාරි සහ මාර්තු මාසවල සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි විම පහත පරිදි වේ.
<table>
<tr><td>අනු අංක</td><td>සභා අධ්‍යක්ෂ මහත්ම මහත්මින්ගේ නම/</td><td colspan="3">වර්ෂයේ සභා 2013 රැස්විම් පැවැත්වූ දිනයන් හා පැමිණිම</td></tr>
<tr><td></td><td></td><td>01.21</td><td>02.22</td><td>03.19</td></tr>
<tr><td>01</td><td>හේමන්ත වන්නි ආරච්චි මහතා</td><td>A</td><td>A</td><td>A</td></tr>
<tr><td>02</td><td>ගුණරත්න රාජපක්ෂ මහතා</td><td>P</td><td>A</td><td>P</td></tr>
<tr><td>03</td><td>එම්ඉසෙඩ් එම් උවයිස් . මහතා</td><td>P</td><td>A</td><td>P</td></tr>
<tr><td>04</td><td>දූෂ්‍යන්ත විදුසක මහබදුගේ මහතා</td><td>A</td><td>P</td><td>A</td></tr>
</table>
සභා අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන සාමාජිකයින් වෙනත් වෘත්තින්හි නියැලෙන කාර්ය බහුල අය බැව් සඳහන් කරමි. ඔවුන්ගේ එම කාර්ය</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | බහුලත්වය මැද අප විසින් සංවිධානය කරනුලබන තරුණ සංවර්ධන වැඩසටහන් හා උත්සව සදහා අනිවාර්යෙන් සහභාගී වන අතර, ශ්‍රී ලංකා යුත් පාර්ලිමේන්තුව ශ්‍රී ලංකා යුත් සම්මාන උළෙල ජාතික යෞවන ක්‍රීඩා උළෙල, සිහිනය රියැලිටි වැඩසටහන ,Eyla,Top 20, ජාතික යෞවන අළුත් අවුරුදු උත්සවය,ශ්‍රී ලංකා යුත් පාපැදි සවාරිය,දැයට කිරුළ,පුජීමාරු වැඩසටහන,සාම පාගමන,කෙටි නාට්‍ය උළෙල වැනි විශේෂ වැඩසටහන් සදහා සුවිශේෂී දායකත්වයක් ලබා දෙමින් මෙම සභා සාමාජිකයින් ජාතික තරුණ සේවා සභාව සදහා මහගු සේවයක් ඉටු කරමින් සිටි.<br>ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(සංවර්ධන), හේමන්ත වන්නිආරච්චි මහතා නිල පත්විමක් වන අතර ඔහු වෙනුවට එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන)<br><br>ඩබ්.යූ.බී.ප්‍රේමචන්ද්‍ර මහතා පත් කර ඇති බව වැඩිදුරටත් සදහන් කර සිටිමි.එමෙන්ම ආචාර්ය නවරත්න රඹුක්වැල්ල මහතා විදේශගතව ඇති බැවින් 2010.11.30 සිට පැවැත්වූ සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි. |
| 05.4 | අයවැය ලේඛණමය පාලනය | |
| | අරමුදල් සැපයෙන ප්‍රභවයන් සියල්ල ඒකාබද්ධ කර සමස්ත අයවැය ලේඛණයක් සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කර නොතිබුණි. පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ සලසා තිබුණු රු.91,800,000 ක ප්‍රතිපාදන වලින් 28% ක් හෙවත් රු.25,584,198 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ආයතන සැපයීම් හා පවාහන වියදම් සදහා සලසා තිබුණු පතිපාදන ඉක්මවා රු.33,178,869 ක් වැයකර තිබුණු බැවින් සඵල කළමණාකරන පාලන කමයක් ලෙස අයවැය ලේඛනය යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2012 වර්ෂයේ ප්‍රභවයන් සියල්ලෙන්ම ලැබෙන සමස්ථ අරමුදල වූ රු.මිලියන 1437 ක් සදහා ක්‍රියාත්මක අයවැය ලේඛණය පිළියෙල කර 2012.02.09 වන දිනැති සභා රැස්වීමේදී සභා තිරණ අංක 05 මගින් සහා සංදේශ අංක 07/2012 යටතේ අනුමත කර ක්‍රියාත්මක කර ඇත. විගණන විමසුම මගින් පෙන්වා දෙනු ලැබ ඇත්තේ සියළුම වැය විෂය අංක සහිත අයවැය ලේඛණය විය යුතු බවට අදහස් කරන බැවින් පහත විස්තර ඊට අදාලව ඉදිරිපත් කර ඇත.<br><br><u>2012 සමස්ථ අයවැය -රුපියල් මිලියන</u><br><br><u>අය</u><br>භාණ්ඩාගාරයෙන් -පුනරාවර්ථන 572<br>ප්‍රාග්ධන 225<br>අභ්‍යන්තර ආදයමින් 140<br>රේඛීය අමාත්‍යාංශය 500<br><u>1437</u><br><br><u>වැය</u><br>පුද්ගල පඩි නඩි 499<br>වෙනත් පුනරාවර්ථ 106<br>ප්‍රාග්ධන වියදම් 240<br>ඍජු තරුණ සංවර්ධන 592<br><u>1437</u> |

මෙම වියදම් වලින් සෘජු තරුණ සංවර්ධන වැය රු.මිලියන 592 සඳහා ව්‍යාපෘති ඇස්තමේන්තුව පළමුව ඉදිරිපත් කර ඇති අතර වැය විෂය අනුව වූ ඇස්තමේන්තුව ඉන් පසු ලබා ගන් ලැබේ.
අනෙකුත් වැය සඳහා ආරම්භයේදිම වැය විෂය අනුව වූ ඇස්තමේන්තු ආරම්භයේදිම සකස් කරනු ලැබේ. ඒ අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන, අමාත්‍යංශ රාජ්‍ය ආයතන ලැබීම් හා අභ්‍යන්තර ඉපයීම් සඳහාඒකාබද්ධ අයවැය ලේඛණ පිලියෙල කර ඇති අතර එය ඉහත පරිදි නිවැරදිව අයවැය පාලන කාරකයක් ලෙස සකසා ක්‍රියාත්මක කර ඇත.
සියළුම සැලසුම් වාර්තා මගින් ඉදිරිපත් කිරිමට සිදුකර ඇත. (ඇමුණුම් අංක 05 යටතේ දක්වා ඇත.)
තරුණ සංවර්ධන අරමුදල් (අභ්‍යන්තර ආදායම්) ප්‍රතිපාදන ඉතිරිය හා අතිරික්ත වැයවීම පිළිබඳ විග්‍රහය රුපියල් මිලියන වලින් පහත දැක්වේ.

| විස්තරය | සටහන් | ඇස්තමේන්තුව | වියදම | ඉතිරිය |
|---|---|---|---|---|
| සෘජු තරුණ සංවර්ධන වැය | 1 | 92 | 66 | 26 |
| ආයතනික වැය | 2 | 605 | 630 | (25) |

අභ්‍යන්තර ආදායමෙන් ආයතනික අභ්‍යන්තර වැය සඳහා සැලසුම් කර තිබූ අවශ්‍යතාවය රු.මි 33 ක මුදල මිලියන 45 ක් දක්වා වැඩි කිරිමට කළමණාකරන චක්‍රලේඛ අංක 46 ට අනුව සිදු විය.
භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු බැවින් එම අතිරේක අවශ්‍යතා පිරිමැසුම් වැය පාලන ක්‍රමවේදයන් උපයෝගි කරමින් ඉහත පරිදි වැය දැරිමට පියවර ගන්නා ලදි.
මෙහිදි සෘජු තරුණ සංවර්ධන වැය උපරිමව තරුණ සංවර්ධන කාර්යයන් අඩු නොවන පරිදි බාහිර ආයතන ලැබීම් ව්‍යාපෘති වැය වශයෙන් සැලසුම් කර පවත්වාගෙන යාමට හැකිවන පරිදි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලදි.
(ඇමුණුම 06 සංශෝධිත අවශ්‍යතාවය පෙන්වන ඇස්තමේන්තුව)

ඉහත පෙන්නුම් කිරීම් වලට අනුව අය වැය ඇස්තමේන්තුව ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගත් බව සඳහන් කළ හැක.

| | | |
|---|---|---|
| | | |
| 06. | පද්ධතිය හා පාලන | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන කේෂ්ත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයට යොමු කල යුතු වේ.<br><br>(අ) පසම්පාදනය<br>(ආ)අයවැය පාලනය<br>(ඇ)ගිණුම්කරණය<br>(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | පද්ධති පාලන කේෂ්ත්‍ර සම්බන්ධව පෙන්වාදී ඇති අඩුපාඩු නිරවුල් කිරිමට හා අවම කිරිම සඳහා වූ පියවර ගෙන ඇත. |